ධම්ම පදය

ධම්මපදය

සිංහල අර්ථය සහිත

ධර්ම දානයකි

යූ. එච්. විජේතුංග

ධම්ම පදය

සිංහල අර්ථය සහිත

මෙහි දේශිත ධර්මය ගෞතම බුදුන් වහන්සේ සතු වන්නේය.

ISBN 978-624-93176-2-8

Published by S. D. Wijetunga
Aaryasathya.com
Copyright © 2024 by Aaryasathya
All rights reserved. No part of this publication may be reproduced, stored or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording, scanning, or otherwise without written permission from the publisher. It is illegal to copy this book, post it to a website or distribute it by any other means without permission.

2024 දිය.

Dhamma Padaya © 2024 by Aaryasathya is licensed under CC BY-NC-ND 4.0.
To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-nc-nd/4.0/
(http://creativecommons.org/licenses/by-nc-nd/4.0/)
To view a copy of this license, visit
or send a letter to Creative Commons, PO Box 1866, Mountain View, CA 94042, USA.

මෙම ධර්ම ග්‍රන්ථය සම්පූර්ණයෙන්ම නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි.
අන්තර්ගත කරුණු උපුටා ගනිමින්, ඡායා පිටපත් කර ගනිමින්, අන්තර් ජාලයට එක්කරමින්
සහ නැවත මුද්‍රණය කරමින් මුදලට බෙදාහැරීම සම්පූර්ණයෙන්ම නොකල යුතුය.
කරුණාකර, අදහස් හා යෝජනා මෙම aaryasathyadhamma@gmail.com විද්‍යුත් ලිපිනයට ලියා දන්වන්න.

ධර්ම දානයකි -
බුදුන්ගේ ධර්මය අලෙවි කිරීම ආනන්තර්ය කර්මයට පමණක් දෙවෙනි වන
අකුසලයක් බව සලකා මෙහි අඩංගු කිසිවක්
මුදල් හෝ ලාභ ලැබීමේ අරමුණින් කටයුතු වල නොයෙදීමට වගබලාගන්න.

ධර්ම දානයක් වශයෙන් මුද්‍රණය කරවා බෙදා දීමට කැමති පින්වතුන්ට පහත පෝරමයේ දායකයාගේ නම සහ නිමිත්ත පුරවා ඒ උතුම් ධර්ම දානය පිරිනැමිය හැකිය. විද්‍යුත් මුද්‍රණය ධර්ම දානයක් ලෙස බෙදාදීමට අවශ්‍ය කෙනෙක් ඉහත විද්‍යුත් ලිපිනයට අපවෙත ලියා පහත පෝරමය අප වෙතින් නොමිලේ පුරවා ගෙන ඒ වටිනා ධර්ම දානය සිදුකරගන්න.

දායක නම:

නිමිත්ත:

මා හට ධර්මය සහ පාලි අත් පොත් තැබූ ජයසුමනාරාමය දහම් පාසලේ එවකට ප්‍රධානාචාර්ය
මාතර කොටුවේගොඩ ජයසුමන විහාරයේ විහාරාධිපතිව වැඩ විසූ
මගේ දහම් දැනුමේ සහ පාලි භාෂාවේ මුල් ගුරුදේවයන් වූ
පූජ්‍ය තාරාපේරියේ සෝමාලෝක නායක හිමිපාණන් වහන්සේ

මා දහම් පාසල් ගුරුවරයෙකු වශයෙන් සේවය කරන කාලය තුල
ප්‍රධානාචාර්ය මාතර කොටුවේගොඩ ජයසුමනාරාමය විහාරාධිපති ශාස්ත්‍රපති,
පූජ්‍ය යටිගල සෝමතිලක ස්ථවිරයන් වහන්සේ
එම විහාරස්ථානයේ වැඩවසන ගෞරවණීය මහා සංඝරත්නය

මා විසින් බුදුන් වහන්සේ ලෙස අප්‍රමාණ ගෞරවයෙන් පුදදෙනු ලබන
"**අති පූජණීය පිරිත් පොත් වහන්සේ**" ධර්ම පුස්තකය නිල වශයෙන් මුද්‍රණය කළ පසු
පළමු පොත බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට පූජා කරගැනීමට අපහට පිහිට වූ
කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී
පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජී ස්වාමීන් වහන්සේ
එම විහාරස්ථානයේ වැඩවසන ගෞරවණීය මහා සංඝරත්නය

මා විසින් බුදුන්-දහම්-සඟුන් ලෙස අප්‍රමාණ ගෞරවයෙන් පුදදෙනු ලබන
"**අති පූජණීය පිරිත් පොත් වහන්සේ**", "**සතිපට්ඨාන සූත්‍රය**", "**ධම්ම පදය**" යන ග්‍රන්ථත්‍රය
නිල වශයෙන් මුද්‍රණය කළ පසු පළමු ග්‍රන්ථත්‍රය බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට
පූජා කරගැනීමට අපහට පිහිට වූ
පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථානයේ විහාරාධිපති
ශ්‍රී දේවානන්ද වංශාලංකාර, සද්ධර්ම කීර්ති ශ්‍රී පූජ්‍ය පෙතිගමුවේ රාහුලාභිධාන
කොළඹ පල්ලේ පත්තුවේ ප්‍රධාන සංඝ නායක මහා ස්ථවිර වහන්සේ
එම විහාරස්ථානයේ වැඩවසන ගෞරවණීය මහා සංඝරත්නය

මගේ පියාට නිවන දැක බුදුන් දැකීමට පිහිට වූ ඒ උතුම් පිංකමට සහභාගී වීමට අපට ආශීර්වාද කළ,
වැලිගම අග්‍රබෝධි රාජමහා විහාරස්ථානයේ වැඩ වාසය කරන
අති පූජණීය උතුම් ශ්‍රී මහා බෝධීන් වහන්සේ,

වැලිගම අග්‍රබෝධි රාජමහා විහාරාධිපති රුහුණු විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය
දක්ෂිණ ලංකාවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක
පූජ්‍ය මිදිගම සෝරත නායක ස්වාමීන් වහන්සේ,

අග්‍රබෝධි රාජමහා විහාර පිරිවෙන්හි නියෝජ්‍ය පරිවේනාධිපති
පූජ්‍ය අගලකඩ විජිතධම්ම ස්වාමීන් වහන්සේ
එම විහාරස්ථානයේ වැඩවසන ගෞරවණීය මහා සංඝරත්නය

ඇතුලු ගෞරවණීය පූජණීය උතුම් පිං කෙත් බඳු අතීත, වර්ථමාන, අනාගත සියලු මහා සංඝරත්නයට,
මේ පුස්තකය එළිදැක්වීමට උපකාර කළ සියලු දෙනා වෙනුවෙන්
මම ඔබ වහන්සේලාගේ පාදාභිවන්දනා සිදුකරමින්
ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදුකරන්නෙමි!

ඒ උතුම් බෝධීන් වහන්සේ එම පින් බිමේ රෝපණය කිරීමට පිහිට වූ
දේවානම්ප්‍රිය ප්‍රියදර්ශන් පින්වත් රාජෝත්තමයාටද,
ඒ අවස්ථාව සලසා දුන් **සියලු දෙවියන්ටද**
ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදුකරන්නෙමි!

සබ්බ දානං ධම්ම දානං ජිනාති

සියලු දානයන් අතරින් ජයග්‍රාහී දානය ධර්ම දානයයි. එම මා හැඟි කටයුත්ත ඉතාමත් අර්ථාන්විතව සිදුකිරීමට විදේශ රටක පදිංචි යූ. එච්. විජේතුංග මහත්මිය ගන්නා උත්සාහය ප්‍රශංසනීයයි.

ගුණවත් දෙමව්පියන්ගේ ආශීර්වාදයෙන් ජීවිත ගමනට ශක්තිය ලැබූ එතුමිය තම සහෝදර සහෝදරියන් පිරිස හා එකමුතුව දෙමව්පියන්ද සමග තමන්ගේ සසර ගමන සුවපත් කර ගැනීමට සිදුකරගන්නා පාරමී ධර්ම සම්පූර්ණ කරගැනීමේ මෙම මහඟු ධර්ම දූත කාර්යය සාර්ථකව ඉටුකරගෙන මියගිය තම ආදරණීය පියාණන් වන නෙල්සන් විජේතුංග මහතා ඇතුලු සියලු ඤාතීන්ට පිං අනුමෝදන් කිරීම පිණිසත්, හේමලතා විජේතුංග ආදරණීය මෑණියන් දූ දරුවන් ඇතුලු පවුලේ ඤාති හිතමිත්‍රාදීන් සියලු දෙනාගේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම පිණිසත්, මෙන්ම මේ ධර්ම ග්‍රන්ථය පරිශීලනය කරන ඔබ සැමට ධර්මාවබෝධය ලැබීම පිණිසත්, අග්‍ර බෝධීන් වහන්සේගේ ආශීර්වාදය හා තෙරුවන් සරණ ලැබේවා යයි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි!

වැලිගම අග්‍රබෝධි රාජමහා විහාරාධිපති රුහුණු විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය
දක්ෂිණ ලංකාවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක මිදිගම සෝරත නාහිමි

චිරං තිට්ඨතු සද්ධම්මො ලොකො හොතු සුඛී සදා

දහම් පොත්පත් රචනා කිරීම අටමහ කුසල් වලින් එකකි. එවන් පුණ්‍ය කර්ම සඳහා සිත යොමු කර කිසිදු ලාභ අපේක්ෂාවකින් තොරව එම සද්කාර්යය සිදු කරන්නෝද ඉතා දුර්ලභය. උතුම් මිනිසත් බව ලැබ එවන් දුලබ ගුණ පිරි පිරිසක් ඇසුරු කිරීමට ලැබීමද භාග්‍යයකි.

බුදු දහමේ හරය නිවැරදිව හඳුනාගෙන ඒ මඟ ඔස්සේ තම දිවිය ගොඩනගා ගන්නා අතරම තම දහම් දැනුම සමාජයට දායාද කරන්නට වෙර දරණ උපාසිකාවක් ලෙස යූ. එච්. විජේතුංග මැතිණිය මා දකිමි. මුදල්, ලාභ සත්කාර, ප්‍රශංසා පසුපස හඹා යන සමාජයක කිසිදු ලාභ අපේක්ෂාවකින් තොරව "අති පූජණීය පිරිත් පොත් වහන්සේ, ධම්ම පදය හා මහා සතිපට්ඨාන සූත්‍රය" යන ග්‍රන්ථත්‍රය ඉතා සරලව, අවබෝධ කරගැනීමට පහසු වන සේ ලිහිල් බසින් සංස්කරණය කොට මුද්‍රණය කර ධර්ම දානයක් ලෙස නොමිලේ බෙදා හරිමින් සිදුකෙරෙන සමාජ, ආගමික මෙහෙවර ඉතා අගය කොට සලකමි.

විදේශ ගතව සිටියත් බුදුදහමේ වටිනාකම් හඳුනාගෙන තෙරුවන් කෙරෙහි ගෞරවයෙන් කටයුතු කරන ඔබතුමිය ප්‍රධාන පවුලේ සැමට, දෙමාපියන්ට, චතුරාර්ය සත්‍ය අවබෝධය පිණිස මෙම කුසලය හේතුවේවා'යි ආශීර්වාද කරන අතර තව තවත් මෙවන් උතුම් පුණ්‍යකර්ම සිදුකිරීමට භාග්‍යය උදාවේවා'යි පතමි.

තෙරුවන් සරණයි.

මෙයට,

පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථානය, වේරහැර ගංගාරාම පුරාණ විහාරස්ථානය,
තුම්බෝවිල ශ්‍රී සද්ධර්මාරාම විහාරස්ථානය, තිත්තපත්තර දක්ෂිණගිරි විහාරස්ථානය,
හිරිපිටිය විහාරස්ථානය යන පංච මහා විහාරාධිපති, සාමදාන විනිශ්චයකාර
ශ්‍රී දේවානන්ද වංශාලංකාර, සද්ධර්ම කීර්ති ශ්‍රී පූජ්‍ය පෙතිගමුවේ රාහුලාභිධාන
කොළඹ පල්ලේ පත්තුවේ ප්‍රධාන සංඝ නායක මහා ස්ථවිර
නියෝජ්‍ය සභාපති - ජාත්‍යන්තර SOS සංවිධානය ශ්‍රී ලංකා සංවිධානය
අධ්‍යක්ෂක - SOS ළමා ගම්මාන කමිටුව, සභාපති - SOS සංවිධානයේ ගම්මාන කමිටුව
ප්‍රධානාචාර්ය - ශ්‍රී සිද්ධාර්ථ දහම් පාසැල, වේරහැර ගංගාරාම දහම් පාසැල
ප්‍රධාන අනුශාසක - ශ්‍රී මහා මහින්ද පුජෝත්සව කමිටුව

සුභාශිංසනය

බුදුන් වහන්සේ දේශනා කරන ලද ධර්මය පරම්පරාවෙන් පරම්පරාවට ග්‍රන්ථකරණයෙන් පවත්වාගෙන ඒම නිසා, වසර 2500කටත් වඩා සුරක්ෂිත වූවා සේම, සිව්වනක් පිරිසට නිවනේ රන්දොරටුවට පිවිසීමටද හැකිවූයේය. එයින් තවත් පිරිසක් නිවනට යන මග පාදාගත්තා සේම තවත් පිරිසක් නිවැරදි ජීවන මාර්ගය ගැන අවබෝධය ලබමින් ජීවිතාවබෝධයද සලසා ගත්හ.
තවත් කෙනෙක් යුගයෙන් යුගයට සංසාරගත පුරුදු මත දැන ඉගෙන ගෙන මෙම ධර්මය ජන හදවත්වල සනිටුහන් කිරීම සඳහා ලේඛන කලාව නැතහොත් ග්‍රන්ථකරණය කිරීම සිදුකලහ. දෙස් විදෙස් වල බොහොමයක් ධර්ම ග්‍රන්ථ කතුවරුන් පැවිදි උතුමෝය. එම මහඟු ධර්ම ග්‍රන්ථකරණයේ යෙදෙන ගිහි උගතුන් ඉතා අඩුවන අතර කාන්තාවන් එම කටයුත්තේ යෙදීම පෙර පින් මහිමයෙන් ලද සංසාර ගත පුරුදු මත නිසාම සිදුවන්නකි.

බුදුන් වහන්සේ දේශනා කරන ලද ධර්මය ඇතුලත් ත්‍රිපිටකයේ අඩංගු අසූ හාරදහසක් ධර්මස්කන්ධ අතුරින් ජනතාවට බෙහෙවින් උපකාරී වීමට, ආරක්ෂාව සලසාගැනීමට, දෛනික ජීවිතය යහපත් අයුරින් සකස් කර ගැනීමට, ජීවිත අනිත්‍යතාවය තේරුම් ගැනීමට ඉවහල් වන සූත්‍ර ධර්ම, ධම්ම පද පාඨ, සතිපට්ඨාන භාවනාව, පැරණි ධර්ම ග්‍රන්ථ උපයෝගී කර ගෙන රචනා කරමින් නවීන තාක්ෂණික ක්‍රමද භාවිතා කරමින් ලේඛන ගතකර මානව හිතවාදී සාමකාමී අවිහිංසාවාදී දර්ශනයක් වන බුදු දහම දෙස් විදෙස් ජාති ආගම් භේදයකින් තොරව, ලොවට කියාදීම සඳහා යූ. එච්. විජේතුංග මහත්මිය විසින් සිදුකරනු ලබන ක්‍රියාව උතුම් අටමහා කුසල් වලින් එකකි.

යූ. එච්. විජේතුංග මහත්මිය ගුණවත් දෙමව්පියන්ගේ නිවැරදි මාර්ගෝපදේශකත්වයද, ගමේ පන්සල සමග සම්බන්ධ වී ලබාගත් ආගමික පසුබිමද, දහම් පාසල් ශිෂ්‍යාවක ලෙස අවසන් වසර දක්වා ලබාගත් දහම් සහ පාලි දැනුමද, දහම් පාසල් ගුරුවරියක් ලෙස හොඳින් ඔපමට්ටම් කරගත් දහම් දැනුමද, අනුව කුඩා කල සිට අවබෝධ කරගත් ධර්මයට අනුව ශ්‍රද්ධාසම්පන්න ජීවිතයක් සකසා ගැනීම මෙන්ම විවිධ ගිහි පැවිදි උතුමන්ගේ ධර්ම ග්‍රන්ථ ඇතුළු වෙනත් ග්‍රන්ථ පරිශීලනය කිරීම නිසා බොහෝ ඇසූ පිරූ බව ඇතිකරගැනීමද, ඉතා අගය කල යුත්තකි.
එහි ප්‍රතිඵලයක් ලෙස “**අති පූජණීය පිරිත් පොත් වහන්සේ, සතිපට්ඨාන සූත්‍රය,** බෞද්ධයාගේ අත් පොත වන **ධම්ම පදය**” යන ග්‍රන්ථත්‍රය පාලි පෙළ සමග සරල සුගම ලෙස සිංහලෙන් අර්ථ දැක්වීම ඉතා අගය කොට සැලකිය යුත්තකි.
මෙම උතුම් ධර්ම ග්‍රන්ථ සකස් කොට නොමිලයේ බෙදා දීම ඉතා උතුම් පින්කමකි. එම උතුම් පින මියගිය නෙල්සන් විජේතුංග පියාට නිවන් සැප පිණිසත්, මව වන හේමලතා විජේතුංග මැතිණියට නිරෝගී සුව සහ දීර්ඝායුෂ පිණිසත්, ඔබතුමියට, පවුලේ සැමට සහ සහෝදර සහෝදරියන්ට යහපත අභිවෘර්ධිය සලසාගැනීම පිණිසත් හේතු වේවා යයි පතමි.

මෙයට,

ශාස්ත්‍රපති, යටිගල සෝමතිලක ස්ථවිර
මාතර කොටුවේගොඩ ජයසුමනාරාමය, ගල්පමුන චූලසුමනාරාමය යන උභය විහාරාධිපති
ජයසුමන පිරිවෙන් අධ්‍යක්ෂක, අමරපුර සිරි සද්ධම්ම වංශ මහා නිකායේ කාරක සංඝ සභික
දිවයිනටම සාම විනිසුරු

මගේ පියාගේ ප්‍රාර්ථනය ඔහුගේම අත් අකුරින්

සරණක් නොමැත තුන් ලොව බුදු සරණ විනා
පිහිටක් නොමැත ඔබෙ සදහම් මදුර විනා
එළියක් නොමැත මුනිඳුන් ලෝකයක් විනා
සුවයක් නොමැත හිමි දුටු අම නිවන විනා

සවනත පිනකරා බුදු බණ අසන්නට
මානෙත පිනකරා බුදු රුව දකින්නට
මානසිත සරදා මනා කාය ලබන්නට
චිත්තගත යොමුකරා විදසුන් වඩන්නට

සපිරිසක් දුදනන් [illegible] සපිරි වරා
තිබුණත් අහස් උස වන් තම් මැරෙන තුරා
වින්දත් රජ සැපත ගිලකලු දිවිය පුරා
මොහොතක් ගෙන යාද පසු විශ ජවත් හැරා

හිනි ගෙන දැවෙන හදවත් සිසිලෙන් නිවන
මිනි පහනක් ලෙසට සම බුදු ගුණ දිලෙන
මුනි [illegible] දෙසූ අමරස වන් මදුර බණ
මන [illegible] මගේ දුව [illegible] හද නිවන

සසරේ වසන තුරු ජර දුක් උපත් නැති
නිසරේ නොවන සැපතක කෙලවරක් ඇති
විසිරේ සවලු බුදු ගුණ හද තුටියෙ බැති
පැතිරේ මිහාදු පැතුමන් අම නිවනෙ [illegible]

නිවමින් හදේ නැලියන කෙලෙසුන් ගින්න
දහමින් එක නොමා සිල්වත් වී ඉන්න
පුරමින් පැතුම් මතු භව පැවිදිව ඉන්න
අවිහිංසා සකච යම් සසරින් ගොඩ වෙන්න

මානෙවි

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං
එතං බුද්ධානුසාසනං

“**ලෝභ-ද්වේශ-මෝහ** යන් නිසා සිදුකරගන්නා
සියලු පාපයන් නොකර ඒවායින් වෙන්වීම

තණ්හා- දෘෂ්ඨී-මාන දුරුකර
කුසලයන් වඩවා ගනිමින් උසස් හවට පත්වීම

‘මමය- මගේය- මගේ ආත්මය’ යයි
තම කය සහ සිත කෙරෙහි ඇති උපාදානය අතහැර
සිත නිදහස් කර ගැනීම”

යන මේවා බුදුවරුන්ගේ අනුශාසනා වේ!

කිසිදු ලෞකික ලාභ අපේක්ෂාවක් හෝ ප්‍රතිරූපය පුම්බා ගැනීමක්
හෝ කිසිදු ආකාරයකින් ප්‍රසිද්ධ වීමක් හෝ අපේක්ෂාවකින් තොරව
මා විසින් මේ පොත සම්පාදනය කළේ මා විසින් අවබෝධ කරගත්
ඒ අත්හදා බලන මොහොතේ සිටම ප්‍රතිඵල අත්විඳිය හැකිවන
සාන්දෘෂ්ඨික ගුණයෙන් යුතු චතුරාර්ය සත්‍ය ධර්මය,
තවත් එක් පින්වන්තයෙකුට හෝ පිහිටක් ලබාගත හැකිවේවි යයි
යන උතුම් වූ පරමාර්ථයෙන්
මා හටත් හැකි අයුරින් විවෘත කර බැබලවීමට සැලැස්වීමටයි.

“ඒ මගේ වචනය සත්‍යයක් නම්, ඒ සත්‍යයේ ආනුභාවයෙන්
මේ ධර්ම පුස්තකය මෛත්‍රී බුදුන් පහල වන තෙක්ම පවතීවා!”

<u>ඇත්තටම 'ධම්ම පදය' කියන්නේ මොකද්ද? ඇයි ධම්ම පදයට 'දහම් අත් පොත' කියන්නේ?</u>

ධම්ම පදය යනු බුදුන් වහන්සේ වසර 45ක් පුරා දේශනා කල ධර්මයේ සංෂිප්තයයි. බුදුන් වහන්සේ දේශනා කල බොහෝ සූත්‍ර අවසානයේ පද 2 කින් හෝ 4 කින් හෝ එහෙමත් නැතිනම් කිහිපයකින් හෝ ඒ දේශනාව කැටි කර දක්වා තිබෙනවා, ශ්‍රාවකයාට මතක තබා ගැනීමට පහසුව පිණිස.

කෙසේ හෝ කවදා හෝ ධර්මය අවබෝධ කරගත්, බොහෝ විට රහතන් වහන්සේ කෙනෙකු විය හැකි උත්තමයෙකු විසින් බුදුන් වහන්සේගේ මුළු ධර්මයම ඇතුලත් වන ආකාරයට මේ පද 423 ක් තෝරාගෙන, ඒ ඒ පද දේශනාවන්ට විෂය වූ කාරණය යටතේ ගොනුකර ඒ නමින් මාතෘකා ගත කර, ඒවා වග්ගයන් ලෙස හඳුන්වා තිබෙනවා.

ඒ අනුව වග්ග 26 ක් තිබෙනවා. මෙම ධම්ම පදය ත්‍රිපිටකයේ ඛුද්දක නිකායේ ඇතුලත් වෙනවා.

යම් කෙනෙක් මුළු ධම්ම පදයම **නිවැරදි තේරුම් සහිතව කියවන්නේ නම්**, ඒ නිසාම ඒ කෙනාට නිවැරදිව දැනගැනීමට හැකිවෙනවා, බුදුන් වහන්සේගේ සහ උන්වහන්සේගේ ධර්මයේ නිවැරදිම ස්වරූපය.

වග්ගය	සඳහන් වන්නේ කුමක් ගැනදැයි යන වග
යමක	කෙනෙකුගේ ස්වභාවය අනුව ඒ කෙනාට යහපත සහ අයහපත ළඟාවෙන ආකාරය පෙන්වා දීම
අප්පමාද	ලෞකික ආශාවන් වලට වහල් වීම නිසා ඇතිවන පසුතැවීමත්, ශෝක කිරීමට සිදුවීමත් අවබෝධකරගෙන එයින් මිදී සසරේ ප්‍රමාදය වලක්වාගැනීමේ වැදගත් කම පෙන්වා දීම
චිත්ත	තමාගේ පැවැත්මට හේතුවන සිත ගැන අවබෝධ කරගෙන තමන්ගේ යහපත පිණිස කටයුතු කලයුත්තේ කෙසේදැයි පෙන්වා දීම
පුෂ්ප	මල් උපමාකරමින් 'නෙළුමක් පිපුණු පසු නැවත කිසි දිනෙක මඩේ නොතැවරෙන්නාසේ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගෙන සංසාරයෙන් එතෙර වූ තැනැත්තා නැවත කිසිදා උපදින්නේ නැති බව' පෙන්වා දීම වැනි ධර්ම කරුණු පෙන්වා දීම
බාල	අවිද්‍යාවෙන් අන්ධ වීම නිසා අඥානයෙකු වීමෙන් කෙනෙකුට සිදුවිය හැකි විනාශයන් පෙන්වා දීම
පණ්ඩිත	සිහි නුවණින් වාසය කරන ප්‍රඥාවන්තයෙකු කෙසේ කටයුතු කරන්නේදැයි පෙන්වා දීම
අරහත්	රහතන් වහන්සේලාගේ ස්වභාවය පෙන්වා දීම
බ්‍රාහ්මණ	උසස් මනුෂ්‍යයෙක්ගේ ස්වභාවය පෙන්වා දීම

සහශ්‍ර	දැනට සමාජයේ උසස් යයි මිනිසුන් විසින් සම්මත කරගෙන සිටින දේවල ප්‍රමාණයන් හා සංසන්දනය කරමින් සත්‍ය වූ උතුම් හෝ උසස් බවෙහි වටිනාකම පෙන්වා දීම
පාප	කෙනෙක් සිදුකරන පාප ක්‍රියා නිසා තමන්ට ඇතිවන විපාකයන් ගැන නුවණින් මෙනෙහි කල යුතු බව පෙන්වා දීම
සුඛ	ඇත්තටම සැපය යනු කුමක්ද, ඒ සැපය ලබාගත හැක්කේ කෙසේද යන්න පෙන්වා දීම
දණ්ඩ	අන් අයට හිංසා පීඩා කිරීමේ ආදීනව පෙන්වා දීම
ජරා	මමය-මගේය යනුවෙන් උපාදානය කරගෙන සිටින ශරීරයේ ඇති යථා ස්වභාවය පෙන්වා දීම
අත්ත	තමන් ගැන අවබෝධ කරගෙන තමන්ට යහපත සලසා ගන්නා ආකාරය පෙන්වා දීම
ලෝක	තමන්ගේ ලෝකය යනුවෙන් හඳුනා ගෙන සිටින ඒවායේ යථා ස්වභාවය හඳුනා ගනිමින් ඒවා කෙරෙහි ඇති අසාර ඇලීම් දුරුකරමින් නිවැරදිව ජීවත් විය යුතු ආකාරය පෙන්වා දීම
බුද්ධ	බුදුවරු යනු කවුද? ඒ බුදුන් වහන්සේලාගේ ශ්‍රාවකයින් යනු කවුද යන්න පෙන්වා දීම
ප්‍රිය	ප්‍රිය අප්‍රිය බව නිසා ඇතිකරගන්නා බැඳීම් වලින් ශෝක කිරීමට සිදුවන ආකාරය අවබෝධ කරගත යුතු බව පෙන්වා දීම
ක්‍රෝධ	ක්‍රෝධ කිරීමේ ආදීනව හඳුනාගෙන ඉන් මිදිය යුතු ආකාරය පෙන්වා දීම
මල	කෙනෙක් තුල සසරේ ප්‍රමාදයට හේතුවන කෙලෙස් මලකඩ බැඳීම හා උපමා කරමින්, ඒවා දුරුකර ගතයුතු බව පෙන්වා දීම
ධර්මස්ථ	බුදුන් වහන්සේගේ පැවිදි ශ්‍රාවකයන් යනු කුමන ස්වභාවයක පුද්ගලයන්ද යන්න පෙන්වා දීම, 'තාපසයෙක්' යනු කවුද? 'පැවිද්දෙක්' යනු කවුද? 'භික්ෂුවක්', 'ස්ථවිර', 'මහණ' කෙනෙක් ලෙස හැඳින්වීමට සුදුසු වන්නේ කවුද? යන්න පෙන්වා දීම
භික්ෂු	බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නයේ ස්වභාවය විය යුත්තේ කෙසේද? 'භික්ෂුවක්' ලෙස හැඳින්වීමට සුදුසු වන්නේ කවුද? යන්න පෙන්වා දීම
ප්‍රකීර්ණක	බුදුන් වහන්සේගේ ගිහි හෝ පැවිදි ශ්‍රාවකයෙක්ගේ ස්වභාවය පෙන්වා දීම
නිරය	ගිහි මෙන්ම විශේෂයෙන් පැවිදි පිරිසද නිරය ගාමී වීමට ඇති අවස්ථා සුලභ බව නුවණින් අවබෝධකරගනිමින් එයින් වැලකීම සඳහා සිහිනුවණින් කටයුතු කළයුතු බව පෙන්වා දීම
නාග	ඇතුන් උපමා කරමින් ධර්ම කරුණු පෙන්වා දීම
තෘෂ්ණා	තණ්හාවේ ස්වභාවය පෙන්වා දීම
මාර්ග	ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නෙකුගේ ස්වභාවය පෙන්වා දීම

හැඳින්වීම

සූත්‍ර තිස් හතරක් ඇතුලත් දීඝ නිකායද,
සූත්‍ර එකසිය පනස් දෙකක් ඇතුලත් මජ්ඣිම නිකාය ද,
සූත්‍ර හත්දහස් හත්සිය හැට දෙකක් ඇතුලත් සංයුක්ත නිකායද,
සූත්‍ර නවදහස් පන්සිය පනස් හතක් ඇතුලත් අංගුත්තර නිකායද,
ඛුද්දක පාඨ, ධම්ම පද, උදාන පාලි, ඉති වුත්තක, සුත්ත නිපාත, විමාන වත්ථු,
පෙත වත්ථු, ථෙර ගාථා, ථෙරි ගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදාමග්ගප්පකරණය,
අපදාන, බුද්ධවංස, චරියා පිටක යන ග්‍රන්ථ පහලොවද, විනය පිටකයද,
අභිධර්ම පිටකයද, අනිකුත් සියලුම බුද්ධ වචනද, ඇතුලත් වන ඛුද්දක නිකායද,
ඇතුළුව නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

ධර්මස්කන්ධ අසූ හාරදහසක් වූයේ කෙසේද?

"ද්වාසීතිං බුද්ධතො ගණ්හිං
ද්වෙසහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානි
යෙ මෙ ධම්මා පවත්තිනො"

"බුදුන්ගේ දේශනා අසූ දෙදහසක් කොටස්ද, ශ්‍රාවක දේශනා දෙදහසක් කොටස්ද,
ඇතුළුව අසූහාරදහසක් ධර්මස්කන්ධයන් මම දරාගෙන සිටිනවා"
යයි ආනන්ද හාමුදුරුවන් ප්‍රකාශ කල ගාථාවයි ඒ.

භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම බුද්ධ වචනය

"අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහ කාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝ' සි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා" ති.
අයං තථාගතස්ස පඨම වාචා.

"නොයෙකුත් ආකාරයේ ප්‍රතිසන්ධීන් ලබමින්,
නැවත නැවත දුකම උරුම කරදෙන සංසාරය පුරා ඇවිදිමින්,
ඒ පීඩාවෙන් මිදී නිදුක් වීම සඳහා ඒ මාව පෙලන්නා සෙව්වෙමිය.

මම ඒ පෙලන්නා දුටුවෙමිය. නැවත 'මම' යයි කවරක්වත් උපාදානය නොකරන්නේය.
'සුබයි-සැපයි' ලෙස උපාදානය කර සිටි සියල්ල කෙරෙහි කලකිරී,
ඒ උපාදානය කර සිටි හේතුව වන,
'මම'ය යන හැඟීමෙන් ඇතිකරගත් තණ්හා-දෘෂ්ඨී-මානයන් සිඳ දා, තෘෂ්ණාව
මුළුමනින්ම දුරුකර, මධ්‍යස්ථ බවට පත්වුනෙමිය".

යන්න තථාගතයන් වහන්සේගේ ප්‍රථම වචනය වේ.

<u>භාග්‍යවතුන් වහන්සේගේ අවසාන බුද්ධ වචනය</u>

> “හන්ද දානි භික්ඛවෙ, ආමන්තයාමි වො,
> වයධම්මා සඞ්ඛාරා අප්පමාදෙන සම්පාදෙථා” ති.
> අයං තථාගතස්ස පච්ඡිමා වාචා.
>
> “එසේනම් මහණෙනි, දැන් මම තොපට ආමන්ත්‍රණය කරමි, ‘මම’ ය යන හැඟීම
> නැතිකර ගැනීම සඳහා සිහියෙන් යුතුව අප්‍රමාදව කටයුතු කරන්න”.

යයි තථාගතයන් වහන්සේගේ අවසාන වචනය වේ.

භාග්‍යවතුන් වහන්සේගේ, ප්‍රථම බුද්ධ වචනය වන අනෙක ජාති සංසාරං....... සිට හන්දදානි බික්ඛවේ ආමන්තයාමි, වො........ යන අවසාන බුද්ධ වචනය දක්වා වසර හතලිස් පහක් පුරා දේශනා කල අසූ දෙදහසක් ධර්මස්කන්ධය එකම රසයකින් යුතු වන්නේය. ඒ නම් විමුක්ති රසයයි. ඒ ධර්මයේ මුල-මැද-අග කොතනකින් ගත්තත් එහි ඇත්තේ ‘මමය-මගේය- මගේ ස්ථිරවූ ආත්මයක් ඇත’ යන්න සිතා සිටින අවිද්‍යා සහගත අදහස දුරලිය යුතුය, යන ඉගැන්වීමයි. අවිද්‍යා සහගත බැඳීම් වලින් මිදිය යුත්තේ කෙසේද, යන්න ඉගැන්වීමයි.

බුදුන් දේශනා කර ඇත්තේ, සතර බ්‍රහ්ම විහරණයන් තුලින් ප්‍රඥාව උපදවාගෙන අනිච්ච-දුක්ඛ-අනත්ත ස්වභාවය ගැන අවබෝධය ඇතිකරගනිමින් අවිද්‍යාවෙන් මිදී නිදහස් වන මාර්ගය පෙන්වාදෙන ඉගැන්වීමකි.

එය ‘මම’ යනු ස්ථිර කෙනෙකියි, යන හැඟීම දුරුකිරීම හෙවත් තමන්ගේ සිතෙන් තමා මිදී නිදහස් වීම නමැති විමුක්තිය ඇතිකරගැනීම සඳහා අනුගමනය කලයුතු ප්‍රතිපදාවයි.

ඒ බුද්ධ දේශනා අසූදෙදහසක් ධර්මස්කන්ධයේම තිබෙන්නේ
මෛත්‍රිය-කරුණාව-මුදිතාව-උපේක්ෂාව ගැන ඉගැන්වීමයි.

ඒ බුද්ධ දේශනා අසූදෙදහසක් ධර්මස්කන්ධයම
අනිච්ච-දුක්ඛ-අනාත්ම ලක්ෂණයෙන් සමන්විතයි.

අලෝභය-අද්වේශය-අමෝහය ස්වභාවයයි. වීතරාගී-වීතදෝෂී-වීතමෝහී ස්වභාවයයි.

එය පහාරාද සූත්‍රයේ උපමා සහිතව පෙන්වා දී තිබෙන්නේ මෙසේයි.

> “පහාරාද, මහාසමුද්දො එකරසො ලොණරසො.
> එවමෙවං ඛො පහාරාද, අයං ධම්මවිනයො එකරසො, විමුත්තිරසො.
> යම්පි පහාරාද, අයං ධම්මවිනයො එකරසො, විමුත්තිරසො”.
>
> “පහාරාද, මහා සමුද්‍රයේ ජලය කොතනකින් ගත්තද ඒවා ලුණු රසයෙන් යුක්තය.
> ඒ ආකාරයටම පහාරාද, මේ ධර්මයේ වනාහිද ඇත්තේ එකම රසයකි,
> එනම් විමුක්ති රසයයි.
> පහාරාද, මෙලෙස මේ ධර්මය, විමුක්ති රසය නම් එකම රසයෙන් යුතු වන්නේය”.

මේ තමයි බුදුන් වහන්සේ තමන් දේශනා කල ධර්මය අතුරුදහන් වෙන හේතූන් පෙන්වා දුන් ආකාරය

> "ද්වෙමෙ භික්ඛවෙ ධම්මා
> සද්ධම්මස්ස සම්මොසාය අන්තරධානාය සංවත්තන්ති.
> කතමේ ද්වෙ?
> දුන්නික්ඛිත්තඤ්ච පදබ්‍යඤ්ජනං - අත්ථො ච දුන්නීතො"
>
> "මහණෙනි, සද්ධර්මය විනාශ වීමට, අතුරු දහන් වීමට කරුණු දෙකකි.
> වරදවා ගත් හෝ වැරදි සේ ගෙන ගිය පෙළ දහම සහ
> වරදවා ගත් හෝ නපුරු සේ යෙදූ අටුවාව හෙවත් අර්ථයයි".

1985 දී මට වාසනාව ලැබුනා, කපුදුවේ සිරි ගුණාලංකාර හිමියන් වැනි සත්‍ය වශයෙන්ම බුදුන් සරණ ගිය පූජණීය හිමි නමකගේ ආශීර්වාදය ලබාගැනීමට. උන් වහන්සේට විශාල හැකියාවක් තිබුනා ඉතා නිවැරදි අනාවැකි කීමට පවා. එදා උන්වහන්සේගේ පන්සලේ දේවාල ඉදිරිපිට තිබූ පුවරුවල ලියා තිබුනා, 'දෙවියන්ට වඳින්න එපා, පුද පූජා තබන්න එපා, පින් දීම විතරක් කරන්න' යනුවෙන්. නමුත් එදා ඒ ගැන අවබෝධ කරගැනීමට තරම් සුදුසු පරිසරයක් හෝ දැනුමක් හෝ මා හට තිබුනේ නැහැ. 1986 උන්වහන්සේගේ හදිසි අභාවයෙන් වසර කීපයකට පසු මගේ බාලම සහෝදරයා, දිනක් ජයසේන ජයකොඩි මහතා විසින් ලියන ලද 'අරලිය මල් ආරාමය' නවකතා පොත මට ගෙනත් දුන්නා කියවීමට. එහි ප්‍රධාන චරිතය වන රාහුල හාමුදුරුවන් තුලින් මට සිරි ගුණාලංකාර හාමුදුරුවන් පෙනුනා සේම, සංසාරයේ දැන පුරුදු අතීත හුරු පුරුදු හැඳිනීමක් මතක් වීමටද තරම් ඒ පොතෙහි තිබූ ඒ චරිතය බලවත් වුනා. සිත උසස් තත්වයට පත්කරගත් උත්තමයන් මෙවැනි විය යුතුය යන්නත්, බුදු හාමුදුරුවන්ගේ ශ්‍රාවක සංඝරත්නය මෙවැනි විය යුතුය යන්නත්, මට ඒ චරිතය තුලින් වැටහුනා.

එදා පටන් මම පිපාසයකින් මෙන් සෙවූ බුදු දහම, මට සොයාගැනීමට ලැබුනේ 2015 දී, ගෞරවණීය අජාහ්න් චා ස්වාමීන් වහන්සේගේ ප්‍රධාන ගෝල ස්වාමීන් වහන්සේ වන ගෞරවණීය අජාහ්න් සුමේදෝ ස්වාමීන් වහන්සේගේ පොතක් *(Ajahn Sumedho Volume 5 - The Wheel of Truth)* කියවීම මගිනි. ඒ කාලය තුල මට සිල්වත් ස්වාමීන් වහන්සේලා කිහිප නමක් මුණගැසී තිබුණ නමුත් අජාහ්න් සුමේදෝ ස්වාමීන් වහන්සේගේ ඒ පොත කියවීම තුලින් තමයි මා හට චතුරාර්ය සත්‍යය පිලිබඳ පැහැදිලිම අවබෝධය ලැබුනේ.

එතැන් පටන් මේ වසර හත පුරා විදර්ශනා භාවනාව තුලින් මා විසින් ප්‍රගුණ කරගත් ධර්ම අවබෝධය තුලිනුත්, මා හට කියවීමට ලැබුණු 1875-1950 අතර කාලය තුල වැඩසිටි ස්වාමීන් වහන්සේලා අතින් ලියවුනු බොහෝ පොත් පත් මෙන්ම, අශෝක රජතුමා විසින් ලියන ලද සෙල්ලිපි වල ඇතුලත් කාරණයන් තුලිනුත්, මට තහවුරු වුනා මම දරණ මතය සාධාරණ බව. එනම්, ගෞතම බුදුන් වහන්සේගේ සත්‍ය වූ බුදුදහම යටපත් කර ඇත්තේ හිතාමතා බව. එයට හේතුව විය හැක්කේ, කාම ලෝකය පවත්වාගෙන යාමට නම් මිනිසුන් තුල ලෝභය-ද්වේශය උපද්දවීම සිදුකල යුතු නිසාවෙනි.

මේ ආකාරයට බුදුන්ගේ නිර්මල ඉගැන්වීම යටපත් වී, ඊට සහමුලින්ම වෙනස්වූ බුදු දහමක් වර්ථමාන ලෝකය තුල විද්‍යාමාන වන බව දැකීමට පුළුවන් වෙනවා.
'මමය-මගේය-මගේ ආත්මය' යනුවෙන් අල්ලා ගැනීම අතහැරීමට ඉගැන්වූ බුදු පියාණන් වහන්සේ සහ උන් වහන්සේගේ යම් වචන පවා විකුර්ති කර හුවා දක්වමින්, ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයන් යයි කියාගන්නා බොහෝ බෞද්ධයන් තමන්ට සිදුකරගන්නා ඒ විනාශයන් කොතරම් දැයි ඔවුන්ට දැනගත හැකිවන්නේ, යම් දිනක ඒ විපාකයන් ගෙවන අවස්ථාවලදීයි.

ඒ අනුව අද වනවිට තවත් ආගමක් පමණක් වී ඇති මේ උතුම් වූ ඉගැන්වීම සසර භය නිසා වැඳුම් පිදුම් කරන තවත් පූජා භාණ්ඩයක් පමණක් වී තිබෙනවා. බුදුන් සහ බුදුන් වදාළ දේශනා, පහසුවෙන් මුදල් ඉපයීම සිදු කරගත හැකි වෙළඳ භාණ්ඩ බවට සහ තමන්ගේ ප්‍රතිරූපය පුම්බා ගැනීමට පළඳින ආභරණ, පමණක් බවට පත්වී තිබෙනවා.

ඇත්ත වශයෙන්ම කෙනෙක්, අඩුම වශයෙන් කර්මය-කර්ම ඵල වත් විශ්වාස කරනවා නම් ඒ කෙනා කල යුත්තේ ගෙවෙන සෑම මොහොතකම තමන්ගේ සිත ආරක්ෂා කරගැනීමයි.

කරුණාකර තේරුම් ගන්න, අවබෝධ කරගන්න, බුදු හාමුදුරුවන් යනු වචනවලින් පෙන්වා දිය නොහැකි තරම් ආනුභාව සම්පන්න බවක් ඇති කෙනෙකු බව.

'බුද්ධ' යන නාමය කීමේදී පවා ඉතාමත් පරිස්සම් විය යුතු බව.

මම මෙලෙස මෙම ධර්ම පුස්තකය සම්පාදනය කිරීමට ප්‍රධාන අරමුණ කර ගත්තේ, මටද හැකි ආකාරයෙන් ඒ සත්‍ය වූ ධර්මය විවෘර්ත කර බැබලවීමට සැලසීමයි.

මා හට ගෞතම බුදුන් වහන්සේ දැක ගැනීමට පිහිට වූ, උන් වහන්සේ විසින් දේශනා කළ ශ්‍රී සද්ධර්මය, මා විසින් වඩවා ගත් ප්‍රඥාව තුලින් හැකි ඉතා නිවැරදි ආකාරයට සිංහලට පරිවර්ථනය කරමින්, කිසිදු මුදලක් හෝ ලෞකික ලාභයක් හෝ අපේක්ෂාවකින් තොරව ඔබ වෙත මෙසේ ඉදිරිපත් කරන්නේ තවත් එක් පින්වන්තයෙකුට හෝ ඒ අනුත්තර වූ බුදුන් වහන්සේ දැකගැනීමට හැකිවන මාර්ගය පෙන්වා දීම පිණිසයි.

මඩිතියවෙල සිරි සුමඞගල හිමි පාලි-සිංහල ශබ්දකෝෂය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි පාලි-සිංහල ශබ්ද කෝෂය සහ මගේ ධර්ම අවබෝධය, පාලි සිංහලට පරිවර්තනය සඳහා භාවිතා කලෙමි.

එබැවින් අපගේ සියලුම පොත්වල සහ වෙබ් අඩවියේ ඉදිරිපත් කර ඇති ඉංග්‍රීසි පරිවර්ථන සහ සිංහල පරිවර්ථන වැරදි අර්ථකථන වළක්වා ගැනීම සඳහා අප විසින් පමණක් සිදු කරන බව කරුණාවෙන් සලකන්න.

අද සම්මත ලෝකයේ තිබෙන බුදුන් වහන්සේගේ ධර්මයේ සිංහල පරිවර්ථනත්, අප විසින් සිදු කර ඇති පරිවර්ථනත්, අතර විශාල වෙනසක් ඇත.

'කාලාම' සූත්‍රයේ බුදුන් වහන්සේ විසින්ම පෙන්වා දී ඇති ආකාරයට නුවණින් ගලපා බලමින්, නුවණින් මෙනෙහි කරමින්, තමන් තුල තණ්හා-දෘෂ්ඨි-මාන නොවැඩෙන්නේ කුමන ආකාරයකට පිළිපදින විට විය හැකිදැයි නැවතත් නුවණින් මෙනෙහි කරන්න. ඒ අනුව අප විසින් සිදුකරන මේ පරිවර්ථනය හෝ අද ලෝකයේ පවතින සම්මත පරිවර්ථන හෝ පිළිගැනීම ඔබ සතු වගකීමකි.

එහිදී අප විසින් සිදුකරනු ලබන පරිවර්ථන පිළිගන්නේ නම්, අප්‍රමාදව ඒ අනුව පිළිපදින්න. ඒ සඳහා වීර්යය කරන්න.

'එථ තුම්හෙ කාලාමා!
මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය,
මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන,
මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති.
යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ –
'ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා,
ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තී'ති.
අථ තුම්හෙ කාලාමා, පජහෙය්‍යාථා' ති.

'එථ තුම්හෙ කාලාමා,
මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය,
මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන,
මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති.
යදා තුම්හෙ කාලාමා, අත්තනාව ජානෙය්‍යාථ –
'ඉමෙ ධම්මා කුසලා, ඉමෙ ධම්මා අනවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුප්පසත්ථා,
ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තී'ති.
අථ තුම්හෙ කාලාමා, උපසම්පජ්ජ විහරෙය්‍යාථ.

කාලාම සූත්‍රය – ගෞතම බුදුන් වහන්සේ

“ඒ අනුව ‘කාලාම’ තොප!
එය මෙසේලු, යි යන ආරංචියෙන් යමක් ඇසීම නිසා පිළිගන්න එපා -
මවුපිය පරම්පරාවෙන් පැවතෙනවා, යයි කිසිවක් පිළිගන්න එපා -
ඒ තමයි පවතින ක්‍රමය යයි, කියා කිසිවක් පිළිගන්න එපා -
පරියාප්ති ධර්මයේ කොටසක තිබෙනවා යයි, කෙනෙක් කියන නිසා පිළිගන්න එපා -
තර්කයෙන් පෙන්නා දෙන නිසා කිසිවක් පිළිගන්න එපා -
යම් කිසි දර්ශනයක් යයි, කිසිවක් පිළිගන්න එපා -
ආකෘතියකට අනුව ගැලපේදැයි පරීක්ෂා කර බලා පමණක් පිළිගන්න එපා -
තමන් කැමති දෘෂ්ටියට අනුව ගැලපෙන නිසා යයි, පිළිගන්න එපා -
ඒ දේශනා කරන කෙනාගේ කතා විලාශයේ චතුර බවට හෝ දක්ෂ ලෙස බොහෝ කරුණු පෙන්නා
දෙන ආකාරය දැකීමේ ආශාව නිසා පිළිගන්න එපා -
උතුම් නොවන්නේ නම් ශ්‍රමණයෙක් වුවද, ඔහු කියන දේ පිළිගන්න එපා.

යම් කලෙක ‘කාලාම’ තොප තමන් විසින්ම නුවණින් මෙනෙහි කර දැනගත යුතුයි,
මෙය රාග- ද්වේශ යන කෙලෙස් ඇතිකරන දෙයක්,
ඒ අනුව ක්‍රියා කල හොත් මා තුල අකුසල් හටගන්නවා -
මේ කරන ක්‍රියාව නිසා මා තුල රාග-ද්වේශ කෙලෙස් හට ගන්නා නිසා එය දොස් සහිතයි -
මා විසින් මෙසේ ක්‍රියා කලොත් උසස් ප්‍රඥාවන්තයන්ගේ ගැරහීමට මාව ලක් වෙනවා -
මේ ආකාරයට ක්‍රියා කලොත්, මාව හාත්පසින්ම විපත්වලින් වෙලාගනිමින්
මා කරා දුකම පමුණුවනවා.
ඒ අනුව නුවණින් මෙනෙහි කරමින් ‘කාලාම’,
වහාම ඒ වැනි ක්‍රියාවලින් හෝ ඒ වැනි ආශ්‍රයන්ගෙන් හෝ ඔබ දුරු විය යුතුයි.

ඒ ආකාරයටම ‘කාලාම’ තොප!
එය මෙසේලු, යි යන ආරංචියෙන් යමක් ඇසීම නිසා පිළිගන්න එපා -
මවුපිය පරම්පරාවෙන් පැවතෙනවා, යයි කිසිවක් පිළිගන්න එපා -
ඒ තමයි පවතින ක්‍රමය යයි, කියා කිසිවක් පිළිගන්න එපා -
පරියාප්ති ධර්මයේ කොටසක තිබෙනවා යයි, කෙනෙක් කියන නිසා පිළිගන්න එපා -
තර්කයෙන් පෙන්නා දෙන නිසා කිසිවක් පිළිගන්න එපා -
යම් කිසි දර්ශනයක් යයි, කිසිවක් පිළිගන්න එපා -
ආකෘතියකට අනුව ගැලපේදැයි පරීක්ෂා කර බලා පමණක් පිළිගන්න එපා -
තමන් කැමති දෘෂ්ටියට අනුව ගැලපෙන නිසා යයි, පිළිගන්න එපා -
ඒ දේශනා කරන කෙනාගේ කතා විලාශයේ චතුර බවට හෝ දක්ෂ ලෙස බොහෝ කරුණු පෙන්නා
දෙන ආකාරය දැකීමේ ආශාව නිසා පිළිගන්න එපා -
උතුම් නොවන්නේ නම් ශ්‍රමණයෙක් වුවද, ඔහු කියන දේ පිළිගන්න එපා.

යම් කලෙක ‘කාලාම’, තොප තමන් විසින්ම නුවණින් මෙනෙහි කර දැනගත යුතුයි,
මෙය රාග-ද්වේශ යන කෙලෙස් ඇති නොකරන දෙයක්, ඒ අනුව ක්‍රියා කල හොත් කුසල් වැඩෙනවා
මේ කරන ක්‍රියාව නිසා මා තුල රාග-ද්වේශ කෙලෙස් හට නොගන්නා නිසා එය දොස් රහිතයි -
මා විසින් මෙසේ ක්‍රියා කලොත් උසස් ප්‍රඥාවන්තයන්ගේ පැසසුමට මාව ලක් වෙනවා -
මේ ආකාරයට ක්‍රියා කළ හොත්, ඉන්ද්‍රියයන් සංවර කර ගැනීමට හැකිවීමෙන්
මා වෙත සියලු යහපත සුවය පැමිණවීම සිදුවනවා.
ඉතින් ‘කාලාම’, ඒ අනුව නුවණින් මෙනෙහි කරමින්, කුසලය සහ අකුසලය නිවැරදිව හඳුනාගෙන,
තමාට යහපත සහ අයහපත ඇතිවිය හැකි අවස්ථා ගැන අවබෝධයෙන් යුතුව,
නුසුදුසු දේ බැහැර කරමින්, සුදුසු දේ ආශ්‍රය කරමින් වාසය කරන්න”.

කාලාම සූත්‍රය – ගෞතම බුදුන් වහන්සේ

ගෞරව පූර්වක පුණ්‍යානුමෝදනාව

මගේ දෙමවුපියන්ටත්, සහෝදර සහෝදරියන්ටත්, මට අකුරු කියා දුන් පුංචි මාමාටත්, මාව මුලින්ම පාසලකට කැඳවා ගෙන ගිය සේදර මිස්ටත්, මට ජීවිතයට අත්වැලක් වූ මගේ විවාහ සහකරුටත්, මට ඇති එකම ලෞකික වටිනාකම වන මගේ දියණියටත්, මේ ජීවිතයේදී මා හට ඥාති මිත්‍රයන් වූ සියලු දෙනාටත්, සතිපට්ඨාන සූත්‍රයේ භාවනාව සම්බන්ධව පොතක් ලියන ලෙස මාව උනන්දු කල ශ්‍රී ලංකාවේ මිතුරියටත්, මා හට අප්‍රමාණ ගෞරවයකින් ආදරය දක්වන පෝලන්ත ජාතික සහෝදරියටත්, අප පවුලේ මොනයම් කරදරයකදී වුවද පැකිලීමකින් තොරව අපට පිහිට වූ ශ්‍රී ලංකාවේ මුස්ලිම් සොහොයුරා සහ බෞද්ධ සොහොයුරන් තිදෙනාටත්, මිය ගිය සොයුරු මිතුරාටත්, මේ ජීවිතයේ මෙන්ම සසරේ පෙර ජීවිත වලදී සිදුකල යහපත් ක්‍රියාවල විපාක, පසු ගිය වසර පනස් හත පුරා සැප වේදනා ලෙස විඳිමින් ගෙවා දැමීම සඳහා මා හට උදවු-උපකාර කරමින් පිහිට වූ සියලු දෙනාටත්, එසේම ඒ කාලය තුල මේ ජීවිතයේ මෙන්ම සසරේ පෙර ජීවිත වලදී සිදුකල අයහපත් ක්‍රියාවල විපාක, දුක් වේදනා ලෙස විඳවමින් ගෙවා දැමීම සඳහා මා හට හිංසා-පීඩා කරමින් උපකාර කල සියලු දෙනාටත්, පළමුවෙන්ම පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

පසුගිය වසර කීපයකට ඉහතදී සිදුවූ පස්චාත් ශල්‍යකර්ම සංකූලතාවයක් නිසා ආබාධිතව ඉතා අසරණ වූ අවස්ථාවේදී වත්, ඒ වෙනුවෙන් ඊට හේතුවූ අය කෙරෙහි වෛර කරමින් නීති ක්‍රියා වලට යොමුවෙමින් මනස තව තවත් ඔද්දල් කරගනු වෙනුවට, ඒ ලැබුණු කායික නිදහස බුදුන් වහන්සේගේ සත්‍ය වූ ධර්මය සොයමින් ගතකිරීමට සිතක් මා තුල පහල වීමට හේතු වූ පෙර අතීත ජීවිත තුලදී මා විසින් වඩවා ගනු ලැබුවා වූ අප්‍රමාණ කුසල් සම්භාරය රැස් කර ගැනීමට පිහිට වූ, සංසාරය පුරාවට මා හට මවුපිය-සහෝදර-ස්වාමි භාර්යා-දූ දරු-ඥාති මිත්‍ර-විරුද්ධ වාදීන්-ලෙස වෙමින් සිටි සියලුම දෙනාහට මගේ ගෞරවණීය ප්‍රණාමය සමග පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

පෙර අතීත ජීවිත තුලදී මා විසින් වඩවා ගනු ලැබුවා වූ අප්‍රමාණ කුසල් සම්භාරය හේතුවෙන් බුදුන් දැකගැනීමට තරම් පින්වන්ත වූ මේ උතුම් මනුෂ්‍යය ජීවිතයේ මෙලොව එළිය මුලින්ම දුටු භූමිය වන
ශ්‍රී ලංකාවේ ගෞරවණීය නගරයක් වන මගේ ජන්ම භූමියට ප්‍රණාමය පුද කරන්නෙමි!

එමෙන්ම බහුතර නීතිගරුක මහජන කැමැත්තට මුල්තැන දීම, ලොකු-කුඩා-උස්-පහත් සැමට නීතිය එකසේ බල පැවැත්වීම, සැම නීතිගරුක රට වැසියෙකුටම තමන්ගේ කැමැත්තට අනුව නිදහසේ ජීවත්වීමට හැකිවීම, එකිනෙකා කෙරෙහි ගෞරව කිරීම, එකිනෙකාගේ විවිධ ඇදහිලි සහ විශ්වාසයන් සඳහා ඒ ඔවුන්ට අයිතියක් ඇති බව පිළිගැනීම, යන ඉතා උසස් වටිනාකම් සහ ආචාර ධර්ම වලින් පාලනය වන රටක මගේ ජීවිතයේ පසු භාගය හෝ ගත කිරීමට මා හට අවස්ථාව ලැබුනේත්,
පෙර අතීත ජීවිත තුලදී මා විසින්
වඩවා ගනු ලැබුවා වූ අප්‍රමාණ කුසල් සම්භාරය හේතුවෙන් බව මම විශ්වාස කරමි.
එවැනි පරිසරයක වාසය කරමින් මා ඇසූ දුටු දේවල් අනුව,
බුදුන් වදාළ ආකාරයේ යහපත් මනුෂ්‍යයෙකු වන්නේ කෙසේදැයි ඉතාමත් නිවැරදිව ඉතාමත් පැහැදිලිව ප්‍රායෝගිකව අවබෝධ කරගැනීමට අවස්ථාව මට උදාවිණි.
ඒ නිසාම මගේ අප්‍රමාණ ගෞරවය මේ රාජ්‍යය වෙතද පුද කරන්නෙමි!

පොත ලියන සංකල්පය ඇතිවී, ලිවීම ආරම්භ කර, මෙහි ඇතුලත් පද 423 සිංහලට
පරිවර්තනය කරමින්, මගේ පරමාර්ථයට අනුව සියලු කාර්යයන් සම්පූර්ණ කරගැනීමට
දෙවියන් විසින් මට ලබා දුන්නා වූ උපකාරය වෙනුවෙන්,
ඒ සියලු දෙවියන්ටද පින් අනුමෝදනා සිදු කරන්නෙමි!

මේ ධර්ම පුස්තක බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට සාංඝිකව පූජා කරගැනීමට පිහිට
වෙමින්, අප වෙත කරුණාවෙන් නිවසට වැඩම කල
පූජණීය සංඝ රත්නය ඇතුළු අනිකුත් සියලු අතීත-වර්තමාන-අනාගත
ශ්‍රාවක මහා සංඝ රත්නයට මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

මා හට චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කර ගැනීමට උපකාර කළ
පූජ්‍ය අජාන් චා ස්වාමීන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ වන
පූජ්‍ය අජාන් සුමේදෝ ස්වාමීන් වහන්සේට
මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

මා හට මුලින්ම හමුවූ සිල්වත් සංඝරත්නය වන
පූජ්‍ය කපුදූවේ සිරි ගුණාලංකාර ස්වාමීන් වහන්සේට
මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

1990 මුල් භාගයේදී බුදුන් වහන්සේගේ සත්‍ය වූ ධර්මය සෙවීමට මා හට උනන්දුවක්
ඇතිවීමට මග පෙහෙළි කල රාහුල හාමුදුරුවන්ගේ චරිතය ඇතුළත්
'අරලිය මල් ආරාමය' නවකතාව ලියූ ජයසේන ජයකොඩි මහතාට
මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

පොත් පත් ලියමින්, නොයෙකුත් පර්යේෂණයන්හි යෙදෙමින්, දැනුම බෙදා හදා ගන්නා
ස්වාමීන් වහන්සේලා ඇතුලු සියලු දෙනාට මෙන්ම
මා හට මේ පොත සකස් කිරීම සඳහා පිහිට වූ ඉහත මා සඳහන් කල සියලු දෙනාටත්, ඒ
නවීන තාක්ෂණය සහ ඒ ඒ මාධ්‍යයන් ලෝකයට හඳුන්වා දුන් සියලු දෙනාටත්,
ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

එසේම මගේ මේ ජීවිතය පවත්වාගෙන යාම සඳහා දායක වෙන
කම්කරු-රියදුරු-ගොවි-සෞඛ්‍යය-වෙළඳ-ආරක්ෂක-පාලක-නීති-ගුරු- සන්නිවේදන-
ගමනාගමන-තාක්ෂණය-යනාදී සියලුම ක්ෂේත්‍ර වල සිටින සියලු දෙනාටමත්,
මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

එසේම මේ ලෝකයේ සමබර තාවය පැවැත්වීමට දායකව සිටින සියලුම හොඳ-නරක,
ලොකු-කුඩා, සුදන-දුදන, දුප්පත්-පොහොසත්, රෝගී-නිරෝගී, මිතුරු-සතුරු,
ශිලාචාර-වනචර යන ආදී සියලු දෙනාටමත්
මම ගෞරව පූර්වකව පුණ්‍යානුමෝදනා සිදු කරන්නෙමි!

එයට හේතුව නම්, සිහිය එළඹවාගෙන ජීවත් වන ඕනෑම කෙනෙකුට වැටහෙනවා,
"ඒ සියලු දෙනාම දේවදූතයන් ලෙස පෙනී සිටිමින්, අප්‍රමාදව
නිවණ සාක්ෂාත් කරගැනීමේ වටිනා කම අපට පෙන්වා දෙන බව".

ඇයි මම මගේ දෙමව්පියන්ගේ ප්‍රාර්ථනාවන් සහ අධිෂ්ඨානයන් ඔවුන්ගේම අත් අකුරින් ලියවා ගෙන, මේ පොතට ඇමිණීම සිදුකලේ?

මට අවශ්‍ය වුනා, ලෞකික ලෝකයේ සියලු බැඳීම් වලට හසුවී, ගැටගැසී සිටින, මා මෙලොවට බිහි කල මගේ දෙමව්පියන්ට, ඒ බැඳීම් වල ආදීනව අවබෝධ කරගෙන ඒ උපාදානයන්ගෙන් මිදුන හොත්, 'නිවණ' යනු තමන්ට මේ දැන් මේ මොහොතේම අත්විඳිය හැකි සංසිඳීමක් බව ඔවුන්ගේ ලේ තුලට කාවැද්දවීමට.
ඒ ලියන මොහොතේ සිට ඒ වැකි දකින වාරයක් පාසා ඔවුන් තුල ඇතිවිය හැකි විශේෂයෙන් සකස් කරගන්නා සිත් හෙවත් ඉන්ද්‍රිය බද්ධ විඥ්ඤාන සකස් වෙමින් හට ගැනෙන කුසල-චෛතසිකයන්ට අනුව ඒ මවු පිය දෙදෙනාගේ නාම රූපයන්, සකස් වෙනවා යයි, පටිච්ච සමුප්පාදයට අනුව මම විශ්වාස කරනවා.
ඔවුන් සසරට ඇලී ඇතිකරගෙන සිටින බැඳීම් වල භයානක බව අවබෝධකරගෙන අධිෂ්ඨානශීලීව වීර්යයෙන් කටයුතු කිරීමට, ඔවුන් තුල චෛතසික පහල වීම සඳහා මා විසින් මේ ධර්ම පුස්තක සම්පාදනය කරමින් සිදු කරගන්නා කුසල කර්මය හේතුවේවා! යයි මම අධිෂ්ඨාන කරමි.

"ද්වින්නාහං භික්ඛවෙ! න සුප්පතිකාරං වදාමි, මාතුච්ච පිතුච්ච"
"මහණෙනි, ඔබලාට මේ ලෝකයේදී ගෙවීමට ඇති ණයෙන් එක්තරා දෙදෙනෙකුට පමණක් ගෙවීමට ඇති ණය කිසිදා ගෙවා දමා නිදහස් වීමට පහසු නොවන්නේය. ඒ දෙදෙනා වන්නේ, මනුෂ්‍යයෙකු වශයෙන් ප්‍රතිසන්ධියක් ලබා ගැනීමට කුසල් රැස්කර ගත් ඔබට මෙලොව එළිය දැකීමට පිහිට වූ ඔබේ දෙමව්පියන්ය".

තවදුරටත් උන්වහන්සේ මෙසේ පහදා දුන් සේක".
"යම් කිසි කෙනෙක් තම දෙමව්පියන්ට ඇති ණයෙන් නිදහස් වෙමි'යි අරමුණු ඇතිව, මව දකුණු උරය උඩත්, පියා වම් උරය උඩත්. තබා ගෙන එම දෙදෙනාව නාවමින්- කවමින්-පොවමින් ඔවුන්ගේ සියලු කැත කුණු අස් කරමින් පිරිසිදු කරමින්, අවුරුදු සියයක් පුරා උපස්ථාන කළේ වී නමුදු, ඔහුට ඒ ණයෙන් නිදහස් විය නොහැක්කේය.
එලෙසම කෙනෙක් මුළු සතර මහාද්වීපයම (කරුණාකර සලකන්න – මෙයින් අදහස් කරනු ලැබ ඇත්තේ බුදුන් දවස මේ ලෝකයේ තිබී ඇත්තේ මහාද්වීප හතරක් පමණක් විය හැකි බවයි.) සත්රුවනින් පුරවා, එම රාජ්‍යයේ සක්විති රජකම තනතුරට තම දෙමව්පියන් පත්කර ඔවුන්ට පූජා සත්කාර කරන්නේද, එයද ඒ මව්පිය දෙදෙනාට කරන නිසි උපකාරයක් නොවන්නේය", යනුවෙන්.

2024 මාර්තු 05 දින විශේෂ සිහිපත් කිරීමක් එක්කිරීමකි.

අප විසින් පළමුවෙන්ම නිල වශයෙන් මෙම ධර්ම පුස්තක මුද්‍රණය කරවා එම පුස්තක ඉතාමත් ගෞරවණීය ආකාරයට ධර්ම දානය සිදුකළ යුතු යයි මා තුල පිහිටුවාගෙන සිටි අධිෂ්ඨානයට අනුවම, උතුම් පින් කෙතක් බඳු වන ගෞරවණීය මහා සංඝ රත්නයට පූජා කිරීමේ ධර්ම දානය සිදුකරන්නට සුදානම් වූ අවස්ථාවේ පලමු පුස්තකය 2024 ජනවාරි මස 19 දින හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී මහා සංඝරත්නයට පිළිගැන්වීම සිදුවීමත්,
ඉන් පසු ලොවුතුරා බුදුන් වහන්සේ ලෙසින් වැඳුම් පිදුම් වලට පාත්‍ර වන ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෙතිස් මහා පල රුක් බෝධීන් වහන්සේලාගෙන් එක් නමක් වැඩ වාසය කරන වැලිගම අග්‍ර බෝධි රාජමහා විහාරස්ථානේදී, හැට නමකට ආසන්න මහා සංඝරත්නයට පූජා කිරීම සිදුවීමත්, ඉතාමත් අනපේක්ෂිත ආකාරයට අප වෙත සූදානම් කරනු ලැබුවේ දෙවියන් විසින් බව මම තරයේ විශ්වාස කරමි.

ඒ අග්‍ර බෝධි රාජමහා විහාරස්ථානයේ පැවැත්වුණු උතුම් පිංකමට සහභාගී වූ මගේ පියා බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔද වැඩී සිටිනු දැකීමට ලැබීම මගේ ජීවිතයේ මා ලැබූ වටිනාම ආධ්‍යාත්මික ලාභයයි. එදා මගේ පියා කඳුළු පිරි දෙනෙත් ඇතිව මට පැවසුවේ තමන්ට මෙවැනි වටිනා අවස්ථාවක් උදාවේවි යයි කිසිදා නොසිතු බවයි.
(අවුරුදු 90 ඉක්වමවූ අපේ පියා විසින් මේ පොත් තුනම නිල මුද්‍රණයට පෙර දෙවරක් පමණ කියවා තිබුනා සේම මා සමග ඒ පිළිබඳ සතුටින් ඇගයීම්ද කරණු ලැබුවා. පිරුවානා පොත් වහන්සේ තුල අන්තර්ගත පිරිත් සූත්‍ර වලට අමතරව, මා විසින් සකස් කරන ලද '**අති පූජණීය පිරිත් පොත් වහන්සේ**' පුස්තකයට ඇතුලත් කරන ලද පිරිත් සූත්‍රද මා සමග සජ්ජායනා කිරීමටද මගේ පියාට හොඳින්ම හැකියාව තිබුනා.)
උත්සවයට සහභාගි වී නිවසට පැමිණ පැය 24ක් වත් ගිහි ගෙදර ගත නොකර අසනීප වූ අපේ පියා රෝහල් ගත කිරීමෙන් සත් දිනකට පසු, මෙලොව ගතකල ජාති-ජරා-ව්‍යාධි-මරණ වලින් පිරුණු ජීවිතය කෙලවර කර අදට මාසයකට ඉහතදී 2024 පෙබරවාරි 05 දින අපහට සමුදී පිරිත් ගංගාවක් මැදින් පාවී ගොස්, නිවන නමැති සදාකාලික සුවයට පිවිසෙන දොරටුවෙන් ඇතුළු වුනා.

අපගේ පියාණන් වහන්සේ 2024 ජනවාරි මස 27 දින ඉහත සඳහන් කළ ධර්ම දානය සිදුකල මොහොතේදී සසරට ඇලී තිබූ ප්‍රධාන සංයෝජන 10 න් අවම වශයෙන් මුල් බැඳීම් 03 හෝ ප්‍රහාණය වූ නිසා මෙලොව ජීවිතය අත්හල බව මගේ අවබෝධයයි.

ඒ අනුව මගේ ඉහත සඳහන් කළ අධිෂ්ඨානය මෙන්ම මගේ පියාගේ ප්‍රාර්ථනය වන නිවන් සුවයෙන් සුවපත් වීමද සඵල වූ බව මම විශ්වාස කරනවා.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

මම උපතින් බෞද්ධයෙක් වුවත් බුදුන් වහන්සේගේ නියම බුදු ගුණ දැන සිටියේ නැත. කෙසේ වුවත් පන්සලේ සාදන් වෙමින් බුදු ගුණ සිහිකර වන්දනා මාන කරමින් ධර්ම දේශනාවලට සවන් දෙමින් පුර පෝයවල අට සිල් සමාදන් වෙමින් භාවනා වල යෙදෙමින් සිටින මම බුදුන්වහන්සේගේ බුදු ගුණයන් පැහැදිලිව අවබෝධ කර ගනිමින් උන්වහන්සේගේ ධර්මය පිළිපැදිය යුතු බව වටහා ගත් නිසා එසේ කිරීමට අධිෂ්ඨාන කර ගත්තෙමි. මගේ එකම ප්‍රාර්ථනාව චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගෙන හැකි ඉක්මනින් නිර්වාණ සම්පත්තිය ලබා ගැනීමයි.

මව

මා උපතිං බෞද්ධයෙක්ව, කුඩා කල සිට බෞද්ධ පරිසරයක හැදුන වැඩුන මා යහපත් මිනිසෙක් ලෙස ජීවිතය ගෙන ගියද බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම් අනුව බලන විට අපි මහා මුලාවක පැටලී දඟලන අසරණ මිනිසුන් බව වැටහී ඇත.

ඒ නිසා මාගේ එකම ප්‍රාර්ථනාවත් අධිෂ්ඨානයත් වන්නේ තුං දොර ධර්මානුකූලව ආරක්ෂා කරමින් සිල්වත් උපාසකයෙක් ලෙසට චතුරාර්ය සත්‍ය අවබෝධයෙන් නිවන් සුවයෙන් සුව පත් වීමයි.

— පියා

"සෙය්‍යථාපි පහාරාද, මහාසමුද්දො බහුරතනො අනෙකරතනො-
තත්‍රිමානි රතනානි සෙය්‍යථීදං?
මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං
ලොහිතඞ්කො මසාරගල්ලං.
එවමෙවං ඛො පහාරාද, අයං ධම්මවිනයො බහුරතනො අනෙකරතනො-
තත්‍රිමානි රතනානි සෙය්‍යථීදං?
චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා,
පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි,
සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො.
අයං පහාරාද, ඉමස්මිං ධම්මවිනයෙ සත්තමො අච්ඡරියො අබ්භුතො ධම්මො,
යං දිස්වා දිස්වා භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ අභිරමන්ති".

"පහාරාද, එසේ මහා සමුද්‍රයේ බොහෝ වූ වටිනා මුතු මැණික්,
නා නා විධ වූ මුතු මැණික් තියනවා.
එහි ඇති මුතු මැණික් නම් කවරේද?
මුතු, මැණික්, වෛරෝඩි ගල්, සක් බෙල්ලන්, වටිනා ගල් වර්ග,
පබළු, රිදී, රන්, රතු මැණික්,
වැනි වූ නානාප්‍රකාර බොහෝ වටිනා මුතු මැණික්ය.
ඒ ආකාරයටම පහාරාද, මේ ශාසනයේද බොහෝ වටිනා නානාප්‍රකාර
රත්නයන් ඇත්තේය.
එහි ඇති රත්නයන් නම් කවරේද?
සතර සතිපට්ඨානය, සතර සම්මප්පධාන, සතර ඉර්ධි පාද,
පඤ්චෙන්ද්‍රියය, පඤ්ච බල,
සත්ත බොජ්ඣංග, ආර්ය අෂ්ඨාංගික මාර්ගය
නම් බොහෝ වටිනා රත්නයන්ය.
පහාරාද, මේ සත්වන ආශ්චර්යමත් අද්භූත වන ගුණාංගය දැක දැක තමයි,
භික්ෂූන් මේ ශාසනයේ සතුටින් වාසය කරන්නේ".

පහාරාද සූත්‍රය- මහා වග්ගය- අට්ඨක නිපාතය- අංගුත්තර නිකාය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තථාගත ගෞතම බුදු පියාණන් වහන්ස, 'ධර්මය විවෘර්ත වූ විටයි බබළන්නේ'
යනුවෙන් ඔබ වහන්සේ පෙන්වා දුන් උපදේශයට අනුව
සූත්‍ර පිටකයේ සූත්‍ර තිස් හතක්ද, සතිපට්ඨාන භාවනාව සිදුකරන ආකාරයද, ඇතුලත්ව
මගේ ධර්ම අවබෝධය තුලින්, දෙවියන්ගේ උපකාරයද ඇතිව, අපි
"අති පූජණීය පිරිත් පොත් වහන්සේ - සම්මා දිට්ඨියෙන් නිවන් මගට" සහ
සතිපට්ඨාන භාවනාව ධර්ම පුස්තකද, සිංහල අර්ථය සහිත ධම්ම පදය පුස්තකයද
මෙන්ම ඒවායේ ඉංග්‍රීසි භාෂා පරිවර්ථන පුස්තකද සකස් කලෙමු.

මගේ බාලම සොහොයුරියත්, මගේ දියණියත්, මගේ විවාහ සහකරුත්, සතිපට්ඨාන
භාවනාව ග්‍රන්ථ කිරීමට මාව උනන්දු කල මගේ ශ්‍රී ලාංකික මිතුරියත්, විසින් පාඨකයන්
ලෙස පොත කියවමින්, අදහස් දක්වමින් තව තවත් අර්ථවත් ආකාරයට ධර්මය
පැහැදිලි කර ඉදිරිපත් කිරීමට මා හට ලබා දුන් උපකාරය,
ඒ ඔවුන් විසින්, ඔබ වහන්සේට දැක්වූ අප්‍රමාණ වූ ගෞරවය බව සිහිපත් කරන්නෙමි.

අවිද්‍යාව නමැති අන්ධකාරයේ තොර තෝංචියක් නැති
දුක්ඛ දෝමනස්ස-හැලහැප්පීම්-මානසික පීඩා වලින් හෙම්බත් වී සිටි
අපගේ ජීවිතයට ආලෝකයක් ලබාදුන්, සැනසීමක් ලබාදුන්,
ස්වාක්ඛාත වන චතුරාර්ය සත්‍ය ධර්මය අප හට දැනගන්නට සැලැස්වූ
සම්මා සම්බුද්ධ වූ ගෞතම බුදු පියාණන් වහන්ස ඔබ වහන්සේට
අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!
ශ්‍රේෂ්ඨ උත්තමයාණෙනි,
ඔබ වහන්සේට අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!

ගෞතම බුදු පියාණන් වහන්ස, ඔබ වහන්සේව දැක ගන්නට අප හට සැලැස්වූ
ඔබ වහන්සේ විසින් දේශනා කල සාන්දෘෂ්ඨික වන ශ්‍රී සද්ධර්මයට
අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!
ඒ උතුම් වූ අකාලික වන චතුරාර්ය සත්‍ය ධර්මයට
අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!

ගෞතම බුදු පියාණන් වහන්ස, ඔබ වහන්සේ විසින් දේශනා කල
චතුරාර්ය සත්‍ය ධර්මය අප හට දැනගැනීමට හැකිවන සේ පවත්වාගෙන ආ
ඔබ වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නයට
අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!
ඒ සුපටිපන්න වන, උජුපටිපන්න වන, ඤායපටිපන්න වන, සාමීචිපටිපන්න වන,
ඔබ වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නයට
අපි නමස්කාර කරන්නෙමු! නමස්කාර වේවා!

ඔබ වහන්සේගේ සරණ ගිය
යූ. එච්. විජේතුංග, එස්. ඩී. විජේතුංග, ඩී. කේ. විජේතුංග, අයි. විජේතුංග, අයි. ද සිල්වා

මේ පොත එළිදැක්වීමේ අරමුණ වන්නේ, තවත් එක් අයෙකුට හෝ බුදුන් දැකීමට යායුතු මාර්ගය පෙන්වා දීමටයි. ඒ නිසා මේ සඳහා කිසිවෙකුගෙන් ආධාරයක් හෝ අරමුදලක් හෝ අප විසින් අපේක්ෂා නොකරන්නෙමු. වෙළඳ දැන්වීම් පළකිරීම් මගින් හෝ වෙනත් මොනයම් මාර්ගයකින් හෝ බුදුන් වහන්සේගේ ධර්මය විකුණමින් මුදල් ඉපයීම, බුදුන් වහන්සේට කරන අගෞරවයක් සේම, සතර අපාගත වීමට සිදුවන බලවත් අකුසල කර්මයකි. ඒ නිසා මේ පොත මගින් පලකරන කිසිදු ධර්ම කරුණක් තුලින් මුදල් ඉපයීම කිසිවෙකු විසින් හෝ සිදු නොකළ යුතුයි.

ගෞතම තථාගතයන් වහන්සේ ඉතාමත් පිළිවෙලට, පියවරෙන් පියවර, පැහැදිලි ලෙස මහා සතිපට්ඨාන සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී තිබෙන බුදුන් සරණ යාමට බලාපොරොත්තු වන ශ්‍රාවකයෙකු විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපදාව, මේ සක්වලයන්හි ඇති නාග ලෝක, දිව්‍ය ලෝක හා මනුස්ස ලෝකයන්හි ඇති සියලුම වටිනාම දේ එක්කොට ගන්නවාටත් වඩා වටිනා බව ඔබට දැනගැනීමට නම් අඩුම වශයෙන් ඔබ කායානුපස්සනාව වත් නිවැරදිව පුහුණු කරමින් ඔබේ කයේ යථා ස්වභාවය නුවණින් අවබෝධ කරගත යුතුයි.
ඒ සඳහා මා විසින් සම්පාදනය කර ඇති සතිපට්ඨාන භාවනාව පොත පරිශීලනය කරන්න.

ඒ අවබෝධය ලබාගන්නා ඔබට බුදුන් දකින්න, ධර්මය දකින්න, පුළුවන් වෙන බව ඒකාන්ත සත්‍යයක්.
එසේ යමෙක් බුදුන් දැක්කොත්, ධර්මය දැක්කොත්,

- ඒ ඔහුට පුළුවන් වෙනවා, නිවැරදිව බුද්ධානුස්සති භාවනාව වඩන්න.
- ඒ ඔහුට පුළුවන් වෙනවා, නිවැරදිව මෛත්‍රී භාවනාව වඩන්න.
- ඒ ඔහුට පුළුවන් වෙනවා, 'උදය-වැය' නම් ද්වතානුස්සති භාවනාව වඩන්න.

- ඒ ඔහුට පුළුවන් වෙනවා, ඔහු තුල ඇති අකුසල් හඳුනාගන්න.
- ඒ ඔහුට පුළුවන් වෙනවා, ඔහු තුල ඇති අවිද්‍යාව හඳුනාගන්න.
- ඒ ඔහුට පුළුවන් වෙනවා, තමන් කවුද කියා හඳුනා ගන්න.

- ඒ ඔහු පෙනෙන හෝ නොපෙනෙන හෝ කිසිම සත්වයෙකුට හිංසා පීඩා කරන්නේ නැහැ, බුදුන් වහන්සේට ඇති අප්‍රමාණ ගෞරවයත්, පවට ඇති ලැජ්ජාවත් නිසා.
- ඒ ඔහු කිසිදා බුදුන්ගේ නම තමන්ගේ ලෞකික ප්‍රයෝජනය සඳහා යොදවා ගන්නේ නැහැ, බුදුන් වහන්සේට ඇති අප්‍රමාණ ගෞරවයත්, පවට ඇති ලැජ්ජාවත් නිසා.
- ඒ ඔහු කිසිදා බුදුන්ගේ ධර්මයට මිලක් නියම කිරීම හෝ ඒ ධර්මය විකුණා මුදල් ඉපයීම සඳහා හෝ ඒ ධර්මය ලෞකික ලාභ අපේක්ෂාවන් සඳහා හෝ යොදවා ගන්නේ නැහැ, බුදුන් වහන්සේට ඇති අප්‍රමාණ ගෞරවයත්, පවට ඇති ලැජ්ජාවත් නිසා.

"උක්ඛිත්තා පුඤ්ඤතෙජෙන කාමරූපගතිං ගතා
භවග්ගතම්පි සම්පත්තා පුනාගච්ඡන්ති දුග්ගතිං"

"කරන ලද පින් කම් හේතුකොට ගෙන
දිව්‍ය ලෝක-බ්‍රහ්ම ලෝක වල උපත ලැබුවත්,
ඒ පින් අවසන් වූ කල්හි නටුවෙන් ගිලිහුණු ගෙඩියක් සේ
නැවතත් දුගතියටම පමුණුවනවා"

"බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති"

යමෙක් බොහෝ ධර්මය ඉගන ගෙන ඒ ධර්මයට අනුව පිළිපැදීමෙන්
තොරව ඒවා අනුන් ඉදිරියේ කියමින් අනුන්ට උගන්වමින් පමණක්,
තමන්ට ලැබුණු වටිනා මනුෂ්‍ය ජීවිතය
සිහි නුවණින් තොරව හිස් ආකාරයෙන් ගත කරන්නේ නම්,
ඒ දුර්ලභව ලැබුනු මනුෂ්‍ය ජීවිතයේ ලැබිය හැකි
සෝවාන් ආදී මාර්ග ඵලයන්හි කොටස් කරුවෙක් විය නොහැකිව
තමන් විසින්ම තමන්ගේ ජීවිතය විනාශය කරා පමුණුවා ගනු ලබන්නේය.

"අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගං ච දොසං ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්ත චිත්තො
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති"

නමුත් යමෙක් සුළු ධර්ම කොටසක් හෝ
නිවැරදිව නුවණින් අවබෝධකර ගෙන ඒ ධර්මයට අනුව පිළිපදිමින්,
'මමය-මගේය-මගේ ආත්මය' ලෙස තම කය හෝ සිත හෝ
තෘෂ්ණා-දෘෂ්ඨි-මාන වශයෙන් නොගෙන තමන් තුළ පවතින
රාග-ද්වේෂ-මෝහ දුරු කර තමන්ගේ සිත පිරිසිදු කරගන්නේ නම්
මෙලොවදීත් පරලොවදීත් ශෝක නොකරන
සෝවාන් ආදී මාර්ග ඵලයන්හි කොටස් කරුවෙක් වන්නේය.

පටුන

පිටු අංක	වග්ගය
001-005	යමක වග්ගය
006-008	අප්පමාද වග්ගය
009-011	චිත්ත වග්ගය
012-015	පුෂ්ප වග්ගය
016-019	බාල වග්ගය
020-023	පණ්ඩිත වග්ගය
024-026	අරහද් වග්ගය
027-037	බ්‍රාහ්මණ වග්ගය
038--041	සහස්‍ර වග්ගය
042-045	පාප වග්ගය
046-048	සුබ වග්ගය
049-053	දණ්ඩ වග්ගය
054-056	ජරා වග්ගය
057-059	අත්ත වග්ගය
060-063	ලෝක වග්ගය
064-067	බුද්ධ වග්ගය
068-070	ප්‍රිය වග්ගය
071-073	ක්‍රොධ වග්ගය
074-078	මල වග්ගය
079-082	ධර්මස්ථ වග්ගය
083-087	භික්ෂු වග්ගය
088-091	ප්‍රකිර්ණක වග්ගය
092-094	නිරය වග්ගය
095-098	නාග වග්ගය
099-104	තෘෂ්ණා වග්ගය
105-109	මාර්ග වග්ගය
110	පිං පැමිණවීම
111	අවසන් කිරීම

1.යමක වර්ගය

1.ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව චක්ඛුපාල ස්ථවිරයන් වහන්සේ

මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති, චක්කං’ව වහතො පදං

සිත මුල්වී සිතෙන් හටගන්නා සිතිවිලි වල ස්වභාවය අනුව තමයි,
කෙනෙකුට ශ්‍රේෂ්ඨ වූ සිතක් ඇතිවන්නේ.
ඉදින් ඒ සිත ඉතා දූෂ්‍ය වුවහොත් කරන හෝ කියන හෝ දේ ද දූෂ්‍ය වෙනවා.
එතැන් පටන් ඒ ඔහු පසු පස ස්ථිරවම අසහනය පීඩාව දුක ලුහු බැඳ එන්නේ,
කරත්තයේ බර උසුලන ගොනා අනුවම කැරකෙන කරත්ත රෝදය මෙනි.

2.මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා

මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති ඡායා’ව අනපායිනී

සිත මුල්වී සිතෙන් හටගන්නා සිතිවිලි වල ස්වභාවය අනුව තමයි, කෙනෙකුට ශ්‍රේෂ්ඨ වූ සිතක් ඇතිවන්නේ.
ඉදින් ඒ සිත ප්‍රසන්න වුවහොත් කරන හෝ කියන හෝ දේ ද ප්‍රසන්න වෙනවා.
එතැන් පටන් ඒ ඔහු පසු පස ස්ථිරවම සැප ලුහු බැඳ එන්නේ
තමන්ටත් නොදැනෙන සේ තමන් පසුපස එන තමන්ගේ සෙවනැල්ල මෙනි.

3.ථුල්ලතිස්ස තෙර

අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ ච තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති

අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති

“*මට නින්දා කළේය, මට එය අහිමි කළේය, මගේ දේ දිනුවේය, අනේ මට මෙවැන්නක් සිදුවුනේය*”,
එලෙස නිතර සිතමින් ඇතිකරගන්නා බද්ධ වෛරය නිසා ඔහුගේ වෛරය කිසිදා නොසංසිඳේ.

"*මට නින්දා කළේය, මට එය අහිමි කළේය, මගේ දේ දිනුවේය, අනේ මට මෙවැන්නක් සිදුවුනේය*",
එලෙස නොසිතමින් සිත නිදහස් කරගන්නේ නම් වෛරය සංසිඳේ.

4.<u>කාළී යකින්න</u>

න හි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො

වෛරයට වෛර කිරීම, කිසිකලෙක වත් ලෝකයේ පිළිගත් සම්මතයක් වුනේ නැහැ.
පුරාණයේ සිට නොනැසී සම්මතයක් වූයේ වෛරයක් සංසිඳවිය යුතු වන්නේ අවෛරිවීමෙන්ම බවයි.

5.<u>ඝෝෂිතාරාමයෙහි කෝලාහලය</u>

පරෙ ච න විජානන්ති මයමෙත්‍ථ යමාමසෙ
යෙ ච තත්‍ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා

අනුන් සමග ඇති කරගන්නා මතභේදයන් නිසා තමන්ටද නිත්‍ය වශයෙන්ම විනාශයක් අත්වෙන බව දන්නේ නැහැ.
ඒ ගැන නුවණින් අවබෝධ කරගත් තැන් පටන් ඇතිවන මතභේදයන් එක්ව සාකච්ඡා කරමින් විසඳා ගනිමින් සංසිඳීමට පත්වෙනවා.

6.<u>චූලකාල මහාකාල තෙරුන්</u>

සුභානුපස්සිං විහරන්තං ඉන්‍ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි චාමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං
තං වෙ පසහති මාරො වාතො රුක්ඛං'ව දුබ්බලං

අසුභානුපස්සිං විහරන්තං ඉන්‍ද්‍රියෙසු සුසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං
තං වෙ නප්පසහති මාරො වාතො සෙලං'ව පබ්බතං

ඉන්ද්‍රියයන් සංවර කර නොගැනීම නිසා සැපයි-සුභයි ලෙස සිතමින් පංචේන්ද්‍රියන් පිනවමින්, ප්‍රමාණය ඉක්මවමින් කෑම ගැනීම නිසා අලස වෙමින්, තමන්ගේ හිත සුව පිණිස සිත-කය වෙහෙසා කටයුතු කරගැනීමට උත්සාහවත් නොවෙමින් වාසය කරන කෙනා, දුර්වල ගසක් හුළඟකින් මැඩ ගන්නා සේ, ඒකාන්තයෙන්ම මාරයා විසින් මැඩගනී.

ලෞකික ලෝකයේ ඇති අනිච්ච-දුක්ඛ-අනත්ත ස්වභාවය ගැන අවබෝධයෙන් කලකිරී ඉන්ද්‍රියයන් සංවර කර ගනිමින්, ප්‍රමාණය දැන ආහාරය ගෙන විශ්වාසයක් ඇතිව නොපසුබට උත්සාහයෙන් තමන්ගේ හිත සුව පිණිස කටයුතු කරන කෙනාව, මහා සුළඟකට වත් සෙලවිය නොහැකි ගල් පර්වතයක් සේ, ඒකාන්තයෙන්ම මාරයාට මැඩගැනීමට නොහැකි වන්නේය.

7.<u>දේවදත්ත ථෙර</u>

අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති

යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති

පඬුපොවන ලද වස්ත්‍රයක් හැඳගත් රාග ද්වේශාදී කෙලෙස් වලින් තොර නොවූ කෙනා චතුරාර්ය සත්‍ය අවබෝධය සඳහා තම ඉන්ද්‍රියයන් දමනය කිරීම නොකරන්නේ නම්, ඒ ඔහු කසාවත් දැරීමට සුදුසු වන්නේ නැහැ.

කය වචනය සංවර කරගත් දුරු කළ රාග ද්වේශාදී කෙලෙස් සහිත මනාව සංසිඳුණු කෙනා චතුරාර්ය සත්‍ය අවබෝධය සඳහා තම ඉන්ද්‍රියයන් දමනය කිරීම නිසා කසාවත් දැරීමට ඒකාන්තයෙන්ම සුදුසු වන්නේය.

8.<u>අග්‍ර ශ්‍රාවක මහා ක්ෂීණාශ්‍රව ශාරීපුත්‍ර මෞද්ගල්‍යායන මහාස්ථවිරයන් වහන්සේලා</u>

අසාරෙ සාරමතිනො සාරෙ චාසාරදස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසංකප්පගොචරා

සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසඞ්කප්පගොචරා

අයහපත් දේ යහපත් ලෙසත්, යහපත් දේ අයහපත් ලෙසත් හඳුනාගන්නා වැරදි සිතිවිලි වලින් යුතු කෙනා, නිවැරදි අවබෝධයට පැමිණෙන්නේ නැහැ.

යහපත් දේ යහපත් ලෙසත්, අයහපත් දේ අයහපත් ලෙසත් දන්නා කෙනා, ඒ නිවැරදි සිතිවිලි නිසා නිවැරදි අවබෝධයට පැමිණෙනවා.

9.<u>නන්ද මහා ස්ථවිරයන් වහන්සේ</u>

යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති

යථාගාරං සුච්ඡන්නං වුට්ඨී න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති

යම් සේ හොඳින් සෙවිලි නොකළ ගෙයක් තුලට වැසි ජලය ඇතුලට කාන්දු වේද, ඒ ආකාරයට නො වැඩූ සිත තුලට රාගය කිඳා බසී.

යම් සේ හොඳින් සෙවිලි කළ ගෙයක් තුලට වැසි ජලය ඇතුලට කාන්දු නොවේද, ඒ ආකාරයට වැඩූ සිත තුලට රාගය කිඳා බසින්නේ නැත.

10.චුන්ද නම් ඌරු වැද්දාගේ මරහඬ

ඉධ සොචති පෙච්ච සොචති පාපකාරී උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති දිස්වා කම්ම කිලිට්ඨමත්තනො

මෙලොවත් ශෝක කරයි, පරලොවත් ශෝක කරයි, පවු කරන්නා දෙලොවම ශෝක කරයි.
තමා සිදු කළ අපවිත්‍ර ක්‍රියාවල තරම දැක ඔහු ශෝක කරයි, ඔහු වෙහෙසට පත්වෙයි.

11.ධම්මික උපාසක මහතා

ඉධ මොදති පෙච්ච මොදති කතපුඤ්ඤො උභයත්ථ මොදති
සො මොදති සො පමොදති දිස්වා කම්ම විසුද්ධිමත්තනො

මෙලොවත් සතුටින් සිටී, පරලොවත් සතුටින් සිටී, පින් කරන්නා දෙලොවම සතුටින් සිටී.
තමා සිදු කළ යහපත් ක්‍රියාවල තරම දැක ඔහු සතුටු වේ, ප්‍රබෝධමත් වේ.

12.දේවදත්ත ථෙර අවීචියෙහි උපන් සැටි

ඉධ තප්පති පෙච්ච තප්පති පාපකාරී උභයත්ථ තප්පති
පාපං මෙ කතන්ති තප්පති භිය්‍යො තප්පති දුග්ගතිං ගතො

මෙලොවත් තැවේ, පරලොවත් තැවේ, පවු කරන්නා දෙලොවම තැවේ.
පවුකරන්නාට දුක් සහගත මරණයක් අත්වේ, දුගතියට ගිය පසු අධික සේ තැවේ.

13.සුමනා දේවිය

ඉධ නන්දති පෙච්ච නන්දති කතපුඤ්ඤො උභයත්ථ නන්දති
පුඤ්ඤං මෙ කතන්ති නන්දති භිය්‍යො නන්දති සුග්ගතිං ගතො

මෙලොවත් ප්‍රීතියෙන් සිටී, පරලොවත් ප්‍රීතියෙන් සිටී, පින් කරන්නා දෙලොවම ප්‍රීතියෙන් සිටී.
පින් කරන්නාට සැපවත් මරණයක් අත්වේ, සුගතියට ගියපසු අධික සේ සතුටු වේ.

14.<u>**බුදුරජාණන් වහන්සේගේ ස්තූතිය**</u>

බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපො'ව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති

අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්තචිත්තො
අනුපාදියානො ඉධ වා හුරං වා
ස භාගවා සාමඤ්ඤස්ස හොති

යමෙක් බොහෝ ධර්මය ඉගන ගෙන ඒ ධර්මයට අනුව පිළිපැදීමෙන් තොරව, ඒවා අනුන් ඉදිරියේ කියමින් අනුන්ට උගන්වමින් පමණක්, තමන්ට ලැබුණු වටිනා මනුෂ්‍ය ජීවිතය සිහි නුවණින් තොරව හිස් ආකාරයෙන් ගත කරන්නේ නම්, ඒ දුර්ලභව ලැබුණු මනුෂ්‍ය ජීවිතයේදී, සෝවාන් ආදී මාර්ග ඵලයන්හි කොටස් කරුවෙක් වීමට නොහැකිව තමන් විසින්ම තමන්ගේ ජීවිතය විනාශය කරා පමුණුවා ගනු ලබන්නේය.

යමෙක් සුළු ධර්ම කොටසක් හෝ නිවැරදිව නුවණින් අවබෝධකර ගෙන, ඒ ධර්මයට අනුව පිළිපදිමින්, තම කය හෝ සිත හෝ 'මමය-මගේය-මගේ ආත්මය' ලෙස තෘෂ්ණා-දෘෂ්ඨි-මාන වශයෙන් නොගෙන, තමන් තුල පවතින රාග-ද්වේෂ-මෝහ දුරු කර තමන්ගේ සිත පිරිසිදු කරගන්නේ නම්, මෙලොවදීත් පරලොවදීත් ශෝක නොකරන සෝවාන් ආදී මාර්ග ඵලයන්හි කොටස් කරුවෙක් වන්නේය.

2.අප්පමාද වර්ගය

1.සාමාවතී මාගන්දියාදීන්ට සිදුවූ විපත

අප්පමාදො අමතපදං පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා

එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා

තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරං

සිහියෙන් යුතුව විසීම තමයි නිවණට හේතුවෙන්නේ.
සිහියෙන් යුතුව නුවණින් මෙනෙහි නොකිරීම මාරයාගේ යටතට පත් කරවනවා.
පිරිහෙන ක්‍රියාවල යෙදුණු කෙනා මාරයාගේ යටතට පත්වුනත්,
සිහියෙන් යුක්තව වසන කෙනා මාරයාගේ වසඟයට යන්නේ නැහැ.

හැමදෙයක් ගැනම විශේෂ දැනුමක් ඇතිව සිහියෙන් යුතුව වාසය කරන ප්‍රඥාවන්තයා උතුම් අරමුණෙහි සිත් අලවමින් අප්‍රමාදීව සතුටින් වාසය කරන්නේය.

ස්ථිර වූ දැඩි උත්සාහයෙන් නැවත නැවත මෙනෙහි කරමින්, සිත කය වචනයෙන් නිවැරදිව ක්‍රියා කරන ඔහු, කාමාදී බැමි වලින් නිදහස් ව ඉතා උතුම් වන නිවණ සාක්ෂාත් කරන්නේය.

2.කුම්භඝෝසක සිටුතුමා

උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසො' භිවඩ්ඪති

සිහි නුවණින් යුතුව අවබෝධයෙන් යහපත්ව වීර්යයෙන් කටයුතු කරන, ඒ අවබෝධය තුලින් ධාර්මික සේ සිහියෙන් යුක්තව වසන කෙනාට යසස හා අභිවෘද්ධිය පමුණුවයි.

3.චූල පන්ථක මහා ක්ෂීණාශ්‍රවයන් වහන්සේ

උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති

සිහි නුවණින් යුතුව තම ඉන්ද්‍රිය සංවර කර ගනිමින් වීර්යයෙන් කටයුතු කරන පැවැත්ම තමයි, පිහිට වන්නේ ප්‍රඥාවන්තයාට කාමාදී ක්ලේශයන් සිත තුල විසිරීම අභිබවීමට.

4.<u>සැවැත් නුවර නැකත් කෙළියක්</u>

පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං'ව රක්ඛති

මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං

මෝඩ අඥාන ජනයා සිහි නුවණින් තොරව අනුවණින් ක්‍රියා කරත්,
ප්‍රඥාවන්තයා තමන්ගේ සිහි නුවණ ශ්‍රේෂ්ඨ ධනයක් සේ ආරක්ෂා කරයි.

එපා සිහි නුවණින් තොරවන්න, එපා කාමයෙහි ගිජුවී ඇලෙන්න, සිහි නුවණින් යුතුව නැවත නැවත මෙනෙහි කරමින් ක්‍රියා කිරීමෙන් මහත්වූ සැපයකට පැමිණෙන්නේය.

5.<u>මහා කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේ සත්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය බැලීම</u>

පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො'ව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති

ප්‍රඥාවන්තයා සිහි නුවණින් යුතුව ක්‍රියා කරමින් යම් කලෙක අකුසල් දුරු කරන්නේය. ප්‍රඥාවෙන් ප්‍රසන්න භාවයට පත්වී, මෙලොවදී හෝ පරලොවදී ශෝක කිරීමට ඇති හේතු දුරු කළ නිසා ශෝක නොකරන ඒ ප්‍රඥාවන්තයාට, පර්වතයක උඩ සිට බලන විට බිම පහල භූමිය හොඳින් පෙනෙනා සේ, බාලයා ගේ ස්වභාවය හොඳින් දැකිය හැකි වන්නේය.

6.<u>යහළු භික්ෂු දෙනමක්</u>

අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො
අබලස්සං'ව සීඝස්සො හිත්වා යාති සුමෙධසො

බොහෝ සේ නොනිදා සිටිමින් වීර්යයෙන් යුතුව, සිහිය එළඹවාගෙන නුවණින් මෙනෙහි කරන ප්‍රඥාවන්තයා, තමන් වඩවා ගන්නා ප්‍රඥාවෙන්, තමන් තුල යටපත් වී පවා තිබෙන කෙලෙස් බැහැර කරන්නේ, සීග්‍රයෙන් ගසා ගෙන යන ජල පහරක් විසින් සියලු දේ ගසා ගෙන යන වේගවත් විලාශයටයි.

7.සක්දෙව්රජතුමා

අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා

සිහි නුවණින් යුතුව ධර්මය නුවණින් මෙනෙහි කර උතුම් වූ මාර්ග ඵලයට එළඹුණු ශක්‍ර දෙවියන්, සිහි මුලාවෙන් යුතුව ජීවත් වීම ගරහමින්, හැමකල්හිම සිහි නුවණින් යුතුව ජීවත් වීමේ උතුම් බව ප්‍රශංසා කරන්නේය.

8.කන්දක් උඩදී රහත් වූ උතුමෙක්

අප්පමාදරතො භික්ඛු පමාදෙ භය දස්සි වා
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගීව ගච්ඡති

සිහි නුවණින් වාසය කරන භික්ෂුව සුළු වූ හෝ වරදකට බිය වෙනවා.
ඉතා සියුම් හෝ දැඩි හෝ බැඳීම් ගින්නකට උපමා කර එයින් ඉවත් වෙනවා.

9.නිගමතිස්ස ස්ථවිරයන් වහන්සේ

අප්පමාදරතො භික්ඛු පමාදෙ භය දස්සි වා
අභබ්බො පරිහාණාය නිබ්බාණස්සෙව සන්තිකෙ

සිහි නුවණින් වාසය කරන භික්ෂුව සුළු වූ හෝ වරදකට බිය වෙනවා,
එවැනි වූ ඔහු පිරිහීමට ලක් නොවී නිර්වාණයට සමීප වෙනවා.

3.චිත්ත වර්ගය

1.මේඝිය ස්ථවිරයන් වහන්සේ

ඵන්දනං චපලං චිත්තං දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී උසුකාරො’ව තෙජනං

වාරිජො’ව ථලෙ ඛිත්තො ඔකමොකත උබ්භතො
පරිඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ

රාග ද්වේශ නැමැති කාමයන් විසින් යටපත් කරගත් සිත, රැකගැනීමට හෝ නපුරු තත්වයට පත්වීමෙන් වලක්වාගැනීමට හෝ පහසු නොවේ.
ප්‍රඥාවන්තයා සිහි නුවණින් යුතුව ඒ ඒ මොහොතේ සිතට එන අරමුණු නුවණින් මෙනෙහි කරමින් තම සිත උතුම් වූ ස්ථිර අරමුණෙහිම රඳවාගන්නේ,
ඊතල වඩුවෙක් ගින්නෙන් රත්කරමින් ඊතලයක් ඉතා සෘජුව සිටින සේ නිමකරගන්නා විලාශයෙනි.

ජලයෙන් ඉවතට ගෙන ගොඩබිමට දමන ලද මත්සයෙක් ගැහෙමින් සෙලවෙන්නා සේ, කාමයන් කෙරෙහි අල්වා ගත් සිත පවත්වා ගත් කෙනාටද, මාරයා හමුවේදී නිත්‍ය වශයෙන්ම සැලෙමින් කම්පා වීමට සිදුවේ.

2.අප්‍රසිද්ධභික්ෂුවකට සැලකූ ප්‍රසිද්ධ උපාසිකාවක්

දුන්නිග්ගහස්ස ලහුනො යත්ථකාමනිපාතිනො
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං

මැඩ පැවැත්වීමට අපහසු තමන්ගේ සිතෙන්, නොපමාව කාමය ඉවත්කිරීමට කටයුතු කර යම් හෙයකින් ඒ සිත දමනය කරගත් තැන් පටන්, ඒ සිතට එන යහපත් සංසිඳුණු සිතිවිලි නිසා තමන්ට සැපයම අත්වේ.

3.සසුනෙහි නො ඇලුනු මහණෙක්

සුදුද්දසං සුනිපුනං යත්ථකාමනිපාතිනං
චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං

කාමය ඉවත්කිරීමට කටයුතු කරමින් ප්‍රඥාවන්තයා විසින් යම් හෙයකින් නිවණ සඳහා රැකගන්නා වූ සුවිශේෂී වන ඒ සිතට එන හික්මවාගත් සිතිවිලි නිසා ඔහුට සැපයම අත්වේ.

4.<u>**භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේ**</u>

දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා

බොහෝ දේ ගැන සිතමින් පතමින්, තමන් විසින්ම ගොඩනගාගන්නා වූ, එයට රිසි සේ සැඟ වී හැසිරෙන, මේ ආකාරයයි කියා පෙන්වීමට හැඩයක් හෝ රූපයක් හෝ නැති ඒ සිත, එළඹ සිටි සිහියෙන් යුතුව සංවර කර ගත් ඉන්ද්‍රියයන් තුලින් හික්මවා ගනිමින් මාරයාට ඇති බන්ධනයෙන් නිදහස් වෙන්න.

5.<u>**චිත්තහත්ථ ස්ථවිරයන් වහන්සේ**</u>

අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති

අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො
පුඤ්ඤපාපපහීණස්ස නත්ථි ජාගරතො භයං

සත්‍ය ධර්මය අවබෝධ කර නොගැනීම නිසා යහපත් අරමුණක නොපිහිටන ඒ සිත, කෙලෙස් නිසා කම්පාවට පත්වෙමින් සැලෙන නිසා ප්‍රඥාව වඩවා ගැනීමට අසමත් වේ.

කාමාදී ක්ලේශයන්ගෙන් තෙත් නොවූ, නිදි දුරු කරමින් නොනසන ලද වීර්යයත් ඉවසීමත් ඇතිව නිවණ අවබෝධ කරගත් උතුම් කෙනා, පින් පවු දෙකම ප්‍රහීණ කර සියලු භයෙන් මිදෙන්නේය.

6.<u>**පන්සියයක් විදර්ශක භික්ෂූහු**</u>

කුම්භූපමං කායමිමං විදිත්වා නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤායුධෙන ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා

තම ශරීරය මැටියෙන් කළ බඳුනකට උපමා කර එහි ඇති අවදානට ලක්විය හැකි වහා බිඳෙන සුළු අස්ථිර ස්වභාවය අවබෝධ කරගෙන, ඒ කය 'මම' ය යන හැඟීමෙන් තණ්හාවෙන් උපාදානය කර නොගන්න.
තම සිත නොයෙකුත් දෙසින් නොයෙකුත් ආකාරයේ අන්තරාකාරී පුද්ගලයන් ඇතුළුවිය හැකි ඕනෑම මොහොතක අනතුරුවලට ලක්විය හැකි නගරයකට උපමා කර, ඒ සිතට නොයෙකුත් ආකාරයේ නපුරු අහිතකර අරමුණු ඇතුළුවන බව දැනගෙන ඒවායින් මිදීම සඳහා එළඹවා ගත් තම සිහිය, නගර ආරක්ෂකයෙකු සේ යොදවා ගෙන ඒ සිත ආරක්ෂා කරගන්න. ප්‍රඥාව නමැති ආයුධයෙන් මාරයා සමග නොනැවතී සටන් වැදීමෙන් ජයග්‍රහණය අත්වීම සිදුවන්නේය.

7.පූතිගත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ

අචිරං වතයං කායො පඨවිං අධිසෙස්සති
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො නිරත්‍ථං'ව කලිඞ්ගරං

වැඩිකල් නොපවතිමින් මරණයට පත්වී විඥ්ඥානය හෙවත් විශේෂයෙන් අල්ලා ගත් සිත බැහැරට ගිය පසු කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකිව දර කොටයක් සේ ඒ ශරීරය පොලව මත වැතිරෙන්නේය.

8.නන්ද එඬේරා

දිසො දිසං යන්තං කයිරා වෙරී වා පන වෙරිනං
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ

දිසාවෙන් දිසාවට ගිහින් කම්පා වෙමින් හැකිලී සිටියත් සතුරන්ගෙන් හෝ නපුරෙන් ගැලවෙන්න බැහැ.
සිත වරදවා පිහිටුවා ගත් තැන් පටන් තමන්ට පව්ටු විපාකයන් විදීමට සිදුවෙනවා.

9.සොරෙයාා සිටුතුමා

න තං මාතා පිතා කයිරා අඤ්ඤෙ වාපි ච ඤාතකා
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙ

ඒ කවර කම්පා වීමට හේතුවක් වත් මව, පියා හෝ වෙනත් ඥාතියෙක් ද හෝ කරන්නේ නැහැ. තමන් විසින්ම තම සිත යහපත්ව පිහිටුවා ගත් තැන් පටන්, තමන් ශ්‍රේෂ්ඨ බවට පත්වෙනවා.

4.පුෂ්ප වග්ගය

1.පන්සියයක් භික්ෂූන් වහන්සේලා

කො ඉමං පඨවිං විචෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
කො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමිව පචෙස්සති

සෙඛො පඨවිං විචෙස්සති
යමලොකඤ්ච ඉමං සදෙවකං
සෙඛො ධම්මපදං සුදෙසිතං
කුසලො පුප්ඵමිව පචෙස්සති

කවරෙක්ද මේ පෘතුවිය ගැන, යම ලෝකය ගැන,
දෙව් ලොව ගැන හොඳින් කරුණු පරීක්ෂා කර දැනගන්නේ.
මල් මාලා ගොතන්නෙක් මල් එකින් එක අමුණමින් මාලය සාදන්නා සේ,
කවරෙක්ද ශ්‍රී සද්ධර්මය දේශනා කරමින් කුසලයන් වඩවා ගන්නේ.

රහත් මග හැර ඉතිරි මාර්ගඵල ලැබූ පුද්ගලයන් මේ පෘතුවිය ගැනද,
යම ලෝකය ගැනද, දෙව් ලොව ගැනද, හොඳින් කරුණු පරීක්ෂා කර දැනගන්නේය.
මල් මාලා ගොතන්නෙක් මල් එකින් එක අමුණමින් මාලය සාදන්නා සේ,
ඒ මාර්ග ඵල ලාභීන් ශ්‍රී සද්ධර්මය දේශනා කරමින් කුසලයන් වඩවා ගන්නේය.

2.මිරිඟුකමටහන් වැඩූ භික්ෂූන්වහන්සේ

ඵෙණූපමං කායමිමං විදිත්වා
මරීචිධම්මං අභිසම්බුධානො
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි
මච්චුරාජස්ස අදස්සනං ගච්ඡෙ

කය සෑම ක්ෂණයකම බිඳී බිඳී වෙනස් වෙන පෙණ පිඬකට උපමා කර, 'මමය- මගේය'
යනුවෙන් එයට ඇති කරගෙන සිටින බැඳීම දුරු කරන්න.
තමන් රූපයන් හඳුනා ගන්නා ආකාරය ඒ රූපයන්ගේ ඇත්ත ස්වභාවය නොවන බව
හෙවත් තමන්ගේ හැඳිනීම මිරිඟුවක් වැනි බව මනා සේ අවබෝධ කර ගෙන,
ඒ රූපයන් කෙරෙහි ඇති ඇලීම් ගැටීම් දුරු කරන්න.
මාරයාට අයත් පස් කම් සැප කෙරෙහි ඇති තෘෂ්ණාව සිඳ දමා මාරයාට නොදකින සේ
නිවණ කරා යන්න.

3.<u>විඩූඩභ කුමාරයෝ</u>

පුප්ඵානි හෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො'ව මච්චු ආදාය ගච්ඡති

මාලාකරුවෙක් මල් රැස් කරන්නා සේ, පංච කාමයන් රැස් කරන නිසා සසරට ඇලුණු මනුෂ්‍යයා, මරුවා විසින් මරණය වෙත ඇද ගෙන යන්නේ, වැසියන් නිදාසිටියදී මහ මුහුදට ගසා ගෙන යන ගමක් සේ, ඉතා ඛේදනීය අකාරයටයි.

4.<u>හිමියා පැතූ ස්ත්‍රිය</u>

පුප්ඵානි හෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං
අතිත්තං යෙව කාමෙසු අන්තකො කුරුතෙ වසං

මාලාකරුවෙක් මල් රැස් කරන්නා සේ, පංච කාමයන් රැස් කරන නිසා සසරට ඇලුණු මනුෂ්‍යයා, ඒ කාමයන්හි නොසංසිඳීම නමැති මහත් මාර බලයට යටත්ව, නිත්‍ය වශයෙන්ම ජීවිතය විනාශයෙන් කෙළවර කරගන්නේය.

5.<u>මච්ඡරිය කෝසිය සිටානෝ</u>

යථාපි භමරො පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං
පළෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ

මලේ වර්ණයට හා සුවඳට වත් හිංසා නොවන අයුරින් පැණි උරා බොන අතරම, බඹරා ඒ ගසට රසවත් එල දැරීමටද පිහිටවන්නේ යම්සේද, උතුම් පැවිද්දාද ගමෙහි හැසිරෙමින් පිණ්ඩපාතය සොයා ගන්නා අතරම එහි වැසියන්ට උතුම් තත්වයට පත්වීමටද පිහිට වන්නේය.

6.<u>පාඨීක ආජීවකයා</u>

න පරෙසං විලොමානි න පරෙසං කතාකතං
අත්තනො'ව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච

අන්‍යන්ගේ විරුද්ධ වාදී කම් ගැන නොසලකන්න, අන් අය කරන කියන දේ ගැන නොතකන්න. තමන් කරන්නේ නොකරන්නේ මොනවාදැයි පරීක්ෂා කාරී වෙන්න.

7.ඡත්තපාණි උපාසකතුමා

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො

යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං
එවං සුභාසිතා වාචා සඵලා හොති පකුබ්බතො

මනොඥ වූ වර්ණවත් පුෂ්පයක් සුවඳවත් නොවන්නේ යම්සේද, එලෙසම සද්ධර්මය හොඳින් ඉගෙන ගෙන, නිවැරදිව පුහුණු නොකරමින් යහපත්ව දේශනා නොකරන කෙනාගේ අසාර්ථක වීම සිදුවන්නේය.

මනොඥ වූ වර්ණවත් පුෂ්පයක් සුවඳ හමන්නේ යම්සේද, එලෙසම සද්ධර්මය හොඳින් ඉගෙන ගෙන, නිවැරදිව පුහුණු කරමින් යහපත්ව දේශනා කරන කෙනාගේ සාර්ථක වීම සිදුවන්නේය.

8.විශාඛා මහා උපාසිකාවෝ

යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං

යම් සේ මල් මාලාවක් සඳහා බොහෝ මල් අවශ්‍ය වන්නා සේ මනුෂ්‍යයෙකු ලෙස ඉපදීමට බොහෝ කුසල් වැඩිය යුතුවේ.

9.උඩු සුළඟෙහි යන සුවඳ

න පුප්ඵගන්ධො පටිවාතමෙති න චන්දනං තගරමල්ලිකා වා
සතඤ්ච ගන්ධො පටිවාතමෙති සබ්බා දිසා සප්පුරිසො පවාති

චන්දනං තගරං වාපි උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො

එතරම් සුවඳ ඇති සඳුන්, තුවරලා, සමන් පිච්ච සුවඳ වත් උඩු සුළඟට ගසා ගෙන පැතිරී යන්නේ නැහැ.
සිහි නුවණින් යුතු සත්පුරුෂයාගේ සුවඳ උඩු සුළඟට ගසා ගෙන ගොස් දස දිශාවේම පැතිරෙනවා.

එතරම් සුවඳ ඇති සඳුන්, තුවරලා, සමන් පිච්ච සුවඳ වත් සම කළ නොහැකි තරමටම සිල් සුවඳ උතුම් වන්නේය.

10.<u>පිණ්ඩපාත දානය</u>

අප්පමත්තො අයං ගන්ධො යායං තගරචන්දනී
යො ච සීලවතං ගන්ධො වාති දෙවෙසු උත්තමො

එතරම් සුවඳ ඇති සඳුන්, තුවරලා වැනි පැලැටි වල සුවඳ විහිදෙන්නේ ටික දුරක් පමණයි.
ශීලය හා යහපත් පැවැත්ම ඇති උතුම් කෙනාගේ සුවඳ දෙව්ලොව දක්වා හමන්නේය.

11.<u>ගෝධික ස්ථවිරයන් වහන්සේගේ පිරිනිවන් පෑම</u>

තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං මාරො මග්ගං න වින්දති

සීලාදී ගුණයෙන් සම්පන්නව සිහි නුවණ ඇතුව වාසය කරමින්, මනාසේ අවබෝධය ඇතිකරගත් කෙනා ගිය මග මාරයාට දැනගත නොහැකිවන්නේය.

12.<u>යහළුවෝ දෙදෙනෙක්.</u>

යථා සඞ්කාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ
පදුමං තත්ථ ජායෙථ සුචිගන්ධං මනොරමං
එවං සඞ්කාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ
අතිරොචති පඤ්ඤාය සම්මාසම්බුද්ධසාවකො

යම් සේ මහ මග දෙපස ඇති කසල දරණ, අපද්‍රව්‍ය බැහැර වෙන, දිය වළවල් වල හටගෙන, නැවත ඒ මඩෙහි නොතැවරෙමින්, ඒ මඩෙන් උඩට මතුව පිපී බැබලෙන සිත් අලවන සුළු අලංකාර සුවඳවත් නෙළුමක් සේ,
අවිද්‍යාව නමැති මඩ ගොහොරුවේ හටගෙන, පෙර කුසල් නිසා යම් දිනක ඇසීමට ලැබෙන බුදුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මයට හොඳින් සිහිය යොමුකරමින් අසා දැනගෙන, නුවණින් මෙනෙහි කර ගනිමින් වඩවා ගන්න ප්‍රඥාව නිසා, මාර්ග ඵලයකට පත්වී, නැවත ඒ අවිද්‍යාවේ නොතැවරෙන සේ සම්මා සම්බුද්ධ සාසනයේ ශ්‍රාවකයෙක් ලෙස බබලන්නේය.

5.<u>බාල වර්ගය</u>

1.<u>කොසොල් රජුට ඇසුනු මරහඬ</u>

දීඝා ජාගරතො රත්ති දීඝං සන්තස්ස යොජනං
දීඝො බාලානං සංසාරො සද්ධම්මං අවිජානතං

නිදිවරන කෙනෙකුට රාත්‍රිය දිගය, වෙහෙස වූ කෙනෙකුට යොදුන දුරය.
ශ්‍රී සද්ධර්මය ගැන අවබෝධ නොකරගන්නා කෙනාට සංසාරය දීර්ඝ වන්නේය.

2.<u>නො හික්මුනු ශිෂ්‍යභික්‍ෂු</u>

චරඤ්චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො
එකචරියං දළ්හං කයිරා නත්‍ථි බාලෙ සහායතා

යම්සේ මුලාවූ වැනි ක්‍රියා කරන අය ආශ්‍රය කරන්නා හට අවබෝධයට පත්වීමට ලැබෙන්නේ නැහැ. අඥානයන් ආශ්‍රයෙන් ඇතිවන කවර කම්පාවක් වත්, තනිව හැසිරෙන කෙනාට ඇතිවන්නේ නැහැ.

3.<u>සිටුවරයකු රොඩියකු වීම</u>

පුත්තා මත්‍ථි ධනම්මත්‍ථි ඉති බාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්‍ථි කුතො පුත්තා කුතො ධනං

අඥානයා මට මෙපමණ පුතුන් ඇත, මෙපමණ ධනය ඇතැයි, යනුවෙන් සිතමින් ඒවා රැකීමට වෙහෙස ගන්නවා, තමන්ට පිහිට විය හැක්කේ තමන්ටම මිස, නැහැ කවර පුතෙක් හෝ කවර ධනයක් වත් පිහිට වන්නේ.

4.<u>ගැට කපන සොරු දෙදෙනෙක්</u>

යො බාලො මඤ්ඤති බාල්‍යං පණ්ඩිතො වා’පි තෙන සො
බාලො ච පණ්ඩිතමානී ස වෙ බාලො’ති වුච්චති

යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා

යම් අඥානයෙක් තමන්ගේ අඥාන බව පණ්ඩිත බවක් යයි සිතන්නේ නම්, ඒ ඔහුගේ අඥාන කමද, තමා උගතෙකැයි ඇතිකරගත් මානයද, නිසා ඒකාන්තයෙන්ම ඔහුට බාලයෙක් යයි, කියනු ලැබේ.

ඉදින් අඥානයෙක් මුළු ජීවිත කාලය පුරාම සත්පුරුෂයෙක්ව ආශ්‍රය කරත්, ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගන්නේ නැහැ,
ව්‍යංජනය හැඳි ගැවෙන හැන්ද ඒ රසය නොදැන ගන්නවා සේ.

5.<u>ගැහැණියක සොයා ගිය අය රහත්වීම</u>

මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා

නුවණ ඇති කෙනා එක මොහොතකට හෝ සත්පුරුෂයෙක්ව ආශ්‍රය කරත්,
ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගන්නවා, දිව ඕනෑම රසයක් වහා දැන ගන්නවා සේ.

6.<u>කුෂ්ඨ රෝගියකු සෝවාන් වීම</u>

චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං

අඥානයා බාලයන් සමග හැසිරෙමින් තමන්ටම සතුරු කම් කරගනිමින්
සිදුකරන පවු කම් ක්‍රියා හේතුවෙන් බොහෝ දුක් විපාක ගෙවීමට සිදුවෙනවා.

7.<u>මුදල් පොදියක්</u>

න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති

කරන ක්‍රියාව යහපත් වෙන්නේ නැහැ ඒ සිදුකල ක්‍රියාව අනුව තැවෙන්න සිද්ධ වෙනවා නම්. ඒ අයහපත් ක්‍රියාව නිසා විපාකයක් ලෙස කඳුළු වගුරවමින් හැඬීමට සිදුවෙනවා.

8.<u>පින එකෙණෙහි විපාක දෙන හැටි</u>

තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති

කරන ක්‍රියාව යහපත් වෙන්නේ, ඒ ක්‍රියාව අනුව තැවෙන්නේ නැත්නම්.
ඒ යහපත් ක්‍රියාව නිසා විපාකයක් ලෙස මානසිකව සතුටින් සිටීමට හැකිවෙනවා.

9.<u>නන්ද නම් තරුණයා</u>

මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති

අඥානයා තමන් කරන පාපයන් මී පැණි මෙන් සලකන්නේ තමන්ට ඒ කරන ක්‍රියාවල විපාක පල නොදෙන තෙක් පමණයි.
යම් කලෙක ඒ විපාකයන් විඳීමට සිද්ධ වෙන විට ඒ අඥානයාට දුකම පමුණුවනවා.

10.<u>කර්ම විපාකයක හැටි</u>

මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං
න සො සඞ්ඛතධම්මානං කලං අග්ඝති සොළසිං

අඥානයා මසකට වරක් යම් කිසි ශීලයක් ලෙස මෑ ඇටයක් තරම් ආහාරය ප්‍රමාණයක්, තණකොළයක අගින් ගෙන අනුභව කරන ව්‍රත රැක්කත්, ස්වභාව ධර්මයේ නියමය ගැන දැනගැනීමේ වටිනා කමෙන් කලදක් තරම් වත් ඒ සිල් රැකීම වටින්නේ නැහැ.

11.<u>සඟසතු දේ කෑමෙහි බිහිසුණුකම</u>

න හි පාපං කතං කම්මං සජ්ජු ඛීරං'ව මුච්චති
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නො'ව පාවකො

එළදෙනගෙන් කිරි දොවන විටම බීමට සුදුසු කිරි නිදහස් වෙනවා මෙන් පාපී ක්‍රියා සිදු කරන විට එහි විපාක එකෙනෙහිම ලැබෙන්නේ නැහැ. අළු වලින් වැසුණු ගින්නක් සේ ඒ පවු කම් කල මොහොතේ සිටම ඒ අඥානයා දවමින් ඔහු පසු පස ඒ විපාක ලුහු බඳිනවා.

12.<u>සට්ඨිකූට ප්‍රේතයා</u>

යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධමස්ස විපාතයං

අඥානයාට ඇතිවෙන යම්තාක් දැනුම ඔහුගේ අනර්ථය පිණිසම වන්නේය. ඒ අඥානයාගේ මුග්ධ කම විසින් ඔහුගේ කුසල් කොටස විනාශ කරන නිසා ඔහුගේ විනාශය සිදුවන්නේය.

13.සුධම්ම ස්ථවිරයන් වහන්සේ

අසතං භාවනමිච්ඡෙය්‍ය පුරෙක්ඛාරඤ්ච භික්ඛුසු
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච

මමෙව කත මඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො
මමෙව අතිවසා අස්සු කිච්චාකිච්චෙසු කිස්මිචි
ඉති බාලස්ස සංකප්පො ඉච්ඡා මානො ච වඩ්ඪති

සිහි නුවණින් කටයුතු නොකරන, මෙනෙහි නොකළ යුතු දේ මෙනෙහි කරන, භික්ෂූන් පිරිවරා ඉන්න මහණ පන්සල්වලද, අනුන්ට පූජා කරන දේවලද, අධිපතිකම අපේක්ෂා කරනවා.

"*මේ සියල්ල මා විසින්ම කරන ලදැයි ගිහි-පැවිදි දෙකොටසටම හැඟිය යුතුයි".*
"ලොකු හෝ කුඩා කිසියම් ඕනෑම කටයුත්තක් වුවද මා විසින්ම කළ යුතුයි".
මෙලෙස මේ අඥානයා ගොඩනගා ගන්නා සිතිවිලි නිසා ඔහු තුල තෘෂ්ණාවද, මානයද තව තවත් වැඩෙනවා.

14.පුණ්‍ය මහිමය

අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රෑහයෙ

ලාභ සත්කාරවලට ඇලීම හේතුවෙන් ඇතිවෙන නොසංසිඳීමත්, නිවණට යාමෙන් ඇතිවන සංසිඳීමත් පිලිබඳ දැනුම මනාසේ නුවණින් අවබෝධ කරගන්නා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂුව, ලාභ සත්කාර කෙරෙහි නොඇලී, නිවණ සාක්ෂාත් කරගැනීම සඳහා කාය චිත්ත විවේකයෙන් යුතුව, ඒ ඒ මොහොතේ තම ඉන්ද්‍රියයන් වලට ස්පර්ශ වන අරමුණු දෙස නුවණින් බලමින් නුවණින් මෙනෙහි කරමින්, ප්‍රඥාව වඩවා ගනිමින් වාසය කරනවා.

6.පණ්ඩිත වග්ගය

1.රාධ ස්ථවිරයන් වහන්සේ

නිධීනං'ව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො

තමන් ආශ්‍රය කරන කෙනෙක් විසින් පෙන්වාදෙන, තමන්ගේ වැරදි අඩුපාඩු සැලකිය යුත්තේ, තමන්ට ඒ ප්‍රඥාවන්ත මිතුරා විසින් විශාල ලාභයක් ලබාදෙනවා යයි යන හැඟීමෙන්. එලෙස ඒ ප්‍රඥාවන්ත මිතුරා කෙරෙහි ගෞරවයක් ඇතුව ආශ්‍රය කරන කෙනාට අකුසල් හටගැනීමක් සිදුවෙන්නේ නැහැ.

2.අස්සජි පුනබ්බසුකයෝ

ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො

නුසුදුසු පහත් ක්‍රියා මෙන්ම මෙතෙක් කාලයක් වළක්වා ගැනීමට අපහසු වූ නරක පුරුදු වලින් වැළකීමට අවවාද අනුශාසනා කරමින් මග පෙන්වන සත්පුරුෂ ප්‍රඥාවන්තයාට, සිහි නුවණින් යුතුව වාසය කරන අයකු විසින් කැමති වනවා සේම සිහි නුවණින් තොරව වාසය කරන කෙනෙකු විසින් පිළිකුල් කරන්නේද වේ.

3.ඡන්න ථෙර

න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ.
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථ පුරිසුත්තමෙ

පාපයට-අකුසලයට යොමු කරන මිත්‍රයන් ආශ්‍රය කිරීම සුදුසු නැහැ, නපුරු-හිංසා සහගත සිතිවිලි ඇති මිත්‍රයන් ආශ්‍රය කිරීම සුදුසු නැහැ. යහපත් ගුණධර්ම පෙන්නා දෙන මිත්‍රයන් තමයි ආශ්‍රය කළ යුත්තේ, උසස් ගතිගුණ ඇති අය තමයි ආශ්‍රය කළ යුත්තේ.

4.මහා කප්පින සථවිරයන් වහන්සේ

ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො

ධර්ම අවබෝධය හේතුවෙන් ඇතිවන සංසිඳීම නිසා මනස අතිශයින් ප්‍රසන්නව බබලනවා. ඒ ආර්ය ධර්මය නුවණින් අවබෝධකරගත් ප්‍රඥාවන්තයා සදාකාලික සුවය අත්විඳිමින් වාසය කරනවා.

5.<u>**පණ්ඩිත සාමණේරයෝ**</u>

උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා

ගොවියා තමන්ගේ වගාව සාර්ථක කරගැනීමට, ගංගා ඇලදොළ වලින් නිවැරදි ආකාරයට කුඩා දිය පහරවල් සකසමින් වතුර ගෙනයයි.
ඊතල සාදන්නා නිවැරදි ආකාරයට රත්කරමින් ඊතලය ඉතා කෙලින් සිටිනසේ සකස් කරයි.
ලී වඩුවා නිවැරදි ආයුධ භාවිතා කරමින් මනාසේ ලී බඩු සකස් කරයි.
ප්‍රඥාවන්තයා නිවැරදි ධර්මය සොයා අවබෝධ කරගෙන නිවැරදි පිළිවෙලට අනුගමනය කරමින් දැඩි වීර්යයෙන් යුතුව කටයුතු කරමින් තම අභිවෘර්ධිය සලසා ගනී.

6.<u>**ලකුණ්ටක භද්දිය ස්ථවිරයන් වහන්සේ**</u>

සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා

ගල් පර්වතයක් දැඩි සුළි සුළඟකටවත් සෙලවෙන්නේ නැහැ.
ඒ ලෙසම ප්‍රඥාවන්තයාද නින්දා ප්‍රශංසා දෙකෙහිදීම කම්පාවට පත්වෙන්නේ නැහැ.

7.<u>**කැවුම් නිසා හටගත් නොසතුට**</u>

යථාපි රහදො ගම්භීරො විප්පසන්නො අනාවිලො
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතා

විලක් නො කැලඹුණු විට පතුල දැකීමට හැකි තරම් පිරිසිදුවන්නා සේ ධර්මය අසා අවබෝධ කරගත් ප්‍රඥාවන්තයාගේ සිතද ඉතා පිරිසිදුවේ.

8.<u>**මිදිරොඩුදිය බුන් කොටලුවෝ**</u>

සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති න කාමකාමා ලපයන්ති සන්තො
සුඛෙන ඵුට්ඨා අථ වා දුඛෙන නොච්චාවචං පණ්ඩිතා දස්සයන්ති

ඒකාන්තයෙන්ම සියල්ල අතහරින ලද උතුම් සත්පුරුෂයන් හෙවත් රහතන් වහන්සේලා විසින් තමන් කැමති අකමැති දේ ගැන කතාකිරීම දකින්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ ප්‍රඥාවන්තයින්, ලොකු - කුඩා යන සියලු දුක් වලින් ඒකාන්තයෙන්ම මිදී, සුවය අත්විඳිමින් වාසය කරනවා.

9.පවුලම මහණ වීම

න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා

තමන්ගේ හෝ අනුන්ගේ හෝ අවිද්‍යාව නිසා මගේ යයි අල්ලා ගත් පුත්‍රයන්ගේ හෝ අයිති දේවල හෝ රටේ හෝ අභිවුර්ධිය උදෙසා වැරදි නරක හිංසා ක්‍රියා සිදු කිරීමට නොපෙළඹෙන ඔහු ශීලවන්ත, ප්‍රඥාවන්ත, ගුණවන්ත කෙනෙක් වන්නේය.

10.නිදි කිරමින් බණ ඇසූ මිනිස්සු

අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති

යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං

මිනිස් සමූහයෙන් නිර්වාණයට හෙවත් පරතෙරට යන්නේ ඉතා අල්පයක් දෙනා පමණයි. ඉතිරි සත්ව සමූහයම සසරේ උපදිමින් මැරෙමින්, කම්පාවෙන් පෙළෙමින් කාමය පසුපස දුවයයි.

බුදුන් වහන්සේ මනාසේ දෙසූ ධර්මය අසා නුවණින් මෙනෙහි කරමින් අවබෝධ කරගෙන ඒ ධර්මයට අනුව හැසිරෙන කෙනා, ඉතා අමාරුවෙන් එතෙර විය යුතු මාරයාට අයත් පෙදෙස ඉක්මවමින් හෙවත් කාමයෙන් අත්මිදෙමින් සංසාරයෙන් එතෙර වීම සිදු කරගන්නේය.

11.ආගන්තුක භික්ෂූන් වහන්සේලා

කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං

තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො

යෙසං සම්බොධිඅඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා

රාග ද්වෙශාදී කෙලෙස් දුරුකර යහපත් ගුණධර්ම වැඩීම සඳහා ප්‍රඥාවන්තයා, ගෘහාශ්‍රිත ප්‍රදේශ වලින් ඉතා බැහැර වූ කාය චිත්තාදීන්ගේ විවේකය සඳහා සුදුසු පරිසරයක වාසයට එළඹෙයි.

රාග ද්වෙශාදී කිසිදු පළිබෝධයක් නැවත ඇති නොවන සේ අවිද්‍යාවත්, තෘෂ්ණාවත් බැහැර කරමින්,
ඒ ප්‍රඥාවන්තයා තමාගේ සිත, සියලු කෙලෙස් වලින් මුදවා පිරිසිදු කර ගනියි.

නිර්වාණයට පමුණුවන ඒ ගුණයන්, වීර්යයෙන් යුතුව නිවැරදිව වඩමින් පිරිසිදු වූ සිතක් ඇතිකර ගන්නා නිසා, ‘මමය-මගේය-මගේ ආත්මය’ යයි යනුවෙන් තණ්හා-දෘෂ්ඨි-මානයන් ගෙන් කිසිවක් කෙරෙහි ඇලීමක් හෝ ගැටීමක් නැති
ඒ ඔහු, සියලු ආශ්‍රවයන් දුරු කර නිර්වාණය සාක්ෂාත් කරගනිමින් ඔහුගේ ජීවිතය ආලෝකමත් කරගන්නේය.

7.අරහද් වග්ගය

1.වෛද්‍යාචාර්ය ජීවකයන් ඇසූ ප්‍රශ්නයක්

ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි
සබ්බගන්ථප්පහීණස්ස පරිළාහො න විජ්ජති

කෙලෙස් දුරු කිරීම සම්පූර්ණ කර 'මමය-මගේය-මගේ ආත්මය' යයි යන සියලු උපාදානයන්ගෙන් මිදී නිවන් මාර්ගයේ අවසානයට පැමිණුනු ශෝක නොකරන කෙනා,
සියලු බන්ධනයන්ගෙන් මිදීම හේතුවෙන් ඔහු තුල අසහනය, දැවිලි හටගන්නේ නැහැ.

2.මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ගුණ කථාවක්

උය්‍යුඤ්ජන්ති සතිමන්තො න නිකෙතෙ රමන්ති තෙ
හංසා'ව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ

උත්සාහවත් වෙමින් කාමය දුරු කර, සිහි නුවණින් යුතුව වාසය කරන ප්‍රඥාවන්තයා සිව්පසය නිසා හෝ වෙනත් ලාභයන් නිසා වාසස්ථානයන්ට උපාදානය වෙන්නේ නැහැ. ජල වාසස්ථානයක් යයි සිතමින් විලටම උපාදානය නොවී විල් අතහැර යන හංසයා සේ, සිවුපසයට ගිජු නොවන ප්‍රඥාවන්තයාද සිව්පසය ලැබීම අපේක්ෂාවෙන් එකම ස්ථානයකට නොඇලී ඒවා අතහැර තමන්ගේ අභිවුර්ධියට සුදුසු පරිසරයන් සොයා යන්නේය.

3.බෙලට්ඨිසීස ස්ථවිරයන් වහන්සේ

යෙසං සන්නිචයො නත්‍ථි යෙ පරිඤ්ඤාතභොජනා
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං ගති තෙසං දුරන්නයා

කිසිවක් රැස් කිරීමට උත්සාහ නොකරන, ආහාරයේ පමණ දැන වළඳන
අනිච්ච- දුක්ඛ-අනත්ත බව මෙනෙහි කරමින් ලෞකික ලෝකයේ ඇති හිස් බව දකිමින් රහත් ඵලය අරමුණු කරමින් වීර්යය වඩන කෙනා අහසේ හැසිරෙන පක්ෂියෙකු මෙන් සැහැල්ලුවෙන් යුතුව වාසය කරමින්, තමන්ගේ අරමුණ වන නිවණ සාක්ෂාත් කර ගන්නේය.

4.<u>අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ සිවුර</u>

යස්සාසවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො
සුඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො
ආකාසෙ'ව සකුන්තානං පදං තස්ස දුරන්නයන්ති

දුරු කළ තණ්හා-දෘෂ්ඨි-මාන ඇති, ආහාරයේද නොඇලුණු අනිච්ච- දුක්ඛ-අනත්ත බව මෙනෙහි කරමින් ලෞකික ලෝකයේ ඇති හිස් බව දකිමින් රහත් ඵලය අරමුණු කරමින් වීර්යය වැඩූ ඔහු අහසේ හැසිරෙන පක්ෂියෙකු මෙන් සැහැල්ලුවෙන් යුතුව වාසය කරමින්, තමන්ගේ අරමුණ සම්පූර්ණ කර ගත්තේය.

5.<u>මහා කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ</u>

යස්සින්ද්‍රියානි සමථං ගතානි
අස්සා යථා සාරථිනා සුදන්තා
පහීණමානස්ස අනාසවස්ස
දෙවා'පි තස්ස පිහයන්ති තාදිනො

යම්සේ අශ්ව රථ රියදුරෙක්, ඒ අශ්වයන් හීලෑ කරගනිමින් රථයට යොදවා ගන්නවා සේ, තමන් තුල පැවති, සුබයි-අසුභයි-කැමතියි-අකමැතියි යන මානයන් දුරු කර, හික්මවා ගත් ඉන්ද්‍රියයන්ගෙන් යුතු, 'මමය-මගේය-මගේ ආත්මයයි' උපාදානයෙන් තොරව නිවන් සුවය අත්විඳින එබඳු වූ උතුම් පුද්ගලයින් දෙවියන්ටද ප්‍රියවේ.

6.<u>ශාරීපුත්‍ර මහා ස්ථවිරයන් වහන්සේගේ සිංහනාදය</u>

පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදි සුබ්බතො
රහදො'ව අපෙතකද්දමො සංසාරා න භවන්ති තාදිනො

මහපොළොව මෙන් ඕනෑම දෙයක් දරාගැනීමට හැකි, තද සුළඟකටවත් නොසෙල්වෙන ඉන්ද්‍ර ඛීලයක් සේ අටලෝ දහමෙන් කම්පා නොවෙන,
මහා සාගරයට වැටුණු පසු ගලා යාම නවතින දිය දහරක් සේ, නිවණට පත්වූ උතුම් කෙනාද නැවත භවයෙන් භවයට සැරිසැරීමක් සිදුවෙන්නේ නැහැ.

7.<u>සත් හැවිරිදි මහරහතුන් වහන්සේ</u>

සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො

සංසිඳුණු මනස නිසා සංසිඳුණු වචන ද, ක්‍රියා ද ඇති බුදුන් දේශනා කළ ධර්මය මනාසේ අවබෝධ කරගෙන නිර්වාණය සාක්ෂාත් කළ ඒ උතුම් පුද්ගලයා සංසිඳුණු තැනැත්තෙකි.

8.<u>ශාරීපුත්‍ර මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රශ්නයකට පිළිතුරු දුන් සැටි</u>

අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො

කෙළෙහි ගුණ නො දත් බවද, රැස් කර ගැනීමට කැමති බවද ඇති ශ්‍රද්ධාවක් නැති මනුෂ්‍යයෙක්, යම් කලෙක බුදුන්ගේ ධර්මය අසා නුවණින් මෙනෙහි කර අවබෝධයට පත්වූ දා සිට ඇතිකරගන්නා ආකාරවතී ශ්‍රද්ධාව නිසා බුදුන් වහන්සේගේ උපදෙස් අනුවම පිළිපදිමින් තමන් තුල අකුසල් වැඩීමට ඇති අවස්ථා විනාශකර සියල්ල කෙරෙහි ඇති ඇලීම් දුරුකිරීම නිසා ඒ ඔහු ඒකාන්තයෙන්ම උතුම් මනුෂ්‍යයෙක් බවට පත් වන්නේය.

9.<u>මගුලේ ගොස් එන අතරමගදී මහණ වීම</u>

ගාමෙ වා යදි වා රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ
යත්ථාරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං

ගමෙහි හෝ වේවා වන අරණක හෝ වේවා පහත් බිමක හෝ වේවා උස් බිමක හෝ වේවා, යම් ඒ රහතන් වහන්සේලා වාසය කරන ඒ ස්ථානයන් සිත් අලවන සුළු වන්නේය.

10.<u>වෙසඟනක්</u>

රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී ජනො
වීතරාගා රමිස්සන්ති න තෙ කාමගවෙසිනො

සිත් අලවන සුළු වන අරණක් සාමාන්‍ය මනුෂ්‍යයාට සැපයක් ඇලීමක් ඇති නොකළාට කාමය නොසොයන රාගය දුරු කල රහතුන් වැනි උත්තමයන්ට කාය චිත්තාදී විවේකයට ඉතාමත් සුදුසු වන අරණ සිත් අලවන සුළු තැනක් වන්නේය.

8.<u>බ්‍රාහ්මණ වර්ගය</u>

1.<u>ප්‍රසාදබහුල බ්‍රාහ්මණයෙක්</u>

ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහ්මණ
සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූ’සි බ්‍රාහ්මණ

ප්‍රඥාවන්තයා කාමයේ ආශ්වාදය ආදීනව අවබෝධකරගෙන කාමය දුරු කිරීමට වීර්යය කරමින් තෘෂ්ණාව මුළුමනින්ම සිඳ දමන්නේය. ප්‍රඥාවන්තයා නුවණින් මෙනෙහි කරමින් තමන් විසින් සිදු නොකළ යුතු දේ ගැන අවබෝධ කරගනිමින් වචී-කාය-මනෝ සංස්කාරයන් දුරු කරන්නේය.

2.<u>බුදුරජුන් වෙත පැමිණි භික්ෂූන් වහන්සේලා</u>

යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහ්මණො
අථස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො

යම් විටෙක සමථ-විදර්ශනා භාවනා දෙකෙහිම පරතෙරට ගිය ප්‍රඥාවන්තයා තම ඉන්ද්‍රියයන්ට අරමුණු වන රූප කෙරෙහි උපාදානයක් සිදු නොවන බව දැනගන්නවා.

3.<u>මරුට දෙසූ දහමෙක්</u>

යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති
වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

යමෙකුට කළ යුතු හෝ නොකළ යුතු හෝ තවත් කිසිවකුත් එතෙර හෝ මෙතෙර ඇත්තේ නැත්නම්, (නිවණ සාක්ෂාත් කිරීම හෙවත් රහත් ඵලයට පත්වීම සඳහා තවත් කළයුතු කිසිවක් ඉතිරිව නැතිනම්) දුරු කළ දාහයෙන්ද, දුරු කළ කාමයෙන්ද, යුතු ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

4.<u>තමන් බ්‍රාහ්මණයෙක් යයි සිතාගත් බමුණෙක්</u>

ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

සියලු ආශ්‍රවයන් දුරුකර, තණ්හා දෘෂ්ඨි මාන යන්ද ප්‍රහීණ කර, කළ යුතු සියල්ලද කර අවසන් කළ ධ්‍යානයන්ට සමවැදී සිටින රහත් බවට පත්වූ උතුම් කෙනාට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

5.<u>බුදුරජුන්ගේ සරීරෝභාසය</u>

දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහ්මණො
අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා

සූර්යයා දහවලට බබලයි, චන්ද්‍රයා රාත්‍රියට බබලයි,
ක්ෂත්‍රියා පිරිස් බලයෙන් සන්නද්ධ වූ විට බබලයි,
ප්‍රඥාවන්ත භාවය ධ්‍යානයන්ට සමවැදීම නිසා බැබලෙයි.
සියලු සංස්කාරයන්හි කලකිරෙමින්, කිසිවක් කෙරෙහි නොඇලී ‘මමය’ යන හැඟීමෙන් මිදුණු බුදුවරුන්ගේ තේජස, රෑ දහවල් දෙකේ සැමකල්හිම බැබලෙයි.

6.<u>බමුණකුගේ ඉල්ලීමෙක්</u>

බාහිතපාපො’ති බ්‍රාහ්මණො සමචරියා සමණො’ති වුච්චති.
පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතො’ති වුච්චති

අකුසල් බහාතැබූ, සන්සුන් ධාර්මික උතුම් පැවැත්මක් ඇත්තාට
‘ශ්‍රමණයා’ යයි කියනු ලැබේ.
ගිහි ගෙයින් නික්මී වසන කෙලෙස් මලින් පිරි කෙනාට ‘පැවිද්දා’ යයි කියනු ලැබේ.

7.<u>ශාරිපුත්‍රයන් වහන්සේගේ ඉවසීම</u>

න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධී යස්ස මුඤ්චති

න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො
යදා නිසෙධො මනසො පියෙහි
යතො යතො හිංසමනො නිවත්තති
තතො තතො සම්මති මෙව දුක්ඛං

කෙනෙක් බ්‍රාහ්මණයෙක් හෙවත් උසස් පුද්ගලයෙකු යයි තමන්ව හඳුන්වා ගන්නවා නම්, ඔහු විසින් අන්‍යන්ට හිංසා පීඩා සිදුකරන්නේ නැහැ,
කුලය, ජාතිය, ආගම, වත් පොහොසත් කම් අනුව අන්‍යන්ව පහත් කොට සලකන, අන්‍යන්ට හිංසා පීඩා සිදුකරන, තමන්ව බ්‍රාහ්මණයෙක් යයි හඳුන්වා ගන්නා එවැනි වූ පෘතග්ජන ගිහි හෝ පැවිදි කෙනෙකුට කිසිදා සැනසීමක් ලැබෙන්නෙත් නැහැ.

නමුත් යම් දවසක නිවැරදි ධර්මය අසා අවබෝධකරගෙන ඒ අනුව තමන් තුල පැවති ඒ නරක සිතිවිලි බැහැර කර එවැනි සාහසික පහත් ක්‍රියා නවතා දැමූ මොහොතේ පටන්, ඔහුට මහත් වූ සැපයක් ලැබෙනවා. එයට හේතු වන්නේ ඔහු විසින් වඩවා ගත් ප්‍රඥාවයි.

ප්‍රඥාව උපදවා ගත් ශ්‍රේෂ්ඨ වූ කෙනා අන් කිසිදු කෙනෙකුට හිංසා කිරීම් වැනි පහත් ක්‍රියා සිදු කරන්නේ නැහැ. සිහිය එළඹ ගෙන සිටින ඔහු යම් දිනක තමන්ගේ සිත කැමති දේ කිරීම වැලැක්වීමට පටන් ගන්නවා.
එතැන් සිට ඒ ලබා ගත් අවබෝධය නිසා, ඔහු හිංසා පීඩා කිරීමෙන් වැළකීමට පටන් ගන්නවා. එලෙස හිංසා පීඩා කිරීමෙන් මුළුමනින්ම වෙන්වූ ඔහු තුල දූක මුළුමනින් නැති වෙනවා. ඒ ප්‍රඥාව ඔහුව බ්‍රාහ්මණයෙක් බවට ද පත්කරනවා.

8.මහාප්‍රජාපති ගෞතමී නිසා උපන් කතාවක්

යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

යම් කෙනෙක් තම සිතෙන්, කයෙන් වචනයෙන් නපුරු නරක ක්‍රියා සිදු නොකරන්නේ නම්, ඒ සිත, කය, වචනය යන තුන් දොර හික්මවා ගෙන වාසය කරන කෙනාට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

9.සැරියුත් තෙරුන්ගේ ගුරුන් පිදීම

යම්හා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං
සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තං'ව බ්‍රාහ්මණො

කෙනෙක් තමාට සම්මා සම්බුදුන්ගේ ධර්මය අවබෝධ කරගැනීමට මග පෙන්වූ ගුරුවරයාට ගෞරවයෙන් නමස්කාර කරන්නේ, බමුණන් ගිනි දෙවියන්ට යාග හෝම් පිදීම් සිදුකරමින් වැඳුම් පිදුම් කරන්නා සේය.

10.ජටිල බ්‍රාහ්මණයා

න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති බ්‍රාහ්මණො
යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො'ව බ්‍රාහ්මණො

හිස් වැස්මක් පැළඳීමෙන් හෝ පරම්පරාවෙන් හෝ උප්පත්තියෙන් හෝ බ්‍රාහ්මණයෙක් වෙන්නේ නැහැ.
යම් කෙනෙක් වෙනස් නොවෙන්නාවූ සත්‍යය අවබෝධ කරගෙන මනා කොට තම සිත කය වචනය හසුරවන්නේ නම් ඒ අනුව ඔහු බ්‍රාහ්මණයෙක් වන්නේය.

11.<u>**කුහක බමුණෙක්**</u>

කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා
අබ්භන්තරං තෙ ගහණං බාහිරං පරිමජ්ජසි

කෙනෙක්ගේ අභ්‍යන්තරය කෙලෙස් වලින් ගහණවී, බාහිර ඉන්ද්‍රියයන් අවිද්‍යාවෙන් මත් වී නම් සිටින්නේ, ඒ ඔහු හිස් වැසුම් දරාගෙන හෝ අඳුන් දිවියාගේ සමින් කල ඇඳුම් දරමින් රකින අඥාන ශීලයකින් ඔහුට ඇති ඵලය කුමක්ද?

12.<u>**කිසාගෝතමී**</u>

පංසුකූලධරං ජන්තුං කිසං ධමනිසන්ථතං
එකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

නෙරාගිය නහර ඇති කෙට්ටු සිරුරක් දෘෂ්‍යමාන වන, මළවුන් උදෙසා පරිත්‍යාග කරන ලද වස්ත්‍රයෙන් කළ වස්ත්‍රයක් හැඳ, මහ වනය මැද සිත උසස් කර ගැනීමට වීර්‍යය කරමින් භාවනානුයෝගීව සිටින ඔහුට මම ‘බ්‍රාහ්මණ’ යැයි කියමි.

13.<u>**තමා බමුණු යි සිතූ බමුණෙක්**</u>

න චාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං
භොවාදී නාම සො හොති සචෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

මවු කුසක හටගෙන යෝනියෙන් ඉපදිලා, රාග-ද්වේෂ-මෝහ නමැති කෙලෙස් ඇතුව ඇලීම් සහිතව ඉන්න කෙනාට ‘බ්‍රාහ්මණයා’ කියල මම කියන්නේ නැහැ.
“මමය-මගේය” කියා හැඟීමෙන් කිසිවක් අල්ලා නොගන්නා,
සියලු කෙලෙස් දුරු කළ, ඒ ඔහුට තමයි මම ‘බ්‍රාහ්මණයා’ කියන්නේ.

14.<u>**උග්ගසේන සිටු**</u>

සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති
සඞ්ගාතිගං විසඤ්ඤුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

සියලු සංයෝජනයන් සිඳ දමා, තෘෂ්ණාවෙන් පීඩිත නොවී
සියලු ඇලීම් දුරු කර, සියල්ලෙන් වෙන් වූ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

15.චුල්ලරෝහිත - මහාරෝහිත බ්‍රාහ්මණයෝ

ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දාමං සහනුක්කමං
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

වර පට සිඳ දමා ගත් අශ්වයෙක් අනුක්‍රමයෙන් දමනය කර ගන්නා සේ,
රාග-ද්වේෂ-මෝහාදී ක්ලේශයන් අනුක්‍රමයෙන් දුරු කර,
සියලු දුක්වලින් මුළුමනින්ම මිදී අවබෝධයට පත්වූ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

16.අක්කොසකභාරද්වාජ බ්‍රාහ්මණයා නැගූ ප්‍රශ්න

අක්කොසං වධබන්ධං ච අදුට්ඨො යො තිතික්ඛති
ඛන්තිබලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

ආක්‍රෝෂ-නින්දා-අපහාස-හිංසා, හමුවේ නොසැලෙමින්,
කෝපයට පත්නොවන බල හමුදාවක් සේ ඉවසීමේ බලය පුහුණු කළ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

17.සැරියුත් මහතෙරුන්ග් මෑනියන්දෑ කියූ රළු බස්

අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං
දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

උඩඟු නොවන මෛත්‍රී සහගතව සිල්වත්ව හික්මුණු,
අවසන් ශරීරය දරන රහතන් වහන්සේට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

18.මිනිසුන් රහතුන් වහන්සේ ගැණ කළ කතාවක්

වාරි පොක්ඛරපත්තෙ'ව ආරග්ගෙරිව සාසපො
යො න ලිම්පති කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

නෙලුම් කොලය ජලය නොරඳව ගන්නා සේ,
ඉදිකටු තුඩ මත, අබ ඇටය නොරඳව ගන්නා සේ,
කාමය නො තවරගන්නා,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

19.<u>පැවිදි වූ දාසයෙක්</u>

යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො
පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

දුක යනු කුමක්දැයි, ප්‍රත්‍යක්ෂව අවබෝධ කර,
ඉන් මිදීම සඳහා සියලු බැඳීම්-ඇලීම් වලින් වෙන්වූ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

20.<u>ඛේමා ස්ථවිරාවෝ</u>

ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

යා යුතු-නො යායුතු මාර්ගයන් නිවැරදිව තෝරා ගැනීමට දක්ෂ ව,
පිළිවෙලින් රහත් ඵලයට එළඹෙන ගැඹුරු නුවණක් ඇති ප්‍රඥාවන්ත,
ඒ ඔහුට, මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

21.<u>තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ</u>

අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

තමාගේ යනුවෙන් වාසස්ථාන අයිතිකර ගැනීමක් නැති,
ලද දෙයින් සතුටු වන අල්පේච්ඡ ජීවිතයක් ගතකරන,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

22.<u>රහත් නමකට තැළු පවිටි මිනිසෙක්</u>

නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

දඬු මුගුරු බහා තැබූ නිසා කෙලෙස් සහිත සත්වයන් හෝ කෙලෙස් ප්‍රහීණ කළ උතුමන්
හෝ යන සියලු ප්‍රාණීන් හට, හිංසාවක්-පීඩාවක් හෝ නැසීමක් සිදු නොකරන,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

23.කෝපයෙන් ගැටුනු බැමිනිය

අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං
සාදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

තමන්ට සතුරු කම් කරන අය කෙරෙහි සතුරු නොවී සිටිය හැකි,
තමන්ට හිංසා පීඩා කරද්දීත් ඒවා ඉවසා දරා ගෙන සංසිඳීමට පත් වීමට හැකියාව ඇති,
කෙලෙස් සහිත බලවත් හැඟීම් නැතිකළ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

24.මහාපන්ථකතෙරුන් චුල්ලපන්ථකතෙරුන්ට සැලකූසැටි

යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො
සාසපො රිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

ඉදිකටු තුඩ මත අබ ඇටය නොරඳවගන්නා සේ, තමන් තුල තිබූ
රාගය-ද්වේෂය-මානය-ගුණමකු බව, තමන් වෙතින් ඉවත් කරන ලද,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

25.පිලින්දිවච්ඡ මහාස්ථවිරයන් වහන්සේ

අකක්කසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

රළු අදහස් නැති-අවබෝධ කරවීමට පහසු නමාශීලී-සත්‍ය වචන ප්‍රකාශ කරන-
කිසිදු දෝෂාරෝපණයට භාජනය නොවන,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

26.උතුරුසළුවක් ගත් මහණෙක්

යො'ධ දීඝං ච රස්සං වා අණුං ථූලං සුභාසුභං
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

දීර්ඝ කාලීන හෝ කෙටි කාලීනව, යහපත හෝ අයහපත ඇතිකරන, කුඩා වූ ලාභයක්
හෝ මහත් වූ ලාභයක් ඇති අන් අයට අයත් දෙයක් ඒ ඔවුන් විසින් නොදෙන කළ,
ඒ කිසිවක් හොරෙන් හෝ බලහත්කාරයෙන් නොගන්නා,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

27.<u>සැරියුත් මහතෙරුන්ට කළ නිගාවක්</u>

ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච
නිරාසයං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

තමන්ගේ ගැන හෝ අන් කිසිවක් ගැන ලෝභයක් දක්නට නැති,
කැමති-අකමැති දෙකෙන්ම මිදුණු,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

28.<u>මුගලන් මහතෙරුන්ට දෙසූ ධර්මදේශනාවක්</u>

යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

“මමය-මගේය” යන තෘෂ්ණාව නැති කළ ඔහු තුල,
අන් අය කෙරෙහි තෘෂ්ණාවක් ඇතැයි කියා සැක කිරීමට හේතුවක් නැහැ.
පිලිවෙලින් නිවණ සාක්ෂාත් කළ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

29.<u>පින් පව් නැසූ රේවත සාමණේරයන් වහන්සේ</u>

යො’ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

පින්කම්ද, පවුකම්ද යන දෙකෙහිම ඇති ආශාව ඉක්මවූ,
කෙලෙස් ප්‍රහීණ කිරීමෙන් පාරිශුද්ධත්වයට පත්වූ, ශෝක නොකරන්නා වූ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

30.<u>චන්ද්‍රාභ ස්ථවිරයන් වහන්සේ</u>

චන්දං’ව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං.
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

පැහැදිලි අහසේ බබලන අති ප්‍රසන්න පූර්ණ චන්ද්‍රයා සේ,
භව තෘෂ්ණාව දුරුකර පාරිශුද්ධත්වයට පත් වූ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

31.<u>සීවලි මහාස්ථවිරයන් වහන්සේ</u>

යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහමච්චගා
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

මෝහයෙන් මුලාවීම නිසා, ඉතාමත් දුෂ්කර වූ ද කටුක වූ ද සංසාරයේ ඇවිද යන බව, නුවණින් අවබෝධ කරගෙන, සංසාරය ඉක්මවා පරතෙර නම් නිවණට පැමිණි ඒ ඥානවන්තයාගේ නිකෙලෙස් බව ගැන කුමක් කියන්නද.
එසේ ඒ "මමය-මගේය-මගේ ආත්මය" යයි අල්ලාගත් තෘෂ්ණාවෙන් මිදී නිවණට පත්වූ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

32.<u>සුන්දරසමුද්ද තෙරුන්ට වෙසඟනක කියූ කපටි බස්</u>

යොධ කාමෙ පහාත්වාන අනාගාරො පරිබ්බජෙ
කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

බ්‍රහ්මචාරී පැවිදි ජීවිතයක් ගත කරමින් පහත් කාමය විනාශ කර, කාම භවය ප්‍රහීණ කළ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

33.<u>ජටිල ස්ථවිරයන් වහන්සේ</u>

යො'ධ තණ්හං පහාත්වාන අනාගාරො පරිබ්බජෙ
තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

බ්‍රහ්මචාරී පැවිදි ජීවිතයක් ගත කරමින් ඒ පහත් තෘෂ්ණාව විනාශ කර
භව තණ්හාව ප්‍රහීණ කළ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

34.<u>ජෝතිය ස්ථවිරයන් වහන්සේ</u>

හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

මනුෂ්‍ය ලෝකයට ඇති ආශාව දුරු කර, දේව ලෝකයන් කෙරෙහි ඇති ආශාව ද ඉක්මවා, සියලු ලෝකයන් කෙරෙන් සිත මුදවා ගත්තාවූ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

35.<u>නළුවෙක්</u>

හිත්වා රතිං ච අරතිං ච සීතිභූතං නිරූපධිං
සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

කාමය කෙරේ ආශාව දුරුකර, 'මමය-මගේ' යයි මෝහයෙන් මුලාවී අල්ලාගෙන සිටි සියල්ල ගැන කළකිරී, කෙලෙස් දුරු කර, අධික වීර්යයකින් කෙලෙස් සහිත සියලු ලෝකය මැඩ පැවැත් වූ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

36.<u>නට පුත්‍රයා</u>

චුතිං යො'වෙදි සත්තානං උපපත්තිං ච සබ්බසො
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

මැරෙන සත්වයාට ස්ථිරවම නැවත උපතක් තිබෙන බව මනාසේ දැන අවබෝධ කරගෙන, එයින් මිදී නැවත උපත නැති කළ,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

37.<u>වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ</u>

යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

දෙවියෙක් හෝ ගන්ධබ්බයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ ලෙස වත් නැවත නොඉපදෙන සේ ආශ්‍රවයන් ක්ෂය කළ රහතන් වහන්සේ වන,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

38.<u>විශාඛ - ධම්මදින්නා දෙදෙන</u>

යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

අතීත-අනාගත-වර්ථමාන කිසිවක්, තණ්හා-දෘෂ්ඨි-මාන වශයෙන් නොගන්නා නිසා කිසිදු ඇලීමක් හෝ ගැටීමක් නැති,
ඒ ඔහුට මම 'බ්‍රාහ්මණයා' යයි කියමි.

39.<u>ඇතුනට බිය නො වූ අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ</u>

උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං
අනෙජං න්හාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

බර අදින ගොනෙකු සේ අධික වීර්යයක් ඇතුව තෘෂ්ණාව පරාජය කර
සිනාවෙන් මුව සරසා ගත්, උතුම් අවබෝධයට පත්වූ,
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

40.<u>උණුදිය හා උක්පැණි පිදූ බ්‍රාහ්මණයා</u>

පුබ්බෙනිවාසං යො’වෙදි සග්ගාපායං ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි
සබ්බවොසිතවොසානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

තමන්ගේ පෙර භවයන් ගැනද, දිව්‍ය ලෝක ගැනද, අපායන් ගැනද, නුවණින් දැක ගත්
නැවත ඉපදීම නැතිකළ, විශිෂ්ඨ අවබෝධයට පත්වූ,
කළයුතු සියල්ල සිදුකර උතුම් අරහත්වයට පත්වූ
ඒ ඔහුට මම ‘බ්‍රාහ්මණයා’ යයි කියමි.

9.සහස්‍ර වග්ගය

1.මිනී මරුවෙක්

සහස්සම්පි චෙ වාචා අනත්‍ථපදසංහිතා
එකං අත්‍ථපදං සෙය්‍යො යං සුත්‍වා උපසම්මති

සත්පුරුෂයෙක් නොවන කෙනෙකුගේ ප්‍රයෝජනයක් නැති හිස් වචන දහසක් අසනවාට වඩා ප්‍රඥාවන්තයෙක්ගෙන් අසන එක අර්ථවත් වචනයක් නිසා සංසිඳීමට පත්වන්නේය.

2.දාරුචීරිය ස්ථවිරයන් වහන්සේ

සහස්සම්පි චෙ ගාථා අනත්‍ථපදසංහිතා
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්‍වා උපසම්මති

සත්පුරුෂයෙක් නොවන කෙනෙකුගේ ප්‍රයෝජනයක් නැති හිස් දේශනා දහසක් අසනවාට වඩා ප්‍රඥාවන්තයෙක්ගෙන් අසන එක අර්ථවත් ධර්ම පදයක් නිසා සංසිඳීමට පත්වන්නේය.

3.කුණ්ඩලකේසී ස්ථවිරාවෝ

යො චෙ ගාථාසතං භාසෙ අනත්‍ථපදසංහිතං
එකං ධම්මපදං සෙය්‍යො යං සුත්‍වා උපසම්මති

යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ
එකඤ්ච ජෙය්‍ය අත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො

සත්පුරුෂයෙක් නොවන කෙනෙකුගේ ප්‍රයෝජනයක් නැති හිස් දේශනා සියයක් අසනවාට වඩා ප්‍රඥාවන්තයෙක්ගෙන් අසන එක අර්ථවත් ධර්ම කරුණක් නිසා සංසිඳීමට පත්වන්නේය.

යම් කෙනෙක් මිනිසුන් දහසක් සමග සටන් කරලා ඒ දහසම දිනා ගන්නවාට වඩා තමන්ගේ සිත සමග සටන් කර ඒ සිත කෙලෙස් වලින් මුදවා පිරිසිදු කර ගැනීමෙන් තමයි ඒකාන්තයෙන්ම ඔහුගේ යුධ ජයග්‍රහණය බැබලෙන්නේ.

4.බමුණකු ඇසූ ප්‍රශ්නයෙක්

අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො

නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහ බ්‍රහ්මුනා
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනො

තමන් දිනා ගැනීමට හැකිවූ ප්‍රඥාවන්තයා තම මනස, කය, භාෂාව ප්‍රගුණ කරමින් ප්‍රඥාවෙන් යුක්තව ධාර්මික ජීවිතයක් ගත කිරීම නිසා මහත් ගෞරවයට පාත්‍ර වේ.

එබඳු උතුම් මිනිසාව දිනුම් පැරදුම් නිසා කවර තරමක හෝ කම්පාවක් කරවීමට දෙවියෙකුට හෝ ගන්ධබ්බයෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ හැකි වන්නේ නැහැ.

5.ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ මාමා

මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං
එකඤ්ච භාවිතත්තානං මුහුත්තම්පි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං

අවුරුදු සියයක් පුරා සෑම මාසයකම එක හා සමාන ප්‍රමාණයකින් දහස් ගණන් දේ පරිත්‍යාග කරමින් සිදුකරන පූජාවන්ට වඩා, එක ක්ෂණයක් තුල තමන්ගේ සිත හෝ කය ''මමය-මගේය-මගේ ආත්මයයි'' යන දෘෂ්ඨියෙන් බැහැර කර සිත නිදහස් කිරීම නමැති කුසලය වඩවා ගනිමින් සිදුකරන පූජාව තමයි ශ්‍රේෂ්ඨ වෙන්නේ.

6.ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේගේ බෑනා

යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං මුහුත්තම්පි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං

අවුරුදු සියයක් පුරා වනයේ හැසිරෙමින් ගිනි දෙවියන් පුදමින් සිදුකරන පූජාවන්ට වඩා එක ක්ෂණයක් තුල තමන්ගේ සිත හෝ කය ''මමය-මගේය-මගේ ආත්මයයි'' යන දෘෂ්ඨියෙන් බැහැර කර සිත නිදහස් කිරීම නමැති කුසලය වඩවා ගනිමින් සිදුකරන පූජාව තමයි ශ්‍රේෂ්ඨ වෙන්නේ.

7.<u>ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ යහළුවෙක්</u>

යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො
සබ්බම්පි තං න චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යා

මේ ලෝකයා විසින් පින් බලාපොරොත්තුවෙන් සිදුකරන පුද පූජා, දාන, පරිත්‍යාග, යන ඒ සියල්ලේම පින් එකට ගත්තද, සියලු කෙලෙස් දුරු කර නිර්වාණය අවබෝධ කරගත් උත්තමයෙකුට සිදුකරන නමස්කාරයෙන් ලැබෙන පිනෙන් හතරෙන් එක කොටසක් තරම්වත් ඒ පින සැලකෙන්නේ නැහැ.

8.<u>ආයු වැඩෙන සැටි</u>

අභිවාදනසීලිස්ස නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණො සුඛං බලන්ති

අභිවුර්ධියට පත්වූ ගුණවතුන්ට නිතර නමස්කාර කරන කය වචනය සංවර කරගත් කෙනාට ආයුෂ, යසස, සැපවත් බව සහ ආනුභාවය යන ගුණයන් වැඩේ.

9.<u>සංකිච්ච ස්ථවිරයන් වහන්සේ</u>

යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො
එකාහං ජීවිතා සෙය්‍යො සීලවන්තස්ස ඣායිනොති

සිහි නුවණින් කටයුතු නොකරමින් එකඟ වූ සිතක් නොමැතිව සිල්වත් බවින් තොරව අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා සිහි නුවණින් කටයුතු කරමින් එකඟ වූ සිතක් ඇතිකරගෙන සිල්වත්ව එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

10.<u>ඛාණුකොණ්ඩඤ්ඤ සථවිරයන් වහන්සේ</u>

යො ච වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො පඤ්ඤාවන්තස්ස ඣායිනොති

සිහි නුවණින් කටයුතු නොකරමින් එකඟ වූ සිතක් නොමැතිව ප්‍රඥාවෙන් තොරව අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා සිහි නුවණින් කටයුතු කරමින් එකඟ වූ සිතක් ඇතිකරගෙන ප්‍රඥාවන්තව එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

11.<u>බෙල්ල කපාගැණීමට තැත් කළ භික්ෂු</u>

යො ච වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හන්ති

කාමයට ඇති ගිජු කම නිසා තමන් තුල ඇති කෙලෙස් දුරු කිරීමට වීර්යය නොකරමින් අලසව අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා තමන් තුල ඇති කෙලෙස් දුරු කිරීම සඳහා බලවත් ලෙස වීර්යය කරමින් එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

12.<u>පටාචාරාවට සිදු වූ විපත</u>

යො ච වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයන්ති

තමන් තුල ඇතිවන ඇලීම් ගැටීම් වල හටගැනීම්- වැයවීම් දෙස නුවණින් නොබලමින් අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා තමන් තුල ඇතිවන ඇලීම් ගැටීම් වල හටගැනීම්- වැයවීම් දෙස නුවණින් බලමින් එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

13.<u>කිසාගෝතමියගේ පුණ්‍යබලය</u>

යො ච වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදන්ති

අමුර්ත වන නිර්වාණය නුවණින් නොදකිමින් හෙවත් සෝවාන් ඵලයට පත් නොවී අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා සෝවාන් ඵලයට පත්වී එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

14.<u>බොහෝ දූ පුතුන් ලැබූ මෙහෙණ</u>

යො ච වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමන්ති

නිර්වාණය සාක්ෂාත් කර නොගනිමින් හෙවත් රහත් ඵලයට පත් නොවී අවුරුදු සියයක් ජීවත්වනවාට වඩා රහත් ඵලයට පත් වී එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ වේ.

10.<u>පාප වර්ගය</u>

1.<u>වුලේකසාටක බ්‍රාහ්මණයා</u>

අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ
දන්ධං හි කරොතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො

පාපයන්ගෙන් වළක්වා ගැනීමට අපහසු සිත වේගයෙන් යහපත කරා යෙදිය යුතුයි.
පින් කිරීමට සිත සෙමෙන් ක්‍රියා කලත්, පාපයන් දෙස ඉතා සතුටින් ඇලේ.

2.<u>සෙය්‍යසක ස්ථවිරයන්ගේ අනභිරතිය</u>

පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො

දුකින් කම්පා වෙන පාප ක්‍රියා සිදුකරන පුද්ගලයා නැවත නැවත දුකින් පෙළීමට සිදුවෙන බව දන්නේ නැහැ. දුකින් කම්පා වීමට කැමැත්ත නැති වුනත්, සිදුකරන පාපයන් ඔහුට මහත්වූ දුකක් අත් කරදෙනවා.

3.<u>පොරි දූන් ගැහැණියක්</u>

පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙතං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො

කරන පින් කම් ක්‍රියා නිසා නැවත නැවත ස්ථිරවම යහපත් ප්‍රතිඵල ලැබෙන බව දන්නවා.
එවැනි කැමැත්තෙන් කරන පින්කම්, ඔහුට මහත් වූ සැපයක් අත් කරදෙනවා.

4.<u>අනාථපිණ්ඩිකසිටානන්ගේ උදාර අදහස</u>

පාපො’පි පස්සති භද්‍රං යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති
භද්‍රො’පි පස්සති පාපං යාව භද්‍රං න පච්චති
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති

කෙනෙකු විසින් කරන පාපී ක්‍රියා වලට දුක් විපාක විඳින්න නොලැබෙන තාක් කල් ඔහු ඒ පව් කම් දකින්නේ සැපයි සුබයි ලෙස. ඔහුට එහි දුක් විපාක ලැබෙන්න පටන් ගත් දා සිට තමයි ඔහු දකින්නේ ඔහුගේ ඒ ක්‍රියා අයහපත් ක්‍රියා විදියට.

කෙනෙකුට කරන්න සිදුවෙන යහපත් ක්‍රියා වලට සැප විපාක විඳින්න නොලැබෙන තාක් කල් ඔහු ඒ යහපත් ක්‍රියා දකින්නේ දුකක්, කරදරයක් ලෙස.
ඔහුට එහි සැප විපාක ලැබෙන්න පටන් ගත් දා සිට තමයි ඔහු දකින්නේ ඔහුගේ ඒ ක්‍රියාව ඔහුට යහපතක් ගෙන දුන් ක්‍රියා ලෙස.

5.<u>පිරිකර තැන තැන දැමූ මහණෙක්</u>

මා අවමඤ්ඤෙථ පාපස්ස න මං තං ආගමිස්සති
උදබින්දුනිපාතෙන උදකුම්භො'පි පූරති
පූරති බාලො පාපස්ස ථොකථොකම්පි ආචිනං

මම කරා ඒ විපාකය නොඑනවා යයි තමන් කරන පවු කම් ගැන පහත් කොට සලකන්න එපා. දිය කලය පිරෙන්නේ ජලය බින්දුවෙන් බින්දුව වගේ අඥානයා හට ටිකෙන් ටික පවු රැස් වෙනවා.

6.<u>බළල් පා ඇති සිටුවරයා</u>

මා අවමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති
උදබින්දුනිපාතෙන උදකුම්භො'පි පූරති.
පූරති ධීරො පුඤ්ඤස්ස ථොකථොකම්පි ආචිනං

මට මෙයින් ඇති ප්‍රයෝජනයක් නැතැයි සිතමින් තමන් කරන යහපත් ක්‍රියා ගැන අවතක්සේරු කොට සලකන්න එපා. දිය කලය පිරෙන්නේ ජලය බින්දුවෙන් බින්දුව වගේ ප්‍රඥාවන්තයා හට ටිකෙන් ටික පින් රැස් වෙනවා.

7.<u>ධනවත් වෙළෙන්දෙක්</u>

වාණිජො'ව භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො
විසං ජීවිතුකාමො'ව පාපානි පරිවජ්ජයෙ

මහා ධනවත් වෙළෙන්දෙක් සොරුන්ගෙන් කරදර ඇති වේවි යයි යන බිය නිසා තමන්ගේ ආරක්ෂාව පිණිස තමන්ගේ බලය පිටට නොපෙනීමට පිරිස අඩු කර මහ මග ගමන් ගන්නා සේ,
ජීවත්වෙන්න ආසාව තියන කෙනෙක් විෂ වර්ග වලින් ඈත් වෙනවා සේ,
අකුසල් විපාක වලට බිය කෙනා තමන්ගේ පාප ක්‍රියා වහා දුරු කරනවා.

8.කුක්කුටමිත්‍ර

පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං
නාබ්බණං විසමන්වෙති නත්‍ථි පාපං අකුබ්බතො

අතෙහි තුවාල ඇති කෙනෙක්ට තමන්ගේ අතින් අල්ලාගෙන විෂ ද්‍රව්‍යයක් ගෙනයන්න බැහැ. හේතුව නම් ඒ විෂ ඉතා ඉක්මණින් තුවාල ඔස්සේ ශරීරයට ඇතුළු වන නිසයි.
ඒ ආකාරයට තමන් තුල රාග-ද්වේශ සිතිවිලි පවතින කෙනා සිදුකරන කුමන ක්‍රියාවකින් වුවත් තමන්ට ඕනෑම මොහොතක අකුසල් ඇති විය හැකියි.
නමුත් තුවාලයක් නැති අතට විෂ නිසා හානියක් වෙන්නේ නැහැ වගේ,
කෙනෙක් තුල රාගය-ද්වේශ සිතිවිලි නැත්නම් ඔහු තුල අකුසල් චේතනාව නොමැති නිසා ඒ කෙනා විසින් සිදු කරන ක්‍රියා නිසා ඔහුට අකුසල් ඇති වීමක් සිදු වෙන්නේ නැහැ.

9.කෝක නම් බලුවැද්දා

යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතං'ව ඛිත්තො

යම් කෙනෙක් දූෂ්‍ය වූ සිතින් උතුම් සිල්වත් කෙනෙකුට කුඩා හෝ නපුරක් සිදු කළහොත් ඒ අඥානයා පසු පස අකුසල විපාකය එන්නේ,
හමන සුළඟකට විසිකරන ලද කුඩා කුණු කැබලි නැවත තමන් කරාම පැමිණෙන ආකාරයටයි.

10.මැණික්කරු කළ අපරාධය

ගබ්භමෙකෙ'පපජ්ජන්ති නිරයං පාපකම්මිනො
සග්ගං සුකතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවාති

වරින් වර මිනිස් මවුකුසකට පැමිණෙන දීර්ඝ සංසාරයේ ගමන් කරන සත්වයන්,
මනුෂ්‍යයෙකු ලෙස ඉපදී අකුසල් ක්‍රියා සිදු කරමින් නැවත නැවත ප්‍රේත-අසුර-තිරිසන්-නිරය යන සතර අපා දුගතියටද,
කුසල් ක්‍රියා සිදු කරමින් නැවත මනුෂ්‍ය-දිව්‍ය-බ්‍රහ්ම ලෝක යන සුගතින්ටද, යනවා සේම,
තණ්හා-දෘෂ්ඨි-මාන යන කෙලෙස් වලින් මිදී "මමය-මගේය-මගේ ආත්මයයි" යන හැඟීම නැති කරගන්නා කෙනා, නැවත කිසිදු ලෝකයක් තුල නූපදින සේ පරිනිර්වාණයටද, පත් වී ඒ දුක්ඛිත සසර ගමන කෙලවර කරගනු ලබන්නේය.

11.<u>**කර්ම්විපාකය පසුපස යන සැටි**</u>

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතී සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා

අහසෙහි හෝ සමුද්‍රය මධ්‍යයේ හෝ ගල් ගුහාවක හෝ වෙනත් කිසිම භූමි ප්‍රදේශයක් හෝ නැහැ, කෙනෙකුට තමන් සිදුකල පාප ක්‍රියාවෙන් නිදහස් වී සිටීමට.

12.<u>**සුප්‍රබුද්ධ ශාක්‍යයා**</u>

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු

අහසෙහි හෝ සමුද්‍රය මධ්‍යයේ හෝ ගල් ගුහාවක හෝ වෙනත් කිසිම භූමි ප්‍රදේශයක් හෝ නැහැ, යම් සුළු හෝ හේතුවක් නිසා කෙනෙකුට මාරයාගෙන් ගැලවී සිටීමට.

11.සුඛ වග්ගය

1.ශාක්‍ය - කොලියයන්ගේ දියදබරය

සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො

සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා

සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකා

වෛරී සහගත බවින් මිදී අවෛරී වීමෙන් ඇතිවන්නේ ඉතා සුවපත්වූ සැපවත් වූ දිවි පැවැත්මකි.
'අනිච්ච-දුක්ඛ-අනත්ත' ගැන අවබෝධය තුලින්, සිත අවිද්‍යාවෙන් මුදවාගෙන උතුම් බවට පත් වී වෛරයෙන් මිදී අවෛරීව ජීවත් වන්න.

'රාග-ද්වේෂ-මෝහා' දී කෙලෙස් වලින් මිදී නිකෙලෙස් වීමෙන් ඇතිවන්නේ ඉතා සුවපත්වූ සැපවත් වූ දිවි පැවැත්මකි.
'අනිච්ච-දුක්ඛ-අනත්ත' ගැන අවබෝධය තුලින්, සිත අවිද්‍යාවෙන් මුදවාගෙන උතුම් බවට පත් වී 'තෘෂ්ණා-දෘෂ්ඨි-මාන' දුරු කර නිකෙලෙස්ව ජීවත් වන්න.

"මමය-මගේය-මගේ ආත්මය" යනුවෙන් ඇතිකරගෙන සිටින උපාදානය අත් හැරීමෙන් ඇතිවන්නේ ඉතා සුවපත්වූ සැපවත් වූ දිවි පැවැත්මකි.
අනිච්ච-දුක්ඛ-අනත්ත ගැන අවබෝධය තුලින්, සිත අවිද්‍යාවෙන් මුදවාගෙන උතුම් බවට පත් වී "මමය-මගේය-මගේ ආත්මය" යනුවෙන් ඇතිකරගෙන සිටින උපාදානය දුරු කර නිකෙලෙස්ව ජීවත් වන්න.

2.මරහු කළ නපුරු වැඩෙක්

සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා

නැති කිසිවක් නිසා ශෝක නොකරන නිසා ඇතිවන්නේ ඉතා සුවපත්වූ සැපවත් වූ දිවි පැවැත්මකි.
ආභස්සර දෙවියන්ට ප්‍රීතිය ආහාරක් කොට පවතින්නා සේ, මා හට ඒ සැපය ආහාරයක් වන්නේය.

3.කොසොල් රජුගේ පරාජය

ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයන්ති

ජයග්‍රහණය නිසා වෛරයද, පරාජය නිසා දුකද, යන අකුසල් හට ගනියි.
සංසිඳීමට පත්වී සුවපත් වූ කෙනා ඒ ජය පරාජය දෙකම බැහැර කරයි.

4.කුලදැරියකගේ ආවාහය

නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි
නත්ථි ඛන්ධසමා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛන්ති

රාගය හා සමාන ගින්නක් තවත් නැහැ. ද්වේශය හා සමාන අකුසලයක් තවත් නැහැ.
ස්කන්ධ හා සමාන දුක් ගෙන දෙන වෙනත් දෙයක් තවත් නැහැ.
ශාන්ත වූ නිවණ තරම් සැනසීම ගෙන දෙන වෙනත් දෙයක් තවත් නැහැ.

5.දුප්පතකු ලද සඞ්ග්‍රහයෙක්

ජිඝච්ඡාපරමා රොගා සඞ්ඛාරපරමා දුඛා
එතං ඤත්වා යථාභූතං නිබ්බාණපරමං සුඛං

බඩගින්න තරම් රෝගයක් තවත් නැහැ. තණ්හාව නිසා සිතේ හදාගන්න සිතිවිලි තරම්
දුක් ගෙන දෙන වෙනත් දෙයක් තවත් නැහැ.
ඒ යථා ස්වභාවය අවබෝධකරගෙන නිර්වාණය අවබෝධ කරගැනීම තමයි, උතුම්ම
සැපය ලබාගැනීම.

6.කොසොල් රජ සුවපත් වූ සැටි

ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨීපරමං ධනං
විස්සාසපරමා ඤාතී නිබ්බාණපරමං සුඛං

නිරෝගී බව තමයි උතුම්ම ලාභය, සතුට තමයි උසස්ම ධනය,
විශ්වාසය තමයි උතුම්ම ඥාතිත්වය, නිර්වාණය තමයි උතුම්ම සැපය.

7.<u>තිස්ස ස්ථවිරයන් වහන්සේ</u>

පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබන්ති

උතුම් කාය චිත්තාදී විවේකයේ සමවැදුණු, සංසිඳීමට පත්වී සියලු අකුසල් ද දුරු කළ නිසා තවදුරටත් කෙලෙස් තැවීමක්ද නැති
උතුම් කෙනා ධර්මය අරමුණුකොට උපන් ප්‍රීතිය ඇතුව වාසය කරන්නේය.

8.<u>සක්දෙව්දුන් කළ උපස්ථානය</u>

සාහු දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො
අදස්සනෙන බාලානං නිච්චමෙව සුඛී සියා
බාලසඞ්ගතචාරීහි දීඝමද්ධාන සොචති
දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙනෙව සබ්බදා
ධීරො ච සුඛසංවාසො ඤාතීනං’ව සමාගමො

තස්මාහි,
ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච
ධොරය්හසීලං වතවන්තමරියං
තං තාදිසං සප්පුරිසං සුමෙධං
භජෙථ නක්ඛත්තපථං’ව චන්දිමාති

යහපත් උතුම් අය දැකීම, එවැනි අය හා එක්ව විසීම, හැම කල්හිම සුවය ඇති කරන්නේය.
අඥානයන් නොදැකීම, ස්ථිර සැපවත් ජීවිතයක් ලැබීමට හේතු වන්නේය.

අඥානයන් හා එක්ව විසීම දීර්ඝ කාලයකට ශෝක කිරීමට හේතුවන්නේය.
අඥානයෙක් හා විසීම නිසා සදාකාලයටම සතුරන් ඇති වීම සිදු වන්නේය.
ප්‍රඥාවන්තයන් හා එක්ව විසීම තමන්ගේ පවුලේ අය සමග එක්වීම හා සමාන වන්නේය.

එහෙයින් එබැවින්,
නුවණැති ප්‍රඥාවන්ත බොහෝ ඇසූ පිරූ තැන් ඇති,
ඕනෑම දුකක් උහුලමින් තමන්ගේ ශීලය ආරක්ෂා කරගනිමින් හික්මෙන
එබඳු ඒ මනා ප්‍රඥාවෙන් වාසය කරන සත් පුරුෂයා සේවනය කිරීම නිසා,
එකම ආකාරයට, එකම වේගයෙන් නැකත් තරු අතර ගමන් ගන්නා චන්ද්‍රයා සේ,
තමන්ගේ ජීවිතයද එකම ආකාරයට සංසිඳීමෙන් ගත කිරීමට හැකි වන්නේය.

12.දණ්ඩ වර්ගය

1.සවග මහණුන් කළ හිංසාවක්

සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ

සියලු සත්වයන් දඬුවම් නිසා තැති ගන්නේය,
සියලු සත්වයන් මරණයට භය වන්නේය.
තමන්ද එලෙස දඬුවමකට හෝ මරණයට පත්වීමට අකමැති බව උපමා කරගෙන
අන් සත්වයන්ට හිංසා පීඩා කිරීමෙන්, අන් සත්වයන් නැසීමෙන් වලකින්න.

2.සවගමහණුන්ගේ කෝලාහලයක්

සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ

සියලු සත්වයන් දඬුවම් නිසා තැති ගන්නේය,
ඒ සියලු දෙනා ජීවත් වීමට කැමති වන්නේය.
ඒ ආකාරයටම තමන්ද ජීවත් වීමට කැමති බව උපමා කරගෙන
අන් සත්වයන්ට හිංසා පීඩා කිරීමෙන්, අන් සත්වයන් නැසීමෙන් වලකින්න.

3.ගැරඬියකු මැරූ කුඩා දරුවෝ

සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං

සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛං

යම් සැපයක් ලැබීම සඳහා සත්වයන්, අන්‍යයන්ට හිංසා පීඩා කරන්නේ නම්,
ඒ තමා හට සැප බලාපොරොත්තු වන කෙනාට,
පරලොවෙහිදී වත් ඒ සැපය ලැබෙන්නේ නැහැ.

යම් සැපයක් ලැබීම සඳහා වත් සත්වයන්, අන්‍යයන්ට හිංසා පීඩා නොකරන්නේ නම්,
ඒ තමා හට සැප බලාපොරොත්තු වන කෙනාට, පරලොවෙහිදී ද සැප අත්වේ.

4.<u>**කුණ්ඩධාන ස්ථවිරයන් වහන්සේ**</u>

මා' වොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙය්‍යු තං

ස චෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා
එස පත්තො'සි නිබ්බාණං සාරම්භො තෙ න විජ්ජති

කෙනෙක් කියන ලද නරක වචන වලට පරුෂ වචනයෙන් බැන වැදීම් කරන්න එපා.
එකට එක කිරීම යනු අකුසල උපද්දවා ගැනීමකි.
එකට එක කිරීමෙන් ලැබෙන අකුසල විපාකය තමන් හට දුක් උපදවන්නේය.

යමෙක් එකට එක කිරීම නමැති අකුසල කර්මය කරමින්, නිදොස් වූ තමන් හට දඬුවම් කරගන්නේ නම් ඔහු නිර්වාණය අවබෝධ කර ගැනීමක් ගැන දකින්නට ලැබෙන්නේ නැහැ.

5.<u>**කම් සැප පතා සිල්ගත් උපාසිකාවෝ**</u>

යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාචෙති ගොචරං
එවං ජරා ච මච්චු ච ආයුං පාචෙන්ති පාණිනං

යම්සේ හරකුන් දක්කමින් පසුපසින් ගොපල්ලෙක් හැසිරෙනවා සේ,
සත්වයාගේ ආයුෂ පසුපස වයසට යාම, මරණයද ගමන් කරනවා

6.<u>**ගඳකිළිය දැවූ මිනිසා**</u>

අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති
සෙහි කම්මෙහි දුම්මෙධො අග්ගිදඩ්ඪො'ව තප්පති

පාප ක්‍රියා කරන අඥානයා අවබෝධ කරගන්නේ නැහැ ඒ කරන ක්‍රියාවේ භයානක බව.
ඒ අඥානයා ඒ ක්‍රියාව සිදුකළාට පසුව ගින්නෙන් දැවෙනවා සේ තැවෙනවා.

7.<u>**මහමුගලන් මහතෙරුන්ගේ පිරිනිවීම**</u>

යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති

වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං
ගරුකං වාපි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ

රාජතො වා උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං

අථ වාස්ස අගාරානි අග්ගි ඩහති පාවකො
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති

කිසිවෙකුට හිංසා පීඩා නොකරන, දූෂිත නොවූ සිත් ඇති කෙනෙකුට සිදුකරන විරුද්ධ වාදී කම් හෝ හිංසා පීඩා නිසා දස විධ ආකාර දුක් විඳීමට සිදුවන නිරයන් අතරින් එක්තරා ස්ථානයකට වහාම පත්වී දුක් විඳීමට සිදුවෙනවා.

මරණයෙන් පසුද ඉතා නපුරු දුක් කරදර විඳීම්ද, බරපතල වූ ලෙඩ දුක් ආබාධද, මානසික ආබාධද පමුණුවා ගනු ලබනවා.

රජුන් ගෙන් දඬුවම් ලැබීමට ලක්වීම් වැනි විපත් හෝ බලවත් අසත්‍ය චෝදනා වලට ලක්වීම්, අඹුදරු ඥාති අහිමි වීම්, භෝග සම්පත් විනාශ වීම්, වැනි දේ වලට මුහුණ පෑමටද සිදුවෙනවා.

එවැනි ක්‍රියා සිදු කරන කෙනාගේ ගෘහ ජීවිතය දුක් ගිනිවලින් දැවෙනවා.
ඒ අඥානයා කය බිඳී නිරයට පමුණුවනවා.

8.<u>බොහෝ පිරිකර ඇති මහණෙක්</u>

න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං

නිර්වස්ත්‍රව හැසිරෙමින් රකින සීලයකින්වත්,
තලප්පාවක් හිස පැළඳ රකින සීලයකින්වත්,
ශරීරය පිරිසිදු නොකරමින් රකින සීලයකින්වත්,
පොලව මත දමන ආහාර පාන ගනිමින් හිස් පොලව මත වැතිර සිටිමින් රකින සීලයකින්වත්,
කුණු තට්ටුවලින් වැසුණු පිරිසිදු නොකරන ලද ශරීරය ඇතිව තනි කකුලෙන් හිටගෙන ඉඳිමින් රකින සීලයකින්වත්,
ශුද්ධ වීමට ක්‍රියා කරන මිනිසාට, එතෙර වීමක් නැති බවට සැකයක් නැහැ.

9.<u>සන්තති මහාමාත්‍යයෝ</u>

අලඞ්කතො චෙ’පි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු

සන්සුන්ව හික්මෙමින් ඒකාන්තව බ්‍රහ්ම චරියාවේ හැසිරෙමින් සිත්ගන්නා සුළු ආකාරයට එක හා සමානව වාසය කරන
ඒ පැවිද්දන් බ්‍රාහ්මණයන් වේ, ශ්‍රමණයන් වේ.

10.<u>හිඟන්නකු පැවිදි කිරීම</u>

හිරීනිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති
යො නිඳ්දං අපබොධති අස්සො භද්‍රො කසාමිව

අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච
සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං

පවට ඇති ලැජ්ජාව නිසා තමන් තුල පහත් සිතිවිලි ඇතිවීම වලක්වා ගත හැකි
යම් කෙනෙක් මේ ලෝකය තුල විද්‍යාමාන වේ නම්,
ඒ තමන්ව නින්දාවෙන් වලක්වාගැනීමේ අවබෝධය,
කසයෙන් මෙල්ල කරන අසෙකු සේ ඔහුව හික්මවන්නේය.

යම් සේ කසය පාවිච්චි කරමින් අශ්වයා හසුරුවමින් හික්මවාගන්නා සේ
කෙලෙස් තවන වීර්යය ඇති කෙනා සංසාරය ගැන කලකිරීමෙන්
ධර්මය කෙරෙහි ඇති කරගත් ශ්‍රද්ධාවද,
ඉන්ද්‍රියයන් හික්මවාගනිමින් ඇති කරගත් ශීලයද,
අධික වීර්යයද ඇතිව සිත එකඟ කරගනිමින්,
ඒ ඒ වර්ථමාන මොහොතේ සිතට එන අරමුණු නුවණින් මෙනෙහි කරමින්ද,
වඩවා ගන්නා ප්‍රඥාවට අනුව මනා ප්‍රඥාවෙන් යුතුව හැසිරෙමින්ද,
මෙතෙක් කාලයක් විඳි අධික දුක් දුරු කරන්නේය.

11.සුඛ සාමණේරයෝ

උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතා

ගොවියා තමන්ගේ වගාව සාර්ථක කරගැනීමට, ගංගා ඇලදොළ වලින් නිවැරදි ආකාරයට කුඩා දිය පහරවල් සකසමින් වතුර ගෙනයයි.
ඊතල සාදන්නා නිවැරදි ආකාරයට රත්කරමින් ඊතලය ඉතා කෙලින් සිටිනසේ සකස් කරයි.
ලී වඩුවා නිවැරදි ආයුධ භාවිතා කරමින් මනාසේ ලී බඩු සකස් කරයි.
මනා පැවතුම් ඇති කෙනා තමන්ව හික්මවා ගනියි.

13.ජරා වග්ගය

1.රා බීමත්ව නැටූ ගෑණු

කො නු හාසො කිමානන්දො නිච්චං පජ්ජලිතෙ සති
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙස්සථ

කවර සිනහවක්ද නිතර රාගයෙන් ද්වේශයෙන් ඇවිලෙන සිහියකින් යුතු නම්.
අවිද්‍යාව නමැති අඳුරින් වැසීගිය එවැන්නන්,
ඒ අඳුරින් මිදී තම ජීවිතවලට සැනසීම නමැති ආලෝකය සොයාගන්නේ නැහැ.

2.සිරිමාවන්ගේ මළ සිරුර

පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති

කෙලෙස් වලින් පිරි සිතිවිලි නිසා 'මගේ' යනුවෙන් හඳුන්වාගන්නා,
එහෙත් කිසිදු ස්ථිර පැවැත්මක් නැති, වර්ණනා කරමින් ගෞරව කරන අශුචියෙන් පිරුණු ඔබේ ඔය කුණු ශරීරය දෙස බලන්න.

3.උත්තරා මෙහෙණ

පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඪං පභඞ්ගුරං
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං

බොහෝ රෝග පීඩා වලට වාසස්ථානයක් වන, වහා බිඳෙන සුළු වන, පිරිහීමට ලක්වෙන රූපයක් ඇති, නව දොරකින්ම අශුචි වැගිරෙන සතර මහා භූතයන්ගෙන් සෑදුනු මේ කය බිඳී ජීවිතය මරණයෙන් කෙලවර වෙනවා.

4.මිනී ඇටවල ඇලුනු මහණෝ

යානිමානි අපත්ථානි අලාබූනෙව සාරදෙ
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති

යම් මේ විනාශයට පමුණුවනු ලැබූ කිසිම ප්‍රයෝජනයක් නැති ලබු කබල් වැනි හිස් කබල් සහිත අළු පාට ඇටසැකිලි දැක කුමන කාමයක් හට ගන්නද.

5.රූපනන්දා

අට්ඨීනං නගරං කතං මංසලොහිතලෙපනං
යත්‍ථ ජරා ච මච්චු ච මානො මක්ඛො ච ඔහිතො

ලේ මස් නහර වලින් වසාගත් ඇට ගොඩකින් සෑදී ඇති ශරීරය නමැති නගරයට වයසට යාමද මරණයද උරුම වූව ද, මාන්නය සහ ගුණමකු බව එහි ගැබ්වී තිබෙනවා.

6.මල්ලිකා දේවිය ගෙතූ බොරුව

ජීරන්ති වෙ රාජරථා සුචිත්තා
අථො සරීරම්පි ජරං උපෙති
සතඤ්ච ධම්මො න ජරං උපෙති
සන්තො හවෙ සබ්භි පවෙදයන්ති

කොතරම් මනාසේ විසිතුරු කරන ලද රජුගේ රථයද දිරීමට ලක්වෙනවා.
තමන්ගේ ශරීරය දිරාවට පත්වෙන්නෙත් ඒ ලෙසටමයි.
සිහිය එළඹ සිටින අයගේ කිසිවක් දිරීමට පත්වෙන්නේ නැති බව
ඒකාන්තයෙන්ම සංසිඳුණු සත්පුරුෂයන් විසින් ප්‍රකාශ කරනවා.

7.ලාලුදායි තෙරුන්ගේ බණ

අප්පස්සුතායං පුරිසො බලිවද්දො'ව ජීරති.
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති

බොහෝ ඇසූපිරූ තැන් නැති පුරුෂයා තැන තැන බුදිමින් ඒ මේ අත හැසිරෙමින්
ගොනෙකු සේ ජීවත්වෙමින් දිරීමට පත්වෙනවා.
ඔහුගේ ඇඟේ මස් වැඩුනත්, ඔහු තුල ප්‍රඥාව වැඩෙන්නේ නැහැ.

8.බුදුරජානන් වහන්සේගේ උදන් ඇනුමක්

අනෙකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං

ගහකාරක දිට්ඨොසි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා

නොයෙකුත් ආකාරයේ ප්‍රතිසන්ධීන් ලබමින්, නැවත නැවත දුකම උරුම කරදෙන සංසාරය පුරා ඇවිදිමින්, ඒ පීඩාවෙන් මිදී නිදුක් වීම සඳහා ඒ මාව පෙලන්නා සෙව්වෙහිය.

මම ඒ පෙලන්නා දුටුවෙහිය. නැවත ‘මම’ යයි කවරක්වත් උපාදානය නොකරන්නේය.
‘සුබයි-සැපයි’ ලෙස උපාදානය කර සිටි සියල්ල කෙරෙහි කලකිරී,
ඒ උපාදානය කර සිටි හේතුව වන,
‘මම’ය යන හැඟීමෙන් ඇතිකරගත් තණ්හා-දෘෂ්ඨී-මානයන් සිඳ දා,
තෘෂ්ණාව මුළුමනින්ම දුරුකර, මධ්‍යස්ථ බවට පත්වුනෙහිය.

9.<u>ධනවතකු හිඟන්නකු වීම</u>

අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං
ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ

අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං
සෙන්ති චාපා’තිඛිත්තා’ව පුරාණානි අනුත්ථුනං

යෞවන වයසේදී ලැබිය හැකිව තිබූ ඉහලම වටිනා සම්පත වන, බ්‍රහ්ම චරියාවේ හැසිරීම අහිමි කරගත් මහල්ලා, මහලු වියේදී යම්කිසි ශීලයක් වෙනුවෙන් යයි පවසමින් ලිංගික ක්‍රියාකාරකම්වලින් වැළකී සිටීම, මාළුන් හිඳුනු වතුර වලක් දෙස බලාගෙන තපස් රකිනවා යයි පවසන වයසට ගිය කොකෙක් වැනිය.

යෞවන වයසේදී ලැබිය හැකිව තිබූ ඉහලම වටිනා සම්පත වන බ්‍රහ්ම චරියාවේ හැසිරීම අහිමි කරගත් මහල්ලා, තමන්ට අතපසුවූ දේ ගැන දුක්වෙන්නේ, තැවෙන්නේ, යුද්ධයට යාමට පෙර දුනු මුවහත් කර ගැනීමට නොහැකිවූ සේනා භටයෙක් ශෝක කරන්නා සේය.

14.<u>අත්ත වර්ගය</u>

1.බෝධිරාජ කුමාරයන්ට දූ පුතුන් නො ලැබීමේ හේතුව

අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො

තමන් උසස් බවට පත්වීමට කැමති, තමාගේ ඉන්ද්‍රියයන් මනාව හික්මවාගත්, ප්‍රඥාවන්තයා එතෙර වීමේ අධිෂ්ඨානය පෙරදැරිව රාත්‍රී යාමයන්හි ද කෙලෙස් දුරු කිරීම පෝෂණය කරයි.

2.උපනන්ද තෙරුන් සිවුපසය සැපයූ සැටි

අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො

පළමු කොට තමන් යහපත්වී නිවැරදිව වාසය කරන ප්‍රඥාවන්තයා
වෙනත් අන් මනුෂ්‍යයන්ව වැරදි සඳහා යොමු කරන්නේ නැහැ.

3.පධානික තෙරුන්ගේ බණ

අත්තානඤ්චෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති
සුදන්තො වත දම්මෙථ අත්තා හි කිර දුද්දමො

යම්සේ අන් අයට අනුශාසනා කරන කෙනා තමන්ගේ පැවැත්ම ඒ නිවැරදි ආකාරයෙන් සකස් කරගෙන පළමුව තමන්ව පිදිය යුතුයි.
හික්මවීමට අපහසු තමන්ව දමනය කරගනිමින් තමන්ව මනාසේ හික්මවා ගන්න.

4.කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ

අත්තා හි අත්තනො නාථො කො හි නාථො පරො සියා
අත්තනා’ව සුදන්තෙන නාථං ලභති දුල්ලභං

තමන් හට තමන්ගේ පිහිට මිස අන්‍ය අයගෙන් කවර පිහිටක්ද වන්නේ,
තමන්ව හික්මවා ගැනීමට හැකිවීම තමයි ලැබිය හැකි දුර්ලභම පිහිට වන්නේ.

5.<u>මහාකාලයාට වූ විපත</u>

අත්තනා’ව කතං පාපං අත්තජං අත්තසම්භවං
අභිමත්ථති දුම්මෙධං වජිරං’වස්මමයං මණිං

තමන් තුල පවතින දැඩි තෘෂ්ණාව නිසා හටගන්නා රාග- ද්වේෂ සිතිවිලිවලට අනුව පවු කම් සිදුකරන අඥානයා අන් අයගේ ජීවිත විනාශ කරන්නා සේම තමන්ගේම විනාශයද ඇතිකරගන්නේ, අනිකුත් මැණික් කපා දැමීම මෙන්ම දියමන්තියක් කපා දැමීමද දියමන්තියක් විසින්ම සිදුකරන විලාශයෙනි.

6.<u>දේවදත්ත තෙරුන්</u>

යස්ස අච්චන්තදුස්සීල්‍යං මාලුවා සාලමිවොතතං
කරොති සො තථත්තානං යථා නං ඉච්ඡතී දිසො

සල් ගසක් වෙලා ගෙන සිටින, මාළුවා වැලක් ඒ ගසේ ඵලයට මෙන්ම ගසටද හානිකරන්නා සේ යමෙකුගේ දුසිල්වත් බව ඒ ඔහුට හානි කරන්නේය.
සතුරෙක් තමන්ට සිදු කරන හානි වලට කැමැත්තෙන් ඒ සතුරා සමගම සිටිනවා සේ, ඔහු තමන්ගේ ඒ දුසිල්වත් බව එලෙසම පවත්වා ගන්නේය.

7.<u>දේවදත්ත තෙරුන් කළ ප්‍රකාශයෙක්</u>

සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච
යං වෙ හිතඤ්ච සාධුං ච තං වෙ පරමදුක්කරං

තමන්ට අහිත පිණිස පවතින දේ කිරීම ඉතා පහසුයි.
තමන්ට ඒකාන්තයෙන්ම අභිවුර්ධිය සැලසෙන හිතසුව පිණිස යහපත සලසා ගත හැකි යමක් වේද එය ඒකාන්තයෙන්ම ඉතා දුෂ්කරවේ.

8.<u>කාල තෙරුන්</u>

යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලති

ධාර්මික ජීවිතයක් ගතකිරීම සඳහා අනුශාසනා කරන බුද්ධා දී ආර්යයන්ගේ අවවාද ප්‍රතික්ෂේප කරන අඥානයා ඔහු විසින්ම ගොඩනගා ගත් වැරදි දෘෂ්ඨිය නිසා විනාශ වන්නේ, උණ ගසෙහි හට ගන්නා ඵලය විසින් ඒ උණගස විනාශ කරන්නා සේය.

9.<u>චූලකාල උපාසක තැන</u>

අත්තනා’ව කතං පාපං අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො විසොධයෙ

තමන් විසින් සිදු කරන පවු කම් නිසා තමන්ව අපිරිසිදු වේ.
පාප ක්‍රියා නොකිරීම නිසා තමන් පිරිසිදු වේ.
තමන් තුල ඇති මේ එකිනෙක හා සම්බන්ධ නොවන
පිරිසුදු අපිරිසිදු බව දැන ගන්නා කෙනා තමන්ව පිරිසිදු කර ගනී.

10.<u>අත්තදත්ත ස්ථවිරයන් වහන්සේ</u>

අත්තදත්‍ථං පරත්‍ථේන බහුනාපි න හාපයෙ
අත්තදත්‍ථමභිඤ්ඤාය සදත්‍ථපසුතො සියා

අන්‍යන්ගේ යහපත වෙනුවෙන් බොහෝ දේ නොකළද, තමන්ගේ නිවැරදි යහපත වෙනුවෙන් කටයුතු කරගන්නා කෙනා පිරිහෙන්නේ නැහැ.
ඔහු තමන්ගේ යහපත කුමක් දැයි මනා සේ අවබෝධ කරගෙන ඒ යහපතෙහි යෙදෙන්නෙකු වන්නේය.

15.ලෝක වර්ගය

1.තරුණ භික්ෂූන් වහන්සේ

හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවද්ධනො

පහත් අදහස් ඇති දේවල් ආශ්‍රය කරන්නේ නැහැ, පසුතැවීමට හේතු වෙන දේ සමග වාසය කරන්නේ නැහැ, මිත්‍යා දෘෂ්ඨිකයන් ආශ්‍රය කරන්නේ නැහැ,
ඒ ඔහුට සංසාරය දික්වන්නේත් නැහැ.

2.පිඬු සිඟීම

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච

ධම්මං චරෙ සුචරිතං න නං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච

සුළු හෝ ප්‍රමාදයක් නැතිව උත්සාහවත් වෙමින් යහපත් ගුණ ධර්මයට අනුව හැසිරෙමින් ධර්මයෙහි හැසිරෙන්නාහට මෙලොවදීත් පරලොවදීත් සැප අත්වේ.

ධර්මයට අනුව හික්මෙමින් යහපත්ව හැසිරෙන කෙනා දුස්චරිතව හැසිරෙන්නේ නැහැ. ධර්මයෙහි හැසිරෙන්නාහට මෙලොවදීත් පරලොවදීත් සැප අත්වේ.

3.විදර්ශකභික්ෂූන් වහන්සේ

යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති

දිය බුබුලක් දෙස බලා එහි ඇතිවී පැවතී වහා නැතිවී යන අස්ථිර ස්වභාවය නුවණින් අවබෝධ කරගන්න,
මිරිඟුව දෙස බලා එහි නැති වතුර ඔබට පෙනෙන මායාකාර ස්වභාවය නුවණින් අවබෝධ කරගන්න,
ඒ ආකාරයටම ලෝකයේ ඇති සියල්ල දෙස බලන්න.
ඒ සෑම දෙයක්ම ඇතිවී පැවතී නැතිවී යන අස්ථිර ස්වභාවයත්, ඒ සෑම එකකටම තමන්ගේ ඇති ප්‍රිය අප්‍රිය භාවය වරින් වර වෙනස් වෙන ස්වභාවයත් අවබෝධකර ගෙන ඒවාට ඇති ඇලීම් ගැටීම් වලින් වැළකෙන කෙනාව මාරයා විසින් දකින්නේ නැහැ.

4.<u>අඥයා කිඳා බස්නා තැන</u>

එථ පස්සථිමං ලොකං චිත්තං රාජරථූපමං
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගො විජානතං

මේ සිත නමැති ලෝකය දෙස නොයෙකුත් විසිතුරු දේවලින් අලංකාරවත්ව සරසා ඇති රජුගේ රථයට උපමා කර බලන්න.
සිතට බාහිරින් ඇතුළු කරගන්නා දේ නිසා තමයි සිත පවතින්නේ.
යමක් නිසා ශෝකයට පත්වෙන අඥානයාට අවබෝධයක් නැහැ, තෘෂ්ණාව නිසා ඇතිවන ඇලීම් බැඳීම් නිසා සිත පවතින බව.

5.<u>සම්මුඤ්ජනී ස්ථවිරයන් වහන්සේ</u>

යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො’ව චන්දිමා

පෙර පමාවී හැසිරුණු කෙනෙක් පසුව ධර්මයට අනුව හැසිරෙමින් සුළු හෝ ප්‍රමාදයකින් තොරව කටයුතු කරන්නේ නම්,
ඒ ඔහු වලාකුළු වලින් මිදී අහසෙහි බබලන චන්ද්‍රයා සේ මේ ලෝකයේ ගෞරවයට පාත්‍ර වන්නේය.

6.<u>අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ</u>

යස්ස පාපං කතං කම්මං කුසලෙන පිථීයති
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො’ව චන්දිමා

යමෙක් සිදුකරන ලද පාප ක්‍රියා, කුසල් වැඩීම තුලින් වසා ගන්නේ නම්
(කුසල් යනු සිත ‘රාග-ද්වේශ-මෝහ’ යන්ගෙන් හිස් කරගැනීමයි.)
ඒ ඔහු වලාකුළු වලින් මිදී අහසෙහි බබලන චන්ද්‍රයා සේ,
මේ ලෝකයේ ගෞරවයට පාත්‍ර වන්නේය.

7.<u>පෙහෙරකෙල්ලගේ මරණය</u>

අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති
සකුන්තො ජාලමුත්තො’ව අප්පො සග්ගාය ගච්ඡති

අවිද්‍යාවෙන් මේ සංසාරය පුරා ඇවිද යන සත්වයන්ගෙන් ඉතා ස්වල්ප දෙනෙක් තමයි නුවණින් මෙනෙහි කිරීමට සමත්වෙන්නේ.
වැද්දාගේ දැලට හසුවූ පක්ෂීන්ගෙන් ඉතා අපහසුවෙන් එකෙක් දෙන්නෙක් මිදෙනවා සේ, ඉතාමත් සුළු දෙනයි සුගතියකට යන්නේ.

8.<u>අහසෙහි ගිය භික්ෂූන් වහන්සේලා</u>

හංසාදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා
නීයන්ති ධීරා ලොකම්හා ජෙත්වා මාරං සවාහිනිං

ගොඩබිම වෙසෙන හංසයා අහසේ වේගයෙන් යත්,
ඍද්ධි බලය ඇත්තා අහසින් ගමන් කරත්,
ප්‍රඥාවන්තයා මාර සේනාව පරදවමින් සංසාරයෙන් එතෙර වත්.

9.<u>තරුණියක බොරු කියා නිරයට ගිය සැටි</u>

එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං

එක හේතුවක් නිසා හෝ අතීතයේ බොරු කියන ලද මනුෂ්‍යයාට පරලෝකයට ගිය පසු නොකළ හැකි පවක් නැත්තේය.

10.<u>අසදිස දානය</u>

න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ

අඥානයා තද මසුරු බව නිසාම දන් දීමේ ආනිශංස පිළිනොගැනීම හේතුවෙන් ඒකාන්තයෙන්ම දිව්‍ය ලෝක වලට යන්නේ නැහැ.
ප්‍රඥාවන්තයා විසින් දන් දීමේ ආනිශංස පිළිගන්නා නිසා ඔහු දානා දී පින්කම් කරන්නේ ඉතා සතුටින්.
ඒ නිසා ඔහු පරලොවදීත් සැප ඇති පුද්ගලයෙක් වෙනවා.

11.අනේපිඬු සිටුපුත් නිවනට නතු වූ සැටි

පඨව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං

පෘථිවිය මත සක්විති රජ කම ලැබීම හෝ දිව්‍ය ලෝකයට යාම හෝ මනුෂ්‍යලෝකය-දිව්‍ය ලෝක-බ්‍රහ්ම ලෝක යන සියලු ලෝකවලට අධිපතිකම ලැබීම හෝ යන හැම දෙයටමත් වඩා සෝවාන්ඵලයට පත්වීම උතුම් වේ.

16.බුද්ධ වග්ගය

1.මාගන්දියගේ එඩි බිඳ දැමූ සැටි

යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො යාති කොචි ලොකෙ
තං බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ

යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්‍ථි කුහිඤ්චි නෙතවෙ
තං බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ

යම් තමාව දිනා ගත් කෙනෙක් මේ ලෝකේ කිසිවක් තෘෂ්ණාවෙන් අල්වා ගැනීමක් කරන්නේ නැහැ.
ඒ තෘෂ්ණාව නමැති හේතුව තමන් තුල නැතිකරගත් සර්වඥතා ඥාන අනුව හැසිරෙන ඒ උත්තමයින්ට එසේ බැඳීම් ඇතිවීමට කාරණයක් නැහැ.

යමෙක් තුල කිසිවක් කෙරෙහි ආශාවක්,
කිසිවකට ඇලීමක් ඇතිකරන තෘෂ්ණාව නැති නම් ඒ තෘෂ්ණාව නමැති හේතුව තමන් තුල නැතිකරගත් සර්වඥතා ඥාන අනුව හැසිරෙන ඒ උත්තමයින්ට එසේ බැඳීම් ඇතිවීමට කාරණයක් නැහැ.

2.යමාමහ පෙළහර

යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා
දෙවා'පි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං

සියලු කෙලෙස් ප්‍රහාණය කර ධ්‍යානයකට සමවැදී සංසිඳුනාවූ
මනාව සිහිය එළඹවා ගත් සම්මා සම්බුදුවරුන්ට දෙවියන් ප්‍රියකරන්නේය.

3.ඒරකපත්ත නා රජු

කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චාන ජීවිතං
කිච්ඡං සද්ධම්මසවනං කිච්ඡො බුද්ධානං උප්පාදො

මනුෂ්‍ය භාවයක් ලැබීම දුෂ්කරවේ.
මනුෂ්‍ය ජීවිතය ගෙවා දැමීම දුෂ්කරවේ.
සද්ධර්මය ඇසීම දුෂ්කරවේ.
බුදුවරයෙකුගේ පහල වීම දුෂ්කරවේ.

4.ආනන්ද මහාතෙරුන් ඇසූ ප්‍රශ්නයෙක්

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං එතං බුද්ධාන සාසනං

ඛන්ති පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා

න හි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො

අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සෙනාසනං
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධාන සාසනං

'ලෝභ-ද්වේශ-මෝහ'යන් නිසා සිදුකරගන්නා සියලු පාපයන් නොකර ඒවායින් වෙන්වීම
'තණ්හා- දෘෂ්ඨී-මාන' දුරුකර කුසලයන් වඩවා ගනිමින් උසස් භවට පත්වීම
"මමය- මගේය- මගේ ආත්මය" යයි තම කය සහ සිත කෙරෙහි ඇති උපාදානය අතහැර සිත නිදහස් කර ගැනීම යන මේවා බුදුවරුන්ගේ අනුශාසනා වේ!

තුන් දොර හික්මවා ගනිමින් රකින උසස්ම ශීලය තමයි 'ඉවසීම'.
බුදුවරයෙකුගේ උතුම්ම අනුශාසනාව තමයි 'නිවණ'.

පැවිද්දෙක් අන් අයව නැසුවත්,
ශ්‍රමණයෙක් අන් අයට හිංසාවක් වත් සිදු කරන්නේ නැහැ.

නුවණ ඇත්තන්ගේ නින්දාවට ලක් නොවීම, අනුන්ට හිංසා පීඩා නොකිරීම,
භික්ෂුවකට අයත් ශීලය ආරක්ෂා කරගැනීම,
ආහාරයේ පමණ දැන වැළදීම, විවේක ඇති සේනාසනයක වාසය කිරීම,
සමාධිමත් සිත පවත්වාගැනීමට වීර්යය කිරීම,
යන මේ සියල්ල පවත්වාගැනීම තමයි බුදුවරුන්ගේ අනුශාසනාව වන්නේ.

5.සසුනෙහි නො ඇලුනු මහණෙක්

න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති
අප්පස්සාදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො

අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො

තෘෂ්ණාව ඇති කෙනා කහවනු වැස්සක් වැස්සත් සෑහීමකට පත්වෙන්නේ නැහැ.
ප්‍රඥාවන්තයා නොසංසිඳීම දුකක් බව අවබෝධ කරගෙන තෘෂ්ණාව දුරු කරනවා.

සම්මා සම්බුදුන්ගේ ශ්‍රාවකයෙක්, දිව්‍ය ලෝක වල කොතරම් සැප තිබුනත්
ඒ කිසිවකට ආශා නොකර, සියලු දුක් දුරුකිරීම සඳහා නැවත උපත වලක්වන
තෘෂ්ණාව දුරු කිරීමට වීර්යය කරන්නේය.

6.<u>**අග්ගිදත්ත පුරෝහිතයා**</u>

බහු වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාමරුක්ඛචෙත්‍යානි මනුස්සා භයතජ්ජිතා

නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති

දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං

එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති

බොහෝ පර්වත, වනාන්තර, පන්සල්,
ගස් වැල්, චෛත්‍ය සරණ යන්නේ ඒකාන්තයෙන්ම භයෙන් තැතිගත් මනුෂ්‍යයන්ය.

ඒ සරණ යාම් කිසිවකින් ආරක්ෂාවක් ලැබෙන්නේ නැහැ.
ඒ සරණ යාම් කිසිවකින් සැනසීමක් ලැබෙන්නේ නැහැ.
ඒ සරණ යාම දුකෙන් මුදවන්නේ නැහැ.

අවබෝධයෙන් බුදුන් දහම් සඟුන් සරණ ගිය කෙනෙක්
චතුරාර්ය සත්‍යය මනාකොට නුවණින් අවබෝධ කරගන්නේය.

දුක, දුක හටගන්නා ආකාරය, නිවණ, ආර්ය අෂ්ඨාංගික මාර්ගය,
ගැන නිවැරදිව අවබෝධකරගැනීම දුකෙන් මිදීමේ මාර්ගය වන්නේය.

එය නිවණට උපකාර වේ, එය දුකෙන් මිදීම සඳහා උපකාර වේ.
ඒ අවබෝධ කරගැනීම සියලු දුකෙන්ම මුදවනු ලැබේ.

7.<u>ආනන්ද මහාස්ථවිරයන් වහන්සේගේ ප්‍රශ්නය</u>

දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්‍ථ ජායති
යත්‍ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති

ශ්‍රේෂ්ඨ පුරුෂයන් ඉතා දුර්ලභයි. එවැනි අය හැම තැනම ඉපදෙන්නේ නැහැ.
යම් තැනක් එවැනි ප්‍රඥාවන්තයන් ඉපදෙනවා නම්
ඒ පවුල්වල සියලු දෙනාට ප්‍රඥාබලයෙන් සැපවත් වීමට හැකිවෙනවා.

8.<u>බොහෝ භික්‍ෂූන් එක්ව කළ කථාවක්</u>

සුඛො බුද්ධානං උප්පාදො සුඛා සද්ධම්මදෙසනා
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපො සුඛො

බුදුවරයෙක් පහළ වීම සියලු සත්වයාටම සැපයක් අත්වෙනවා.
සද්ධර්මය අසන්නට ලැබීම සැපයක්.
යහපත් භික්ෂූන් වහන්සේලා හමුවී ප්‍රඥාව වඩවා ගැනීම සැපයක්.
භික්ෂූන් වහන්සේලා සමීපයේ බ්‍රහ්මචරියාවේ හැසිරෙමින් භාවනා කිරීම සැපයක්.

9.<u>රන් සෑයෙක්</u>

පූජාරහෙ පූජයතො බුද්ධෙ යදි ච සාවකෙ
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ

තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තම්පි කෙනචි

පිදීමට සුදුස්සා පුදමින්, බුදුන්ගේ ශ්‍රාවකයෙක් වෙමින්
පංච නීවරණ දුරුකරන කෙනා සෝක පරිදේව ඉක්මවන්නේය.

කෙලෙස් ප්‍රහීණ කළ නිසා සියලු භයෙන් මිදී නිවණට පත්වූ
එවැනි බුදු, පසේබුදු, මහරහත් යන උත්තමයන් පුදන කෙනෙක් විසින්
රැස් කරගන්නා පින මෙතකැයි කියා ගණනකින් කියන්න සමතෙක් ඇත්තේ නැහැ.

17.ප්‍රිය වර්‍ගීය

1.මවුපිය දෙදෙනා හා එක් ම පුතා

අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිඤ්ච අයොජයං
අත්‍ථං හිත්‍වා පියග්ගාහී පිහෙතත්තානුයොගිනං

මා පියෙහි සමාගඤ්ඡී අප්පියෙහි කුදාචනං
පියානං අදස්සනං දුක්ඛං අප්පියානඤ්ච දස්සනං

තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්‍ථි පියාප්පියං

උසස් බවට පත්වීමට කැමති පුද්ගලයා නුසුදුසු ක්‍රියාවන්හි ආදීනව අවබෝධ කරගෙන තමන් ළඟ ඇති නුසුදුසු ක්‍රියා වලින් ඈත්වීමට උත්සාහ කර තමන් හට සිදුවිය හැකි විනාශයන් වලක්වා ගැනීමට කටයුතු කරන්නේය.

ප්‍රියයන් යයි හැඟීමෙන් හෝ අප්‍රියයන් යයි හැඟීමෙන් හෝ කිසිවෙකුත් සමග කිසිකලෙක වත් ආශ්‍රයන් පවත්වාගන්න එපා.
ප්‍රියයන්ගෙන් වෙන්වීම දුක ඇතිකරනවා මෙන්ම අප්‍රියයන් හා එක්වීමද දුක ඇතිකරන්නේය.

එවැනි වූ කෙනාට ප්‍රියයන් නිසා ප්‍රියයන්ගෙන් වෙන්වීමකින් පමුණුවනු ලබන කවර කම්පාවක් වත් ඇතිවෙන්නේ නැහැ.
ප්‍රිය අප්‍රිය දෙකෙන්ම වෙන්වූ ඔහු තුල බැඳීම් දකින්න ලැබෙන්නේ නැහැ.

2.පුතු මළ සෝකයෙන් හැඬූ බමුණා

පියතො ජායතී සොකො පියතො ජායතී භයං
පියතො විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං

තමන් ප්‍රිය දේ තමන් හට ශෝකය උපද්දවනවා,
තමන් ප්‍රිය දේ තමන් හට බිය උපද්දවනවා,
‘අනිච්ච-දුක්ඛ-අනත්ත’ ස්වභාවය ගැන අවබෝධකරගෙන ‘මට ප්‍රියයි’ යන හැඟීමෙන් මිදුන කළ කුමන ශෝකයක්, කුමන බියක් හටගන්නද.

3.විශාඛා මහා උපාසිකාවගේ දුක් සංසිඳවීම

පෙමතො ජායතී සොකො පෙමතො ජායතී භයං
පෙමතො විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං

තමන් ආදරය කරන දේ තමන් හට ශෝකය උපද්දවනවා,
තමන් ආදරය කරන දේ තමන් හට බිය උපද්දවනවා,
'අනිච්ච-දුක්ඛ-අනත්ත' ස්වභාවය ගැන අවබෝධකරගෙන 'මම ආදරෙයි' යන හැඟීමෙන් මිදුන කළ කුමන ශෝකයක්, කුමන බියක් හටගන්නද.

4.ගැණියක නිසා වූ විපතක්

රතියා ජායතී සොකො රතියා ජායතී භයං
රතියා විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං

තමන් තුල ඇති කාමාශාව තමන් හට ශෝකය උපද්දවනවා,
තමන් තුල ඇති කාමාශාව තමන් හට බිය උපද්දවනවා,
'අනිච්ච-දුක්ඛ-අනත්ත' ස්වභාවය ගැන අවබෝධකරගෙන තමන් තුල ඇති කාමාශාවෙන් මිදුන කළ කුමන ශෝකයක්, කුමන බියක් හටගන්නද.

5.අනිත්‍ථිගන්ධ කුමාරයා

කාමතො ජායතී සොකො කාමතො ජායතී භයං
කාමතො විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං

කාම වස්තූන්ට ඇති කැමැත්ත තමන් හට ශෝකය උපද්දවනවා,
කාම වස්තූන්ට ඇති කැමැත්ත තමන් හට බිය උපද්දවනවා,
'අනිච්ච-දුක්ඛ-අනත්ත' ස්වභාවය ගැන අවබෝධකරගෙන කාම වස්තූන්ට ඇති කැමැත්තෙන් මිදුන කළ කුමන ශෝකයක්, කුමන බියක් හටගන්නද.

6.මිසදිටු ගත් බමුණෙක්

තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං

තමන් තුල පවතින තණ්හාව තමන් හට ශෝකය උපද්දවනවා,
තමන් තුල පවතින තණ්හාව තමන් හට බිය උපද්දවනවා,

තම කයේ, තමන්ට දැනෙන වේදනාවල, තම සිතේ සහ තමන්ගේ ස්වභාවයේ යථා ස්වභාවය ගැන අවබෝධකරගෙන, ඒ සියල්ල කෙරෙහි
"මමය-මගේය-මගේ ආත්මයය" යන අවිද්‍යාවෙන් ඇති කරගත් බැඳීම් වලින් මිදී තමන් තුල පවතින තණ්හාවෙන් මිදුන කළ කුමන ශෝකයක්, කුමන බියක් හටගන්නද.

7.<u>මූණ බලා පිදූ කැවුම්</u>

සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවෙදිනං
අත්තනො කම්ම කුබ්බානං තං ජනො කුරුතෙ පියං

ශීලාදී ගුණයෙන් යුක්තව ධර්මයට අනුව පිළිපදිමින් චතුරාර්ය සත්‍ය අවබෝධ කරගත් තමන්ගේ හිත සුව පිණිස උසස් ක්‍රියාවේ යෙදී සිටින කෙනා මිනිස් සමූහයාට ප්‍රිය වන්නේය.

8.<u>ප්‍රශ්නයට පිළිතුරු නො දී පිරිනිවීම</u>

ඡන්දජාතො අනක්ඛාතෙ මනසා ච ඵුටො සියා.
කාමෙසු ච අප්පටිබද්ධචිත්තො උද්ධංසොතො'ති වුච්චති

නිවණට කැමැත්තක් හටගෙන සිත පුරා පැතිරුණු විට කාමය කෙරෙහි ඇති ඇලීම් දුරුකර, කාම භවය අතික්‍රමණය කරමින් බ්‍රහ්ම ලෝකයේ පහල වන්නේ යයි, කියනු ලැබේ.

9.<u>නන්දිය හා රේවතී</u>

චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං
ඤාතිමිත්තා සුහජ්ජා ච අභිනන්දන්ති ආගතං

තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතීව ආගතං

බොහෝ කලක් ගමෙන් පිට වී සිටි, තමන්ට යහපත සලසා ගත් කෙනෙක්
නැවත තම ගමට පැමිණි කළ ඔහුගේ ඥාති මිත්‍රයන් ඔහුගේ පැමිණීමට සතුටු වී ඔහුව ආදරයෙන් පිළිගනී.

එලෙසම පින් කරන තැනැත්තා මේ ලෝකයේ සිට පරලොව යනවිට,
ඒ ඔහු විසින් කරන ලද පිනෙහි බලය ඔහුව පිළිගන්නේ, තමන්ගේ ඥාති මිත්‍රයන් තමන් එනතුරු මග බලා සිටින ආකාරයටයි.

18.ක්‍රෝධ වර්ගය

1.රෝහිණියගේ අසුන්හල් පූජාව

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා

ක්‍රෝධ කිරීමෙන් දුරුවීමට මානය දුරු කළ යුතුයි.
තමන්ගේ ඉන්ද්‍රියයන්ට අරමුණු වන රූපයන්ට උපාදානය වීම අතහැරිය යුතුයි.
නාම රූප දෙක 'මම' යයි නොගැනීම හේතුවෙන් කෙනෙක් තුල කෙලෙස් හට ගැනීමක් නොමැති නිසා ඔහු වෙතට දුක පමුණුවන්නේ නැත.

2.දෙව්දුවකගේ පැමිණිල්ලෙක්

යො වෙ උප්පතිතං කොධං රථං භන්තං'ව ධාරයෙ
තමහං සාරථිං බ්‍රෑමි රස්මිග්ගාහො ඉතරො ජනො

ඉදින් ක්‍රෝධයක් හට ගතහොත්, පාලනයෙන් මිදුණු වේගයෙන් යන රථයක් නුවණ මෙහෙයවමින් පාලනය කරගන්නා සේ, ක්‍රෝධය නිසා තමන්ට ඇතිවන අයහපත් ප්‍රතිඵල නුවණින් සිහිකර තමාගේ ක්‍රෝධයද පාලනය කරගන්න.
එවැනි වූ ඔහුට මම දක්ෂ රථාචාර්යවරයෙක් යයි කියනු ලැබේ.
එසේ තමන්ගේ ක්‍රෝධය පාලනය කරගත නොහැකි අය, නාස්ලනුව හෝ වරපට අල්ලාගෙන යන මිනිසුන් පමණි.

3.උත්තරා සිරිමාවට කළ සත්කාරය

අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං

ක්‍රෝධය මෛත්‍රියෙන් දිනන්නේය, අයහපත යහපතෙන් දිනන්නේය.
මසුරු බව දන් දීමෙන් දිනන්නේය, බොරුව සත්‍යයෙන් දිනන්නේය.

4.ගැහැණියකට දෙව්ලොව උපතට කරුණු වූ පින්කම

සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි යාචිතො
එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවාන සන්තිකෙ

සත්‍ය කතා කිරීම, නොකිපෙන බව, ඉල්ලන කෙනෙකුට සුළුවෙන් හෝ යමක් දීම යන කාරණා තුන පිළිපැදීම දෙවියන් ළඟට පමුණුවනවා.

5.<u>බුදුන්ගේ පෙර දැහි මවුපිය දෙදෙනෙක්</u>

අහිංසකා යෙ මුනයො නිච්චං කායෙනසංවුතා
තෙ යන්ති අච්චුතං ඨානං යත්‍ථ ගන්ත්‍වා න සොචරෙ

කිසිවෙකුට හිංසා නොකරන, නිතර කය හික්මවාගෙන වාසය කරන මුනිවරු යම් තැනක ශෝක නොකෙරේද, ඒ ස්ථානය වන නිවණට පත්වන්නේය.

6.<u>කුඩු කැවුමක් පිළිගැණීම</u>

සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං
නිබ්බාණං අධිමුත්තානං අත්‍ථං ගච්ඡන්ති ආසවා

රෑ දවල් හැම කල්හිම නිදිවරාගෙන අනිච්ච-දුක්ඛ-අනත්ත ස්වභාවය අවබෝධ කරගනිමින්, ඇලීම්-ගැටීම් දුරුකිරීමේ පුහුණුවේ යෙදෙමින් නිවනෙහි ඇලුණු කෙනා සියලු ආශ්‍රවයන් දුරු කරන්නේය.

7.<u>අතුල උපාසකයා</u>

පොරාණමෙතං අතුල නෙතං අජ්ජතනාමිව
නින්‍දන්ති තුණ්හිමාසීනං නින්‍දන්ති බහුභාණිනං
මිතභාණිම්පි නින්‍දන්ති නත්‍ථි ලොකෙ අනින්‍දිතො

න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති
එකන්තං නින්‍දිතො පොසො එකන්තං වා පසංසිතො

යං චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ
අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං

නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්‍දිතුමරහති
දෙවා’පි නං පසංසන්ති බ්‍රහ්මුනා’පි පසංසිතො

පුරාණයේ හෝ අද යයි හෝ කියා වෙනසක් නැහැ. නිශ්ශබ්දව හිටියත් ගරහනවා, අඩුවෙන් කතා කලත් ගරහනවා, බොහෝ කොට කතා කලත් ගරහනවා, ප්‍රමාණයට කතා කලත් ගරහනවා, මේ ලෝකයේ නින්දා නොලබන කිසිවෙක් නැහැ.

මේ ලෝකේ ඉන්න මිනිස්සු නැහැ එකක්ම කියන්නේ, නැහැ එකක්ම සිද්ධ කරන්නේ, නැහැ එකක්ම සිතන්නේ කියල දකින්න පුළුවන්.
වෙලාවකට ප්‍රශංසා කරන කෙනා වෙලාවකට නින්දා කරනවා.

ඉදින් ප්‍රඥාවන්තයා යමක් ප්‍රශංසා කරන්නේ හොඳින් පරීක්ෂා කර බලා, එයින් හෙට දවසේ ඒකාන්තයෙන්ම යහපතක් ලැබෙනවා නම් පමණයි.
එලෙස කිසිඳු වැරදි පැවැත්මක් ඇති නොකරගන්නා ප්‍රඥාවන්තයා තමන් තුල සීලයද, ප්‍රඥාවද, සමාධියද වඩවා ගන්නේය.

ජම්බොනද නම් ඉතා වටිනා රන් වර්‍ගය මෙන් ඒ ශීලයෙන් බැබලෙන ඔහුට කවරක් නිසා නින්දා කරන්නද. දෙවියන්ද, බ්‍රහ්මයන්ද ඔහුව ප්‍රශංසා කරනු ලබන්නේය.

8.<u>සවග මහණුන්ගේ අසංවරය</u>

කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා
කායදුච්චරිතං හිත්‍වා කායෙන සුචරිතං චරෙ

වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා
වචීදුච්චරිතං හිත්‍වා වාචාය සුචරිතං චරෙ

මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා
මනොදුච්චරිතං හිත්‍වා මනසා සුචරිතං චරෙ

කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා
මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා

කය නිසා හට ගත හැකි නුරුස්සන ස්වභාවය-කෝපය වළක්වාගැනීමට කය සංවර කරගනිමින් වාසය කරනවා. එවිට කයෙන් සිදුවන දුසිරිත් දුරු කරමින් කය හික්මවාගෙන සංසිඳෙමින් වාසය කිරීමට හැකි වනවා.

වචනය නිසා හට ගත හැකි නුරුස්සන ස්වභාවය-කෝපය වළක්වාගැනීමට වචනය සංවර කරගනිමින් වාසය කරනවා. එවිට වචනයෙන් සිදුවන දුසිරිත් දුරු කරමින් වචනය හික්මවාගෙන සංසිඳෙමින් වාසය කිරීමට හැකි වනවා.

නරක නපුරු සිතිවිලි නිසා හට ගත හැකි නුරුස්සන ස්වභාවය-කෝපය වළක්වාගැනීමට සිත සංවර කරගනිමින් වාසය කරනවා. එවිට නරක නපුරු සිතිවිලි නිසා සිදුවන දුසිරිත් දුරු කරමින් සිත හික්මවාගෙන සංසිඳෙමින් වාසය කිරීමට හැකි වනවා.

නුවණින් කටයුතු කරමින් කයෙන් හික්මී වචනයෙන්ද හික්මුණු ප්‍රඥාවන්තයා තමන්ගේ සිතද හික්මවා ගත් කළ, ඔහු ඒකාන්තයෙන්ම මනාව හික්මුණු උතුම් කෙනෙකු වන්නේය.

19.<u>මල වග්ගය</u>

1.<u>ගෝඝාතක පුත්‍රයා</u>

පණ්ඩුපලාසො’ව දානි’සි යමපුරිසා’පි ච තං උපට්ඨිතා
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති

සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිමෙහිසි

උපනීතවයො ච දානි’සි සම්පයාතො’සි යමස්ස සන්තිකෙ
වාසො’පි ච තෙ නත්‍ථි අන්තරා පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති

සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගණො න පුනං ජාතිජරං උපෙහිසි

ගසින් වැටීමට ඉතා ආසන්න ඉදුණු කොලයක් මෙන් ජීවිත කාලය පුරාම යහපත් දේ නොකළ, දැන් ඉතා වයසට ගොස් සිටින කෙනා එනතුරු යම පල්ලන් මග බලා සිටිනවා. ඒ ඔහු මරණයෙන් පසු සැපවත් ජීවිතයක් ලැබීමට අවශ්‍ය කිසිවක් සූදානම් කර නොගත් නිසා.

එවැනි ඔහු වහා නුවණින් යුතුව උත්සාහවත්ව කටයුතු කළ යුතුයි, තමන්ට යහපත් උප්පත්තියක් ඇතිකර ගැනීම සඳහා.
උසස් දිව්‍ය ලෝකයක හෝ ආර්ය භූමියක හෝ උපත ලැබීම සඳහා, ලෝහ රත් කරමින් මලකඩ ඉවත් කර පිරිසිදු කරගන්නා සේ, තමන් තුල ඇති කෙලෙස් දුරු කර ගනිමින් පිරිසිදු විය යුතුයි.

දැන් මාරයා සමීපයට එළඹිලා ඉදිරියෙන්මයි සිටින්නේ,
තමන්ගේ මේ ජීවිතයත්, මාරයාත් අතරට එළඹිලා සිටින ඔබ ළඟ ඔබේ පිහිට සඳහා යමක් ඇතැයි දකින්න ලැබෙන්නේ නැහැ.

එවැනි ඔහු වහා නුවණින් යුතුව උත්සාහවත්ව කටයුතු කළ යුතුයි, තමන්ට යහපත් උප්පත්තියක් ඇතිකර ගැනීම සඳහා.
ලෝහයක් රත් කරමින් මලකඩ ඉවත් කර පිරිසිදු කරගන්නා සේ, තමන් තුල ඇති කෙලෙස් දුරු කර ගනිමින් පිරිසිදු වී සිත මධ්‍යස්ථ කර ගන්නා කෙනාට නැවත උපතක් හෝ වයසට යාමක් සිදුවෙන්නේ නැහැ.

2.<u>ශ්‍රද්ධාවත් බ්‍රාහ්මණයෙක්</u>

අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො

ප්‍රඥාවන්තයා ධර්මයට අනුව පිළිපදිමින් සෑම ක්ෂණයක් පාසාම ටිකෙන් ටික කෙලෙස් දුරු කරමින් තමාව පිරිසිදු කරගන්නේ, කම්මල් කරු නිවැරදි ක්‍රම භාවිතා කරමින් රිදී කාසි ඔප මට්ටම් කරන විලාශයටයි.

3.ඉණිකුණුව උපන් මහණෙක්

අයසා'ව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති
එවං අතිධොනචාරිනං සකකම්මානි නයන්ති දුග්ගතිං

යකඩෙන්ම හටගත් මලකඩ විසින් ඒ යකඩය කා දමන්නා සේ සිව්පසයේ නුවණ ඉක්මවා හැසිරෙන තමන්ගේම ක්‍රියාව විසින්, තමන්ව නිරය වෙත පමුණුවනවා.

4.ලාලුදායී ස්ථවිරයන් වහන්සේ

අසජ්ඣායමලා මන්තා අනුට්ඨානමලා ඝරා
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං

සජ්ඣායනා නොකිරීම යන කිළුට විසින් මන්ත්‍ර ඉගනීම විනාශ කරයි.
උත්සාහ වත් නොවීම යන කිළුට විසින් ගෘහ ජීවිතය විනාශ කරයි.
කම්මැලිවීම යන කිළුට විසින් යසස විනාශ කරයි.
සිහි නුවණින් කටයුතු නොකිරීම යන කිළුට විසින් රැකවරණය විනාශ කරයි.

5.සොරසැමියන් සොයා ගිය ගැහැණි

මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච

තතො මලා මලතරං අවිජ්ජා පරමං මලං
එතං මලං පහත්වාන නිම්මලා හොථ භික්ඛවො

දුශ්චරිත වීම යන අකුසලය විසින් ස්ත්‍රියව විනාශ කරයි.
මසුරුබව යන අකුසලය විසින් දන් දීම විනාශ කරයි.

පවු කම් ක්‍රියා යන අකුසල් විසින් ඒකාන්තයෙන්ම ඔහුගේ මෙලොවත් පරලොවත් විනාශ කරයි.

ඒ සියලු කිළුටු අතරින් ඉතා කිලුටු වූ අවිද්‍යාව තමයි නරකම අකුසලය.
ඒ අවිද්‍යාව දුරු කර භික්ෂූන් පිරිසිදු විය යුතුයි.

6.<u>**වෙදකම් කළ මහණෙක්**</u>

සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා
පක්ඛන්දිනා පගබ්භෙන සංකිලිට්ඨෙන ජීවිතං

හිරීමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා
අලීනෙනාපගබ්භෙන සුද්ධාජීවෙන පස්සතා

පවට ලජ්ජා නැති, කපුටකු මෙන් කැම සොයා යන, තමන්ගේ වැනසීම වෙනුවෙන් සැපවත් යයි සිතමින් නිසරු ජීවිත ගත කරන, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමට අදක්ෂ වන කෙනාගේ ජීවිතය අපවිත්‍ර වූ එකකි.

පවට ලජ්ජා ඇතිව දුෂ්කර ජීවිතයක් ගතකරන තමන්ට යහපත සලසන දේම සොයන නොපසුබට වීර්යයෙන් යුතුව ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමට දක්ෂ වන කෙනාගේ ජීවිතය පිරිසිදු වූ යහපත් එකකි.

7.<u>**පන්සියයක් උපාසකයෝ**</u>

යො පාණමතිපාතෙති මුසාවාදං ච භාසති
ලොකෙ අදින්නං ආදියති පරදාරං ච ගච්ඡති

සුරාමෙරයපානං ච යො නරො අනුයුඤ්ජති
ඉධෙව පොසො ලොකස්මිං මූලං ඛණති අත්තනො

එවං භො පුරිස ජානාහි පාපධම්මා අසඤ්ඤතා
මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං

ප්‍රාණීන් නැසීම ද, බොරු කීමද අන්‍යන් සතු නොදුන් දේ ගැනීමද, අන් සතු ස්ත්‍රීන් සේවනය කිරීමද, මත්පැන් පානය කිරීමද යන මේ වැරදි ක්‍රියා වල මිනිසුන් විසින් යෙදේ.

මෙවැනි ක්‍රියා නිසා මනුෂයෙකු වශයෙන් ලැබූ තමන්ගේ යහපත් පිහිටීම බිඳ ගන්නවා. එම්බා පුරුෂය, තමන්ගේ නොහික්මුණු බව නිසා සිදුකරන පාප ක්‍රියා ගැන මෙසේ දත යුතුයි. ඒ තමන් තුල ඇති තෘෂ්ණාවද, නොහික්මුණු බවද, නිසා බොහෝ කාලයකට දුක් විදීමට සිදුවෙන බව.

8.<u>**තම නෑයන් උසස් කොට දැක් වූ තිස්ස මහණ**</u>

දදාති වෙ යථා සද්ධං යථා පසාදනං ජනො
තත්‍ථ වෙ මඞ්කු යො හොති පරෙසං පානභොජනෙ
න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති

යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං.
ස වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති

ඒකාන්තයෙන්ම ශ්‍රද්ධාව පෙරදැරිව ජනයා විසින් සතුටු සිතින් දන් දෙන තැන් වලදී ඒ දෙන ආහාර පාන ගැන කොහෙත්ම කැමති නැති හැකුළුණු මුහුණු ඇතිව අසන්තෝෂයෙන් කතා කරන කෙනාට රෑ දාවල් කිසි මොහොතක ඔහුගේ සිත සංසිඳුවා ගැනීමට නොහැකි වේ.

ඒ ඔහුගේ එවැනි වූ අයහපත් සිතිවිලි මුලින්ම උදුරා දමා විනාශ කළ තැන් පටන්, ඔහුට ඒකාන්තයෙන්ම රෑ දාවල් හැම කල්හිම තමන්ගේ සිත සංසිඳවා ගැනීමට හැකිවේ.

9.<u>බණ ඇසූ උපාසක</u>

නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො ගහො
නත්ථි මොහසමං ජාලං නත්ථි තණ්හාසමා නදී

කාමාශාව සමාන වූ ගින්නක් තවත් නැහැ, ද්වේශය තරම් උපාදානයක් තවත් නැහැ, මෝහය තරම් අවුල් වීමක් තවත් නැහැ, තණ්හාවේ ගලා යාමේ වේගයට සමකල හැකි ගලා යාමක් ඇති ගඟක් තවත් නැහැ.

10.<u>මෙණ්ඩක සිටානෝ</u>

සුදස්සං වජ්ජමඤ්ඤෙසං අත්තනො පන දුද්දසං
පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථා භූසං
අත්තනො පන ඡාදෙති කලිං'ව කිතවා සඨො

පහසුවෙන් දැකිය හැකි තමන්ගේ වැරදි අඩුපාඩු දැකීමට අපහසු වුවත්, යම්සේ කුල්ලකින් පොලා බොල් වූ දේ අස් කිරීමට උත්සාහ කරන්නා සේ අනුන්ගේ වැරදි අඩුපාඩු නිවැරදි කිරීමට උත්සාහ කරයි. කපටි කෛරාටික කමින් තමන්ගේ වැරදි අඩුපාඩු සඟවන ඔහු විපතට පත්වේ.

11.<u>උජ්ඣානසඤ්ඤී ස්ථවිර</u>

පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා

නිතර අනුන්ගේ වැරදි අඩුපාඩු සොයමින් අවඥාවට ලක් කරන කෙනා තුල කෙලෙස් වැඩීම නිසා, ඔහුට කෙලෙස් දුරු කිරීම බොහෝ අපහසු වන්නේය.

12.<u>සුභද්‍ර පරිව්‍රාජක</u>

ආකාසෙ පදං නත්‍ථි සමණො නත්‍ථි බාහිරෙ
පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා

ආකාසෙ පදං නත්‍ථි සමණො නත්‍ථි බාහිරෙ
සඞ්ඛාරා සස්සතා නත්‍ථි නත්‍ථි බුද්ධාන ඉඤ්ජිතං

අහසේ පියසටහන් නැහැ, ශ්‍රමණයන් බාහිර ශාසනයන්හි නැහැ
සත්වයන් පංච නීවරණයන්හි ඇලේ, තථාගතයන් නීවරණයන්ගෙන් වෙන්වූ කෙනෙකි.

අහසේ පියසටහන් නැහැ, බාහිර ශාසනයන්හි ශ්‍රමණයන් නැහැ. (ඉන්නේ පැවිද්දන්)
ලෝකයේ ඇති කිසිවක් සදාකාලික නැහැ, බුදුවරුන්ට කම්පා වෙන්න කිසිවක් නැහැ.

20.ධර්මස්ථ වර්ගය

1.ධර්මයෙහි පිහිටියෝ

න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සාහසා නයෙ
යො ච අත්ථං අනත්ථඤ්ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො

අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ
ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨො'ති පවුච්චති

ධර්මයෙහි පිහිටා නැත්නම් යම් විනිශ්චයක් දීමේදී අර්ථය නොවිමසමින් තීරණය පමුණුවයි.
ප්‍රඥාවන්තයා අර්ථය, අනර්ථය යන දෙකම විමසමින් තීරණ ලබාදෙයි.

ඔහු අනුන් කෙරෙහි විනිශ්චය කිරීමේදී ධර්මයට අනුව හොඳින් කල්පනා කර බලා අගති ගාමී නොවී විනිශ්චය පමුණුවයි
ධර්මයට අනුව හික්මුණු ප්‍රඥාවන්තයා යුක්තිගරුක පුද්ගලයෙක්, යයි කියනු ලැබේ.

2.සවග මහණෝ

න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති
ඛෙමී අවෙරී අභයො පණ්ඩිතො'ති පවුච්චති

කෙනෙක් බොහෝ දේ කතා කර පමණින් ඔහු ප්‍රඥාවන්තයෙක් වෙන්නේ නැහැ.
යහපත් හික්මීම නිසා තමන් හට රැකවරණය සලසා ගත්, කිසිවෙකුට වෛර නොකරන, බියෙන් තොරව ජීවත් වන කෙනා ප්‍රඥාවන්තයා, යයි කියනු ලැබේ.

3.එකුදාන ස්ථවිරයන් වහන්සේ

න තාවතා ධම්මධරො යාවතා බහු භාසති
යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති
ස වෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජති

ධර්මය දැනගෙන එය දන්නා බව බොහෝ අයට පෙන්වීමට බොහෝ දේශනා සිදුකළ පමණින් ඔහු ප්‍රතිපත්තියෙන් ධර්මය දරන්නෙක් නොවේ.
යම් ස්වල්ප ධර්මයක් අසා දැනගෙන එය නුවණින් මෙනෙහි කරමින් කායානුපස්සනාව වඩමින් ධර්මයෙහි හෝ උපාදානයක් ඇති නොකරගන්නා කෙනා ප්‍රතිපත්තියෙන් ධර්මය දරන්නෙක් වේ.

4.ලකුණ්ටකභද්දිය ස්ථවිරයන් වහන්සේ

න තෙන ථෙරො සො හොති යෙනස්ස පලිතං සිරො
පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණො'ති වුච්චති

යම්හි සච්චං ච ධම්මො ච අහිංසා සංයමො දමො
ස වෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති

ප්‍රාතිමෝක්ෂ ශීලය නිවැරදිව නොපුරමින් සිටින පැවිද්දෙක්, මහලු බවට පත්වී හිසකෙස් පැසුණු පමණින් ස්ථවිර කෙනෙක් බවට පත්වෙන්නේ නැහැ. ධර්මයෙන් අභිවූර්ධියට නොපැමිණීමට නොහැකි වූ ඔහුට ගුණධර්මයක් නැති හිස් මහල්ලෙක්, යයි කියනු ලැබේ.

චතුරාර්ය සත්‍ය අවබෝධ කරගනිමින් ධර්මයට අනුව හැසිරෙමින් අන් අයට හිංසාවක් සිදු නොවන අයුරින් තම ඉන්ද්‍රියයන් හික්මවාගෙන සංවර වූ, ඒකාන්තයෙන්ම දුරුකළ කෙලෙස් ඇති කෙනාට ප්‍රඥාවන්ත ස්ථවිර, යයි කියනු ලැබේ.

5.පදබ්‍යඤ්ජනයෙහි දක්ෂ වූ ශ්‍රමණයෝ

න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා
සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො

යස්ස චෙ තං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං
ස වන්තදොසො මෙධාවී සාධුරූපො'ති වුච්චති

ධර්මය, ව්‍යාකරණ දැනගත් පමණින් හෝ වර්ණවත් ශරීර ශෝභාවක් ඇති පමණින් හෝ කෙනෙක් ගුණවත් ශ්‍රමණයෙක් වෙන්නේ නැහැ, ඔහු තුල ඊර්ෂ්‍යාව, මසුරු කම, කපටි කම තියනවා නම්.

ඉදින් ඔහු ඔහු තුල ඇති ඊර්ෂ්‍යාව, මසුරු කම, කපටි කම මුලින් උදුරා දමා නැවත ඒවා ඇතිවීමට ඇති හේතු ද නැතිකරගෙන, තමන් තුල ඇති සියලු කෙලෙස් දුරුකරගන්නා නුවණ ඇති කෙනාට ගුණවත් ශ්‍රමණයෙක්, යයි කියනු ලැබේ.

6.වාදයෙන් පැන යන හත්ථක

න මුණ්ඩකෙන සමණො අබ්බතො අලිකං භණං
ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති

යො ච සමෙති පාපානි අණුංථූලානි සබ්බසො
සමිතත්තා හි පාපානං සමණො'ති පවුච්චති

ශීල සම්පන්න නොවී, මුසාවාද කියන කෙනෙක් හිස මුඩු කරගත් පමණින් ශ්‍රමණයෙක් වෙන්නේ නැහැ.
කාමය කෙරෙහි ආශාවෙන් ලෝභයෙන් උපාදානය වෙන කෙනෙක් ශ්‍රමණයෙක් වෙන්නේ කෙසේද.

යමෙක් සුළු හෝ මහත් වූ හෝ සියලු පාප ක්‍රියා වලින් මිදී, අකුසලයන් සංසිඳවූ තැනැත්තාට ශ්‍රමණයෙක්, යයි කියනු ලැබේ.

7.<u>**බැහැරි සසුන්හි පැවිදි වූ බමුණෙක්**</u>

න තෙන භික්ඛු හොති යාවතා භික්ඛතෙ පරෙ
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා

යො’ ධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්‍වා බ්‍රහ්මචරියවා
සඞ්ඛාය ලොකෙ චරති ස වෙ භික්ඛූ’ති වුච්චති

අන් අයගෙන් ලැබෙන පිණ්ඩපාතයෙන් යැපුනත්, වැරදි ධර්මයක් පිළිපදිමින් ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයේ නොයෙදී ඉන්නවා නම්, ඔහු භික්ෂුවක් වෙන්නේ නැහැ.

පින් පවු දෙකෙන්ම මිදී පිරිසිදු බ්‍රහ්මචරියාව පුරමින් මනා ප්‍රඥාවෙන් යුතුව ලෝකයා සමග ගනුදෙනු කරන කෙනාට ඒකාන්තයෙන්ම භික්ෂුවක් යයි කියනු ලැබේ.

8.<u>**නියම මුනිවරයා**</u>

න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු
යො ච තුලං’ව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො

පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති

අඥාන මුලාවන ගතියෙන් යුතු පැවිද්දෙක් නුවණැති තපස් රකින්නෙක් වෙන්නේ නැහැ. යම් කිසි ද්‍රව්‍යයන් දෙකක් තරාදියකින් කිරා මැන බලා වඩා බර දේ කුමක්දැයි දැනගන්නාසේ, පස් කම් සැපය නිසා ඇතිවන තාවකාලික සුවයත්, නිවණට පත්වීමෙන් ලැබිය හැකි උතුම් වූ සදාකාලික සංසිඳීමත් අතර ඇති උසස් වටිනාකමත්, ප්‍රඥාවන්තයා නුවණින් මෙනෙහි කරමින් අවබෝධ කරගනියි.

තමන් තුල ඇති පවිටු අදහස් දුරු කිරීමෙන් ඔහු නුවණැති තාපසයෙක් වෙනවා. මෙලොවත් පරලොවත් ගැන අවබෝධ කරගත් ඔහුට උතුම් තාපසයෙක් යයි කියනු ලැබේ.

9.<u>බිලී වැද්දෙක්</u>

න තෙන අරියො හොති යෙන පාණානි හිංසති
අහිංසා සබ්බපාණානං අරියො'ති පවුච්චති

අන් ප්‍රාණීන්ට හිංසා කරන්නේ නම් ඔහු උසස් කෙනෙක් වෙන්නේ නැහැ.
සියලු ප්‍රාණීන් කෙරෙහි හිංසා වෙන් වැළකුණු කෙනාට උතුමෙක්, යයි කියනු ලැබේ.

10.<u>බුදුරජානන් කළ අවවාදයෙක්</u>

න සීලබ්බතමත්තෙන බාහුසච්චෙන වා පන
අථ වා සමාධිලාභෙන විවිච්ච සයනෙන වා

ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසෙවිතං
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං

සිල් ව්‍රතයක් රැක්ක පමණින් නැහැ බොහෝ ඇසූ පිරූ බව ඇති වෙන්නේ හෝ එහෙමත් නැත්නම් සමාධියකට එළඹීමට හැකිවන්නේ හෝ විවේක සුවයෙන් වාසය කිරීමට හැකි වන්නේ.

මම පැවිදි වී මාර්ග ඵලයකට පත්වූයෙමියි, යයි සිතමින්, කෙලෙස් දුරු කර නැත්නම්, තමන් භික්ෂුවක් යයි විශ්වාස කරන්න එපා.

21.<u>භික්ඛු වර්ගය</u>

1.<u>ඇස් කන් නාස් ඈ දොරටු රැකි භික්ෂූන් වහන්සේ</u>

චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො
ඝාණෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො

කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු සාධු සබ්බත්‍ථ සංවරො
සබ්බත්‍ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති

ඇස සංවර කරගැනීම යහපත්, කණ සංවර කරගැනීම යහපත්,
නාසය සංවර කරගැනීම යහපත්, දිව සංවර කරගැනීම යහපත්,

කය සංවර කරගැනීම යහපත්, වචනය සංවර කරගැනීම යහපත්,
සිත සංවර කරගැනීම යහපත්, සියලු ඉන්ද්‍රියයන් සංවර කරගැනීම යහපත්,
සියලු ඉන්ද්‍රියයන් හික්මවාගත් භික්ෂුව සියලු දුකෙන්ම නිදහස් වේ.

2.<u>ගල්කැටක් දමාගසා හංසයකු මැරූ මහණ</u>

හත්‍ථසඤ්ඤතො පාදසඤ්ඤතො
වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො
අජ්ඣත්තරතො සමාහිතො
එකො සන්තුසිතො තමාහු භික්ඛුං

අතින්, පයින්, වචනයෙන් සිදුවිය හැකි පව්ටු ක්‍රියා ගැන නුවණින් සලකා බලා
මනා ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කරමින්, අවබෝධයට පත්වී තමන්ගේ ඇතුලාන්තය
සංසිඳවාගෙන හුදකලාව සතුටින් වාසය කරන්නාට භික්ෂුව, යයි කියන්නේය.

3.<u>කෝකාලික</u>

යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණී අනුද්ධතො
අත්‍ථං ධම්මං ච දීපෙති මධුරං තස්ස භාසිතං

අවශ්‍ය දේ පමණක් කතා කරන, කට සංවර කරගත් භික්ෂුව විසින් සන්සුන්ව ධර්මපද
කියන විට ඔහු විසින් ඒ කියන ධර්ම පද වල අර්ථයද මනාව ප්‍රකට කෙරේ.

4.ධර්මාරාම ස්ථවිරයන් වහන්සේ

ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති

ඒ ධර්ම කරුණු නුවණින් විමසා බලමින්, ධර්මය නිතර සිහිකරමින් වාසය කරන භික්ෂුව තුල යහපත් වූ ගුණධර්ම පිරිහෙන්නේ නැහැ.

5.විපක්ෂසේවක භික්ෂූ නමක්

සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති

අප්පලාභො'පි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවිං අතන්දිතං

අන් අයට ලැබෙන දේ ගැන ආශාවෙන්, තමන්ට ලැබෙන දේ පහත් කොට නොසැලකිය යුතුයි.
අන් අයගේ දේ ගැන ආශා කරන භික්ෂුවට තමන්ගේ සිත එකඟ කරගැනීමට හැකි වන්නේ නැහැ.

ඉදින් සුළුවෙන් හෝ තමන්ට ලැබුණු යමක් පහත් කොට නොසලකන, මැලි බැවින් තොරව පිරිසිදු ජීවිකාවක් ගෙවන භික්ෂුව ඒකාන්තයෙන්ම දෙවියන්ගේ ප්‍රශංසාවට ලක්වෙනවා.

6.පඤ්චග්ගදායක බ්‍රාහ්මණ

සබ්බසො නාමරූපස්මිං යස්ස නත්‍ථි මමායිතං
අසතා ච න සොචති ස වෙ භික්ඛූ'ති වුච්චති

'මම' යයි යන හැඟීමෙන් තමන්ගේ රූපයට හෝ සිතට හෝ ඇලීමෙන් මුළු මනින්ම මිදුණු නිසා ශෝක නොකරන ඔහු ඒකාන්තයෙන්ම භික්ෂුව, යයි කියනු ලැබේ.

7.බුදුරජුන්ගේ සාධුකාරය

මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං

සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති
ඡෙත්වා රාගං ච දොසං ච තතො නිබ්බාණමෙහිසි

පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්ච වුත්තරි භාවයෙ
පඤ්චසඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණො'ති වුච්චති

ඣාය භික්ඛු මා ච පමාදො
මා තෙ කාමගුණෙ රමෙස්සු චිත්තං
මා ලොහගුළං ගිලී පමත්තො
මා කන්දි දුක්ඛමිදන්ති ඩය්හමානො

නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො
යම්හි ඣානං ච පඤ්ඤා ච ස වෙ නිබ්බාණසන්තිකෙ

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො
අමානුසී රති හොති සම්මා ධම්මං විපස්සතො

යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං
ලභතී පීතිපාමොජ්ජං අමතං තං විජානතං

තත්‍රායමාදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨී පාතිමොක්ඛෙ ච සංවරො

මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ
පටිසන්ථාරවුත්ත්‍යස්ස ආචාරකුසලො සියා
තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සසි

බුද්ධ ශාසනය ගැන පැහැදීමෙන් පැවිදි බවට පත්වී මෛත්‍රියෙන් යුක්තව වාසය කරන භික්ෂුව 'මම'ය යන හැඟීමෙන් ඇතිකරගන්නා අවිද්‍යා සහගත සිතිවිලි සංසිඳවමින් ශාන්තවූ නිවණ අවබෝධ කරගන්නේය.

ඉවත්කරන්න භික්ෂුව, මේ තමන්ගේ කියා සේවනය කරන නිශ්චිත නොවන නිස්සාර දේ. ඔබ තුල ඇති රාග ද්වේශ සිඳ දමන තැන් පටන් නිවණට එළඹීම වන්නේය.

රූප-වේදනා- සංඥා-සංකාර-විඥාන යන පංච ස්කන්ධයන්ට ඇති උපාදාන සිඳ දමන්න, කාමච්ඡන්ද-ව්‍යාපාද-ථීනමිද්ධ-උද්දච්ඡ කුක්කුච්ච-විචිකිච්ඡා යන පංච නීවරණ දුරු කරන්න,

ශ්‍රද්ධා-වීර්යය-සති-සමාධි-ප්‍රඥා යන පංච ඉන්ද්‍රියයන් වඩවන්න.
රූප-ශබ්ද-ගන්ධ-රස-පොට්ඨබ්බ යන බාහිර රූපයන්ට ඇති ඇලීම් දුරු කරන භික්ෂුව කාමාදී සැඩ පහර තරණය කර සංසාර සාගරයෙන් එතෙර වන්නේ යයි කියනු ලැබේ.

භික්ෂුව භාවනා වඩන්න. එපා, සිහිනුවණින් තොරව කටයුතු කරන්න.
එපා, ඉන්ද්‍රියන්ට අරමුණු වන රූප කෙරෙහි සිත අලවගන්න.
එපා, සිහිනුවණින් කටයුතු නොකරමින් සිට නිරයට වැටී ලෝහ ගුලි ගිලින්න.
එපා, හඬමින් දුකෙන් පෙළෙමින් දැවෙමින් සිටීමට ඉඩ සලසාගන්න.

භාවනා නොවඩන්නේ නම් ප්‍රඥාව වැඩෙන්නේ නැත.
ප්‍රඥාව නොවැඩෙන්නේ නම් භාවනාව වැඩෙන්නේ නැත.
යමෙක් භාවනාද ප්‍රඥාවද වඩවාගන්නේ නම් ඔහු ඒකාන්තයෙන්ම නිවණට සමීප වේ.

ජනශූන්‍ය ස්ථානයකට ගිය සන්සුන් වූ සිත් ඇති භික්ෂුව ස්වභාව ධර්මයේ ඇලෙමින් මනාසේ ධර්ම කරුණු නුවණින් විමසමින් මෙනෙහි කරනවා.

යම් කලෙක යම් හෙයකින් ස්කන්ධයන්ගේ හට ගැනීම වැය වීම ගැන සිහිය එළඹවා ගෙන නුවණින් විමසමින් ඒවායේ යථා ස්වභාවය නුවණින් අවබෝධ කරගත් විට ලැබෙන ප්‍රීතිය හා මහත් සතුට නිසා ඒ කෙනාට නුවණින් දැනගත හැකි වෙනවා නිවණ යනු කුමක්දැයි කියා.

එලෙස නිවණ දකින භික්ෂුව තුල ප්‍රඥාව වැඩෙනවා. ඉන්ද්‍රියයන් සංවර කරගනිමින් සතුටින් වෙසෙන ඒ භික්ෂුව, භික්ෂු ශීලයද මනාව ආරක්ෂා කරගන්නවා.

පිරිසිදු ජීවිකාවක් ඇති, මැලි බවක් නැති, යහපත් මිත්‍රයන් සේවනය කරන්න.
මිත්‍රභාවයෙන් පිළිගෙන සංග්‍රහ කරන පැවතුම් ඇතිව ශිෂ්ට හැසිරීමෙහි දක්ෂ වන්න.
එතැන් පටන් බොහෝ සතුටින් සිටිමින් නිවැරදිව කටයුතු කිරීමෙන්
දුක අවසන් කිරීම සිදුවන්නේය.

8.<u>පිපී පරවීගිය මල් දැකීමෙන් නැගූ වීර්‍යය</u>

වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති
එවං රාගං ච දොසං ච විප්පමුඤ්චෙථ භික්ඛවො

ඉද්දමල් වැනි මල් වලින් මෘදු වූ සුවඳක් මිදී නිදහස් වේ.
මනා ප්‍රඥාවෙන් කටයුතු කරන භික්ෂුව,
එලෙස රාගයෙන්ද ද්වේෂයෙන්ද මිදී නිදහස් වේ.

9.<u>සන්තකාය ස්ථවිරයන් වහන්සේ</u>

සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො
වන්තලොකාමිසො භික්ඛු උපසන්තො’ති වුච්චති

සංසිඳුණු කයද, සංසිඳුණු වචනයද, එකඟ කරගත් සංසිඳුණු සිතද ඇති ලෞකික ලෝකයට ඇති බැඳීම් දුරු කළ භික්ෂුව සංසිඳුණු තැනැත්තා යයි කියනු ලැබේ.

10.නඞ්ගලකුල ස්ථවිරයන් වහන්සේ

අත්තනා චොදයත්තානං පටිමාසෙ'ත්තමත්තනා
සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි

අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති
තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රං'ව වාණිජො

තමන්ගෙන් පිළිඹිඹූ වන අඩුපාඩු ගැන තමන්ට චෝදනා කරගනිමින්, ඒවා නිවැරදි කරගෙන, තමන්ගේ ඉන්ද්‍රියයන් රක්නා ලද භික්ෂුවට සිහි නුවණින් යුතුව සැපසේ විසීමට හැකිවන්නේය.

තමන් හට පිහිට විය හැක්කේ තමන්ටයි, තමාව පවතින්නේ තමන්ගේ සිතේ ස්වභාවය අනුවයි, එබැවින් වෙළෙන්දෙක් තම අශ්වයා කීකරුව හසුරුවා ගන්නා සේ, සිහි එළඹවාගෙන මනා ප්‍රඥාවෙන් යුතුව, තමන්ගේ ඉන්ද්‍රියයන් හික්මවමින් සංවරව වාසය කල යුතුයි.

11.වක්කලි ස්ථවිරයන් වහන්සේ

පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්ත සඞ්ඛාරූපසමං සුඛං

බුද්ධ ශාසනයේ පැහැදී පැවිදි වී ඉතා සතුටින් වාසය කරන භික්ෂුව 'මම'ය යන හැඟීමෙන් ඇතිකරගන්නා අවිද්‍යා සහගත සිතිවිලි සංසිඳවමින් ශාන්ත වූ නිවණ අවබෝධ කරගන්නේය.

12.සුමන සාමණේරයන්ගේ ආනුභාවය

යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තො'ව චන්දිමා

වයසින් බාලවූ යම් සාමනේර භික්ෂුවක් බුදුන්ගේ අනුශාසනා ඒකාන්තයෙන්ම පිළිපදීද, වලාකුලින් මිදී බැබලෙන චන්ද්‍රයා සේ ඒ සාමනේර භික්ෂුව මේ ලෝකයේ බැබලෙන්නේය.

22.ප්‍රකීර්ණක වර්ගය

1.ගඞ්ගාරෝහණ කථාව

මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං
චජෙ මත්තාසුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං

පංචකාමයෙන් ලැබෙන තාවකාලික සැපය අතහැරීමෙන් ලැබෙන මහත්වූ සැපය දෙස නුවණින් දකින්න. ප්‍රඥාවන්තයා ඒ තාවකාලික සැපය අතහරිමින් මහත් වූ සැපයක් ලැබෙන නිවණ නුවණින් සලකා බලයි.

2.කුකුළුබිත්තර කෑ දැරිය

පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති
වෙරසංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති

අනුන් විසින් සිදුකරන ලද දුක් උපදවීමක් නිසා ඊට පලිගැනීමක් ලෙස කරන දෙයින් තමාට සැපයක් අත්වේවි යයි සිතෙන අදහස මිත්‍යාවක්. වෛරයට වෛරයෙන්ම පිළිතුරු දෙන කෙනාට ඒ වෛරයෙන් නිදහස් වීමට ලැබෙන්නේ නැහැ.

3.නො කටයුත්තෙහි යෙදුනු භික්ෂූන් වහන්සේලා

යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති
උන්නලානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා

යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතා සති
අකිච්චං තෙ න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා

කවර හෝ තැවීමක් ඇතිකරන නුසුදුසු ක්‍රියා නම්, ඒවා නුවණින් අවබෝධකරගෙන එදින සිටම ඒ ක්‍රියා ඉවත දැමිය යුතුයි. මානයෙන් ඇවිළී, පිරිහෙන ක්‍රියාවල යෙදෙන කෙනා තුල කෙලෙස් වැඩෙනවා.

බලවත් සේ ආරම්භ කර නිතර කායානුපස්සනාව වඩන කෙනා කුසල් රැස් කරනවා. තමන්ට සිදුවෙන යහපත ගැන අවබෝධයෙන් යහපත් කටයුතු වල යෙදෙන ඔහු නුසුදුසු ක්‍රියා වල යෙදෙන්නේ නැහැ.
එළඹ සිටි සිහියෙන් යුතුව මනා ප්‍රඥාවෙන් ක්‍රියා කරන්නා තුල කෙලෙස් ප්‍රහාණය වෙනවා.

4.<u>ලකුණ්ටකභද්දිය ස්ථවිරයන් වහන්සේ</u>

මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො

මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ
වෙයග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො

තෘෂ්ණාව නමැති මවද, මමය යන මානය නමැති පියාද, ශාස්වත සහ උච්චේද යන දෘෂ්ඨී දෙක නමැති රජුගේ ප්‍රධාන සෙබළුන් දෙදෙනාද,
මගේ යයි උපාදානය කරගත් ඇස-කණ-නාසය-දිව-ශරීරය-මනස නමැති රට සහ එහි පිරිවරද, නැසූ කෙනා බ්‍රාහ්මණයෙක් වෙනවා.

තෘෂ්ණාව නමැති මවද, මමය යන මානය නමැති පියාද, ඇත සහ නැත යන අන්ත දෙක නමැති රජුගේ ප්‍රධාන පුරෝහිතයන් දෙදෙනාද,
පංච උපාදානස්කන්ධ නමැති ව්‍යාඝ්‍රයන් පස් දෙනා ද, නැසූ කෙනා බ්‍රාහ්මණයෙක් වෙනවා.

5.<u>යකුන්ගෙන් රැකුනු දරුවා</u>

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතා සති

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතා සති

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතා සති

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතා සති

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො

සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ නිතරම බුදුන්ගේ ගුණ සිහිකරයි.

ධර්ම දානයකි

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ නිතරම ධර්මයේ ගුණ සිහිකරයි.

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ නිතරම සංඝයාගේ ගුණ සිහිකරයි.

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ නිතරම කායානුපස්සනාව වඩයි.

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ අවිහිංසාවාදී සිතිවිලි මෙනෙහි කරයි.

තමන්ගේ නුවණින් මෙනෙහි කරමින් ධර්මය අවබෝධකරගෙන ධර්මයේ පැහැදුණු ගෞතම බුදුන්ගේ ශ්‍රාවකයා දිවා රෑ දෙකේ අනිත්‍යාදිය මෙනෙහි කිරීමේ යෙදෙයි.

6.වැදෑරට වැසි භික්ෂු නමක්

දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා
දුක්ඛො’සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ
තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා

සිත් ඇලවීමට අපහසු දුෂ්කර පැවිදි ජීවිත ගතකරන්නේ ගෘහ ජීවිතය දුක් සහිත නිසා.
අදහස් වලින් අසමාන අය සමග ජීවිතය දුක් සහිතයි.
සසර මග ගමන් කිරීමත් දුක් සහිතයි.
ඒ පැවිදි දුෂ්කර ජීවිතය ගත කරන කෙනා, සසර මග ඇවිද යන මගියෙක් වෙන්නෙත් නැහැ, ඔහුට දුකින් පෙලෙන්න වෙන්නෙත් නැහැ.

7.චිත්ත ගහපතියා

සද්ධො සීලෙන සම්පන්නො යසොභොගසමප්පිතො
යං යං පදෙසං භජති තත්‍ථ තත්‍ථෙව පූජිතො

ශ්‍රද්ධාවෙන් ශීලයෙන් සම්පන්න කෙනාට කීර්තිය, සම්පත් පමුණුවනවා.
කොයි යම් පෙදෙසක් සේවනය කලත් ඒ ඒ හැම තැනමදීම පිදුම් ලබනවා.

8.චූලසුභද්‍රා

දූරෙ සන්තො පකාසන්ති හිමවන්තො’ව පබ්බතො
අසන්තෙත්‍ථ න දිස්සන්ති රත්තිං ඛිත්තා යථා සරා

සත්පුරුෂ සංසිඳුණු තැනැත්තා දුරක හිටියත් ප්‍රකට වෙන්නේ, හිමගිරි පර්වතය ඈත දුරටත් පෙනෙන්නා සේය.
යම්සේ රාත්‍රී කාලයේ විදින ලද හීයක් මෙන්, සංසිඳීම නැති අකුසල් සහිත කෙනාව ප්‍රකට වෙන්නේ නැහැ.

9.<u>එකවිහාරික ස්ථවිරයන් වහන්සේ</u>

එකාසනං එකසෙය්‍යං එකො චරමතන්දිතො
එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියා

එක ආසනයක, එක සේනාසනයක, නිවන් පිණිස තනිව හැසිරෙමින් තමන්ව හික්මවා ගත් කෙනා වනයේ සතුටින් වාසය කරන්නේය.

23.නිරය වර්ගය

1.සුන්දරී පරිව්‍රාජිකාවගේ මරණය

අභූතවාදී නිරයං උපෙති යො වාපි කත්වා න කරොමීති චාහ
උභො'පි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ

බොරු කියන්නා සේම, යම් වැරදි ක්‍රියාවක් කර 'මම එය කළේ නැහැ' කියන කෙනාද, නිරයේ උපදිනවා.
අන්‍ය මනුෂ්‍යයන්ට සිදුකරන පහත් ක්‍රියා නිසා ඒ ඔවුන් දෙදෙනාටම පරලොවදී සමාන විපාක විඳීමට සිදුවෙනවා.

2.කාසාවකණ්ඨයෝ

කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ

ශීලයෙන් තොර කසාවතක් කරේ දමාගත් කෙනා, සංවර කර නොගත් ඉන්ද්‍රියයන් නිසා බොහෝ අකුසල් සිදු කරගනී.
ඒ ඔහු විසින් සිදුකරන පාපී ක්‍රියා වල විපාක ලෙස නිරයේ පහල වේ.

3.ගිනියම් කළ යකඩ ගුළි ගිලීම

සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො

සංවර කර නොගත් ඉන්ද්‍රියයන් ඇති පැවිද්දන්, රටවැසියාගෙන් ලැබෙන ආහාර, ගිනිදැල් මෙන් රත්වූ යකඩ ගුලි වලට උපමා කරමින් පරිභෝජනය කළ යුතු බව අවබෝධ කරගත යුතුය.

4.පරඹුවන් කරා ගිය බේම

චත්තාරි ඨානානි නරො පමත්තො
ආපජ්ජති පරදාරූපසෙවී
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං
නින්දං තතියං නිරයං චතුත්ථං

අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා
භීතස්ස භීතාය රතී ච ථොකිකා
රාජා ච දණ්ඩං ගරුකං පණෙති
තස්මා නරො පරදාරං න සෙවෙ

පරදාර සේවනය නිසා මනුෂ්‍යයාට සසරේ ප්‍රමාද වීමට කාරණා හතරක් පමුණුවනවා.
අකුසල් රැස් වීමත්, කාමයේ සෑහීමකට පත් නොවීමත්,
තුන්වනුව නින්දා අපහස විඳීමට සිදුවීමත්, සිව්වනුවට නිරයේ පහල වීමත් යන කාරණායි.

අකුසල් විපාකද, කාමයට ඇබ්බැහි වූ ගතියද, පව්වූ සිතිවිලිද,
නිසා සුළු ආශ්වාදයක් වෙනුවෙන් බියෙන් ගැහෙමින් සිදුකරන පරදාර සේවනය,
රජුගේ බරපතළ වූ දඬුවම් ලැබීමට පමුණුවනවා.

5.<u>ඇවැත් මැඩ විසූ මහණෙක්</u>

කුසො යථා දුග්ගහිතො හත්‍ථමෙවානුකන්තති
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති

යං කිඤ්චි සිථිලං කම්මං සංකිලිට්ඨං ච යං වතං
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං

කයිරා චෙ කයිරාථෙනං දළ්හමෙනං පරක්කමෙ
සථිලො හි පරිබ්බාජො භියො ආකිරතෙ රජං

වැරදියට අල්ලන ලද තණ කොලයට අත කැපී යන්නේ යම්සේද,
වැරදියට ස්පර්ශ කරන ලද ශ්‍රමණ භාවය නිසා නිරයට පමුණුවන්නේය.

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයේ නොහික්මෙමින්, පිරිසිදු බ්‍රහ්මචරියාවේ නොහැසිරෙමින්,
සිදුකරන සුළු යහපත් ක්‍රියා වලින් මහත් කුසල් විපාක අත්වෙන්නේ නැහැ.

කවර හෝ පැවැත්මක් නිසා ඇතිවිය හැකි කවර හෝ කම්පාවක් බලවත් වීර්යයක්
ඇතිකරගනිමින් පවිත්‍ර කරගත යුතුයි.
සුළු හෝ වැරදි කරන පැවිද්දාහට අධික සේ කෙලෙස් වැගිරෙයි.

6.<u>දැස්සට කළ අපරාධය</u>

අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං
කතං ච සුකතං සෙය්‍යො යං කත්‍වා නානුතප්පති

නො කළ යුතු පාප ක්‍රියා කළ කෙනා පසුව දුකෙන් තැවෙනවා
මනාසේ සිදුකරන යහපත් ක්‍රියා සිදුකරන කෙනාට තැවෙන්න සිදුවෙන්නේ නැහැ.

7.<u>ආගන්තුක භික්ෂූහු</u>

නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං
එවං ගොපෙථ අත්තානං ඛණො වො මා උපච්චගා
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා

නගරයක් ඇතුලතත්, ඒ නගරය අවටත් රකින්නේ යම්සේද, එක මොහොතක් හෝ අත නොහරිමින් තමන්ගේ සිතත් කයත් හික්මවා ගත යුතුයි.
එක සුළු හෝ අවස්ථාවක් අතහැරුනහොත් නිරයට පමුණුවාලීමට එය හේතුවිය හැකියි.

8.<u>පසුපස නො වැසූ නිගණ්ඨයෝ</u>

අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං
අභයෙ භයදස්සිනො භයෙ චාභයදස්සිනො
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං

ලජ්ජා නොවිය යුතු දේට ලජ්ජා වන, ලජ්ජා විය යුතු දේට ලජ්ජා නොවන
මිත්‍යා දෘෂ්ඨියේ ගැලී සිටින සත්වයා දුගතියට පමුණුවනවා.
බිය නොවිය යුතු දේට භිය වන, භිය විය යුතු දේට භිය නොවන
මිත්‍යා දෘෂ්ඨියේ ගැලී සිටින සත්වයා දුගතියට පමුණුවනවා.

9.<u>දෙව්රම්වෙහෙරට ගිය ළමයි</u>

අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං

වජ්ජං ච වජ්ජතො ඤත්වා අවජ්ජං ච අවජ්ජතො
සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතිං

නිවැරදි දේ වැරදි ලෙසත්, වැරදි දේ නිවැරදි ලෙසත් දකින මිත්‍යා දෘෂ්ඨියේ ගැලී සිටින සත්වයා දුගතියට පමුණුවනවා.

වැරදි දේ වැරදි බවටත්, නිවැරදි දේ නිවැරදි බවටත් නුවණින් අවබෝධ කරගන්නා නිවැරදි දැකීම ඇති සත්වයා සුගතියට පමුණුවනවා.

24.නාග වර්ගය

1.මාගන්දිය අල්ලස් දී කළ ගැහැට

අහං නාගො’ව සඞ්ගාමෙ චාපතො පතිතං සරං
අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො

දන්තං නයන්ති සමිතිං දන්තං රාජා’භිරූහති
දන්තො සෙට්ඨො මනුස්සෙසු යො’තිවාක්‍යං තිතික්ඛති

වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා
කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං

යුද්ධයකදී දුනු වලින් විදින ඊතල ඉවසන ඇතෙකු සේ, මම බොහෝ දුශ්ශීල ජනයාගේ නින්දා සහගත වචන ඉවසන්නේය.

රජ තුමා සභාවේ නැගී සිටින විට, රැස්වී සිටින මිනිසුන් හික්මෙමින් ඉවසා සිටින්නේය. හික්මුණු ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් එලෙස යම් කෙනෙක්ගෙන් එන නින්දා සහගත වචන ඉවසන්නේය.

කොටළුවාට දාව අශ්වධෙනුවගෙන් හෝ අසුට දාව කොටළුදෙනගෙන් හෝ උපන් උතුම් අහසින් ගමන් කළහැකි දමනය වූ අශ්වයාද, සින්ධු දේශයේ උපන් අජානීය අශ්වයාද, ඇතා ද, තමන්ව හික්මවා ගත් මහොත්තමයාද උතුම් වේ.

2.ඇතුන් හේ කිරීම දත් මහණෙක්

න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං
යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති

නිවණට යාමට හැකි වාහනයක් ඇත්තේ නැහැ.
යම් කෙනෙක් තමන්ව මනාසේ හික්මවා ගනිමින් තමන්ගේ ඉන්ද්‍රියයන් සංවර කරගැනීමෙන් තමයි නිවණට යාමට හැකි වන්නේ.

3.පුතුන් බසට රැවටුනු මහලු බමුණා

ධනපාලකො නාම කුඤ්ජරො කටුකප්පභෙදනො දුන්නිවාරයො
බද්ධො කබලං න භුඤ්ජති සුමරති නාගවනස්ස කුඤ්ජරො

තමාගේ වරදින් සිදු වූ වේදනාකාරී වෙන්වීම වැලැක්වීම සඳහා ධනපාල ඇතා තමන් ජීවත් වූ වනාන්තරය සිහිපත් කරමින් ආහාර නොගැනීමට තීරණය කළේය.

(බුදුන් වහන්සේ ශක්තිමත් දළ ඇතෙකු ලෙසින් උපන් අතීත භවයක තම අන්ධ මවට උපස්ථාන කරමින් මහා වනයක් මැද වාසය කළේය. එකල දිනක් මං මුලාවූ වැද්දෙක් දැක ඔහුට පිහිට වීම පිණිස වැද්දා පිට උඩ නංවා ගෙන ගම් සීමාව තෙක් රැගෙන ගොස් මග පෙන්වා, නැවත මහා කැලයට පැමිණ ඇත.
ඊට දින කිහිපයකට පසු රටේ රජුට ඇතෙකු අවශ්‍ය වූ විට ඉහත කී වැද්දා රජුට ඒ ඇතා ගැන දන්වා ඇත. මේ බව දැනගත් වහාම රජු ඒ ඇතා අල්වා ගෙන ඒමට රාජ පුරුෂයන් යොදවා ඇත.
ඇතු අල්වාගෙන අවුත් ඇත් ගාලට දැමූ පසු, හස්තියා තම මව සහ තමා විසින්ම කළ වරද සිහිකරමින් හඬා වැටෙන්නට විය. ඔහුගේ වරද නම් ඔහු හුදෙක් හැඟීම්වලට වහල් වී පරෙස්සම් නොවී ප්‍රඥාවන්ත නොවී දඩයක්කාරයාට උපකාර කර තිබීමයි.
එබැවින් ඔහු ආහාර ගැනීමෙන් මෙන්ම අන් අයට හිරිහැර කිරීමෙන්ද වැළකී සිටියේය. මේ නිසා රජුට අවසානයේ ඇතා නිදහස් කිරීමට සිදු විය.)

4.<u>කොසොල් රජුගේ බත් බුදීම</u>

මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා සම්පරිවත්තසායී.
මහාවරාහො'ව නිවාපපුට්ඨො පුනප්පුනං ගබ්භමුපෙති මන්දො

සිතේ අලස බව ඇති කෙනා බොහෝ සේ ආහාර ගනිමින් පෙරළෙමින් නිදා ගනී.
මහත් වූ ඌරකු සේ ආහාර ගන්න ඒ අඥානයා, නැවත නැවතත් ගැබකට පැමිණෙන්නේය.

5.<u>යකින්නක කළ ගැහටෙක්</u>

ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්ථකාමං යථාසුඛං
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො
හත්ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො

පෙර මේ සිත නිශ්චයක් නැති කැමති දේ සොයමින් සිතට සැපසේ නොයෙක් දේ පසු පස ගමනේ හැසිරුණා.
අද ඒ නිෂ්පල ක්‍රියාව මම නුවණින් අවබෝධකරගෙන ඒ ගැන නිග්‍රහ කරගනිමින් ඇත්ගොව්වෙක් ඇතා මෙල්ල කරගන්නවා සේ, මමද මේ සිත එකඟ කරගත්තෙමි.

6.<u>බද්ධේරක ඇතා</u>

අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නො'ව කුඤ්ජරො

සිහියෙන් යුතුව වෙසෙමින් යහපත් ලෙස සිත රැක ගන්න. මඩෙහි එරුණු ඇතා වීර්යය යොදා ගොඩ එන්නාක් මෙන් තමන් තුල ඇති කෙලෙස්, වීර්යයෙන් යුතුව උදුරා දැමිය යුතුයි.

7.<u>පාරිලෙයයක ඇතා</u>

සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං
අභිභූයය සබ්බානි පරිස්සයානි
චරෙයය තෙනත්තමනො සතීමා

නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං
රාජා'ව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙ'ව නාගො

එකස්ස චරිතං සෙය්‍යො
නත්‍ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගො

බුද්ධිමත් උපකාරයක් ලැබිය හැකි ප්‍රඥාවන්තයින් වාසය කරන පරිසරයක හැසිරෙන කෙනා සියලු විපත් වළකාලමින් ප්‍රසන්න කරගත් සිත ඇතුව සිහි නුවණින් වාසය කරන්නේය.

ඉදින් බුද්ධිමත් උපකාරයක් ලැබිය හැකි ප්‍රඥාවන්තයින් වාසය කරන පරිසරයක වාසය කිරීමට නොලැබෙන්නේ නම් වනයේ හැසිරෙන තනි ඇතා සේ, උත්තම වූ තැනැත්තා දිනා ගත් රට පවා හැර දා තනිව හැසිරෙයි.

අඥානයන් හා ආශ්‍රයෙන් තොරවී තනිව හැසිරීම ශ්‍රේෂ්ඨයි.
තනිව හැසිරීම නිසා කවර කම්පා වීමක් වත් ඇතිකරන පවු කම් තමන් අතින් සිද්ධවෙන්නේ නැහැ.
අඩු උත්සාහයක් ඇතිව තනිව හැසිරෙන ඇතා මෙන්, උත්තම වූ තැනැත්තා අඩු උත්සාහයක් ඇතිව අකුසල් ප්‍රහාණය කරනවා.

8.<u>මවුපියනට කැම්බීම් සැපයූ භික්ෂූන් වහන්සේ</u>

අත්ථම්හි ජාතම්හි සුඛා සහායා
තුට්ඨී සුඛා යා ඉතරීතරෙන
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි
සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං.

සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො පෙත්තෙය්‍යතා සුඛා
සුඛා සාමඤ්ඤතා ලොකෙ අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා.

සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා
සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛං.

සුවපත් වූ උපකාරයකින් අභිවුර්ධිය සැලසේ.
මොනයම් දේ ලැබුනත් ඉන් සෑහීමකට පත් වීම සැපයක් වේ.
පින තමන්ගේ ජීවිතයට ගණනය කල නොහැකි සැපයක් වේ.
සියලු දුක් දුරු කිරීම සැපයක් වේ.

ලෝකයේ මවුවරුන්ට ගෞරව කිරීම සැපයක්,
තවද පිය වරුන්ට ගෞරව කිරීම සැපයක්.
ලෝකයේ ශ්‍රමණයන්ට ගෞරව කිරීම සැපයක්,
තවද උසස් ජීවිතය සැපයක්.

යම් තාක් වයසට යනතෙක්ම සිල් රැකීම සැපයක්,
ශ්‍රද්ධාවේ පිහිටීම සැපයක්,
ප්‍රඥාව වඩවා ගැනීම සැපයක්,
පාපක්‍රියා නොකිරීම සැපයක්.

25.තෘෂ්ණා වර්ගය

1.කපිල මත්ස්‍යයා

මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය
සො ප්ලවති හුරාහුරං ඵලමිච්ඡං’ව වනස්මිං වානරො

යං එසා සහතී ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවට්ඨං’ව බීරණං

යො වෙ තං සහතෙ ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං
සොකා තම්හා පපතන්ති උදබින්දූ’ව පොක්ඛරා

තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා
තණ්හාය මූලං ඛණථ උසීරත්ථො’ව බීරණං
මා වො නලං’ව සොතො’ව මාරො භඤ්ජි පුනප්පුනං

අනුවණින් කටයුතු කරන මනුෂ්‍යයා තුල තෘෂ්ණාව වැඩෙන්නේ, ගස් වටේ එතෙන මාළුවා වැල වගේ. (යම් ගසක මේ වැල එතුනේ නම් එයින් ඒ ගස විනාශයට පැමිණේ.) එවැනි මනුෂ්‍යයා සසරේ නොයෙක් ලෝක වල උප්පත්ති වලට යන්නේ, අත්තෙන් අත්තට පනින වඳුරෙක් වගේ.

ඒ පුද්ගලයා ඇතිවී පැවතී නැතිවී යන ස්වභාව ඇති වස්තූන් කෙරේ තණ්හාවෙන් ඇලුම් කරන නිසා ඔහු හට ශෝකය වැඩෙන්නේ වරුසාව කාලයට සැවැන්න පැල පඳුරු දා වැඩෙනවා වගේ.

ඉදින් යම් පුද්ගලයෙක් ඉක්මවීමට අපහසු ඒ විනාසවන ස්වභාව ඇති වස්තූන් කෙරේ තණ්හාවෙන් ඇලීම ඉක්මවීමට සමර්ථ වේ නම්, ඔහු කෙරෙන් ශෝකය පහ වෙන්නේ, නෙලුම් කොලය මත වතුර නොරඳන්නා සේය.

ඒ නිසා යම් තාක් මෙහි රැස් වූ ඔබට මම ඔබගේ යහපත සඳහා කියන්නම්,
තණ්හාව මුලින්ම උදුරා දමන්න. (මෙහි දක්වා ඇති උපමාවට අයත් ශාක ගැන මා හට අවබෝධයක් නැති නිසා ඒ ගැන සඳහන් නොකරමි)
එපා ඔබලාව මාරයාට නැවත නැවත බිඳින්න ඉඩදෙන්න, වතුර පහරට ගසා ගෙන යන බට ගස් වගේ.

2.ඊරියකගේ පෙරළිය

යථාපි මූලෙ අනුපද්දවෙ දල්හෙ
ඡින්නො’පි රුක්ඛො පුනරෙව රුහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං

යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා

සවන්ති සබ්බධි සොතා ලතා උප්පජ්ජ තිට්ඨති
තඤ්ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ

සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො
තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ ජාතිජරූපගා නරා

තසිනාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො’ව බාධිතො
සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය

තසිනාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසො’ව බාධිතො
තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී විරාගමත්තනො

යම්සේ කපන ලද ගසක හානි නොවූ බලවත් මුල් තිබේ නම් ඒ ගස නැවත දළුලා වැඩෙන්නා සේ සත්වයන්ගේ සිත්හි දුරු නොකළ අප්‍රකටව පවත්නා රාග ද්වේෂාදී කෙලෙස් තිබේ නම් ඔහු තුල දුක් පීඩා නැවත නැවත හටගනියි.

ඔහු තුල කාම ආශාව නිසා තිස් හය ආකාරයකට අධික වූ කෙලෙස් වැගිරෙනවා. ඒ ගලා බැස්ම උසුලන මිත්‍යා දෘෂ්යී සිතිවිලි ඇති කෙනා තුල රාගය ඇතිවෙනවා.

ගලා බසින දිය පහරවල් සැම තැන්හිම ගස් වැල් හටගන්න ආකාරය නුවණින් අවබෝධ කර, තමන් තුලද වැගිරෙන කෙලෙස් නිසා දලු ලන තෘෂ්ණා මුල් ප්‍රඥාවෙන් හඳුනාගෙන ඒ තෘෂ්ණා මුල් මුලින්ම සිඳ ලන්න.

විසිරී පැතිරුණු ආශාවන් ඇතිව සතුට සොයන මනුස්සයා ඒ ඔහුගේ සතුට සැප සෙවීම නිසා ඒකාන්තයෙන්ම ජාති ජරා වලට එළඹෙනවා.

තණ්හාව පෙරටු කරගත් සත්වයා දඟලන්නේ, මලපුඩුවට හසුවූ සාවෙක් වගේ. අරමුණු වන රූප හා බැඳෙන සත්වයා නැවත නැවත දුකට එළඹෙමින් කල් ගත කරනවා.

තණ්හාව පෙරටු කරගත් සත්වයා දඟලන්නේ, මලපුඩුවට හසුවූ සාවෙක් වගේ. එබැවින් භික්ෂුව තෘෂ්ණාව දුරු කරමින් රාගයෙන් තොර වීමට කැමති වන්නේය.

3.<u>සිවුරු හළ මහණෙක්</u>

යො නිබ්බනථො වනාධිමුත්තො වනමුත්තො වනමෙව ධාවති
තං පුග්ගලමෙථ පස්සථ මුත්තො බන්ධනමෙව ධාවති

තෘෂ්ණා නැතිව වනයේ අධික ලෙස භාවනාවේ යෙදුනු කෙනා දිනෙක වනයෙන් මිදී පස්කම් සැප පසුපස දුවනවා.
බලන්න ඒ නිදහසේ සිටි පුද්ගලයා බැඳීම් පසුපස දුවන හැටි.

4.<u>සිරගෙයි ලූ හොරු</u>

න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙඛා

එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො කාමසුඛං පහාය

ප්‍රඥාවන්තයෙක් නොවන කෙනා ඇතිකර ගන්නා ඒ බලවත් බැඳීම් වල පැතිරීම බලවත් වේගයෙන් පැතිරෙන සැවැන්න පඳුරු වැනිය.
කාමයෙහි ගිජු වී කාමාශාවෙන් මැඩුණු ඔහු මාණික්‍ය කුණ්ඩලාභරණද, පුත්‍රයන්ද, භාර්යාවන්ද ලැබීමේ බලාපොරොත්තුවෙන් සිටින්නේය.

ප්‍රඥාවන්තයා ඒ මුදා හැරීමට අපහසු බලවත් බැඳීම් ගැන නුවණින් අවබෝධ කර අඩු වීර්යයකින්ම ඒ බැඳීම් ඉවත් කරන්නේය.
එසේ බන්ධනයන් සිඳ දමන ඔහු කාම සැපය ගැන කිසිදු අපේක්ෂාවකින් තොරව ගිහි ජීවිතයෙන් මිදී සැහැල්ලුවෙන් හැසිරෙමින් වාසය කරන්නේය.

5.<u>ඛේමා</u>

යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකො'ව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය

රාගයෙන් පෙළෙන කෙනෙකු තමන් විසින්ම තමාව තණ්හාවෙන් මුලා කරගැනීම සිදුකර ගන්නේ, තමන් විසින්ම වියන දැලේ මකුළුවා පැටලී සිටිනවා සේය. එය අවබෝධ කරගන්නා ප්‍රඥාවන්තයා පස් කම් සැපයේ අපේක්ෂාව දුරු කරමින් තණ්හාව නැති කරගත් නිසා සියලු දුක් දුරු කරගන්නේය.

6.<u>උග්ගසේන සිටුපුත්</u>

මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ
සබ්බත්‍ථ විමුත්තමානසො න පුනං ජාතිජරං උපෙහිසි

අතීතයද, වර්ථමානයද, අනාගතයද යන තුන් කාලයටම 'මමය-මගේය' යනුවෙන් උපාදානය කරගත් දෙයින් මිදී නිවණට පත් වූ කෙනා, සියලු සංයෝජනයන් දුරුකරමින් සිත මුදා නිදහස් කරගෙන මධ්‍යස්ථ කරගත් නිසා නැවත ඉපදීමට-වයසට යාමට පත්වන්නේ නැහැ.

7.<u>කෙල්ලකගේ බසට රැවටුණු මහණෙක්</u>

විතක්කපමථිතස්ස ජන්තුනො තිබ්බරාගස්ස සුභානුපස්සිනො
භිය්‍යො තණ්හා පවඩ්ඪති එස ඛො දළ්හං කරොති බන්‍ධනං

විතක්කූපසමෙ ච යො රතො අසුභං භාවයති සදා සතො
එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙච්ඡති මාරබන්‍ධනං

පස් කම් සැපයට ඇති බලවත් ගිජුකම නිසා, මිනිසා තම ඉන්ද්‍රියයන් වලට අරමුණු වන රූපයන්හි හොඳ නරක කල්පනා කිරීමේ බැස ගන්නවා. එසේ කල්පනා කරමින් ඇතිකරගන්නා බලවත් බැඳීම් නිසා, ඔහු තුල තණ්හාව දැඩි සේ වැඩෙනවා.

තම ඉන්ද්‍රියයන් වලට අරමුණු වන රූපයන් කෙරේ ඇතිවන ඇලීම් තමන් හට ශෝකය උපද්දවන ආකාරය නුවණින් මෙනෙහි කර අවබෝධ කරගත් කෙනා සෑම මොහොතකම සිහියෙන් සිටිමින් ඒ ඇලීම් වල ආදීනව නුවණින් මෙනෙහි කරමින් වාසය කරනවා. ඒ නිසා ඔහු අරමුණු වන රූපයන්හි හොඳ නරක කල්පනා කරන්නේ නැහැ. එලෙස තමාට ඇතිවිය හැකි විපත් අවසන් කරගන්නා කෙනා, මාරයාගේ බන්ධනයද සිඳ දමන්නේය.

8.<u>මරු නැගු මහාහඬ</u>

නිට්ඨං ගතො අසන්තාසී වීතතණ්හො අනඞ්ගණො
අච්ඡින්දි භවසල්ලානි අන්තිමො'යං සමුස්සයො

වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො
අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බාපරානි ච
ස වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසො'ති වුච්චති

දුරු කල තෘෂ්ණාව නිසා කෙලෙස් වලින් තොර වී තැති ගැනීම් රහිත ව ගමන අවසන් කල කෙනා, නැවත කිසිවක් උපාදානය කිරීමට ඇති හේතුන් මුලින්ම උදුරා දැමූ නිසා, ඔහු දැන් අවසාන ශරීරය දරන්නේය.

තණ්හා-දෘෂ්ඨි-මාන දුරු කර 'මමය-මගේය-මගේ ආත්මය' යනුවෙන් කිසිවක් උපාදානය කර නොගත්, බුදුන් වදාළ ධර්මයේ අර්ථය දැන ගැනීමට දක්ෂ වන, අක්ෂර එකතු වී සෑදුනු වචනයන්හි පෙර අපර සන්ධි නිවැරදිව ගලපමින් අර්ථය පෙන්වා දීමට සමත්, ඔහු ඒකාන්තයෙන්ම අවසාන ශරීරය දරන මහා ප්‍රඥා ඇති උත්තම පුරුෂයෙක්, යයි කියනු ලැබේ.

9.<u>උපක ආජීවක</u>

සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

කාම තණ්හා- භව තණ්හා- විභව තණ්හා සියල්ල මැඩ පවත්වන, චතුරාර්ය සත්‍යය දැන අවබෝධ කලෙමි.
තණ්හාව මුළුමනින් දුරු කර නිදහස් වීම ගැන සියලු දේ ප්‍රකාශ කරමි.
ඒ උතුම් නිවණ, තමා විසින් මනාසේ දැන අවබෝධ කර සාක්ශාත් කරගත යුතු ඉතා පැසසිය යුතු සැපයක් බව පවසන්නෙමි.

10.<u>දෙවියන් අතර පැන නැගුනු ප්‍රශ්න සතරෙක්</u>

සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති

සියලු දානයන්ට වඩා ධර්ම දානය ජය ගනී.
සියලු රසයන්ට වඩා ධර්ම රසය ජය ගනී.
සියලු ඇලීම් වලට වඩා ධර්මයට ඇලීම ජය ගනී.
තණ්හාව දුරු කිරීම සියලු දුක් පරදවා ජය ගනී.

11.<u>අපුත්තක සිටු</u>

හනන්ති භොගා දුම්මෙධං නො වෙ පාරගවෙසිනො
භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙ'ව අත්තනා

වස්තුව විසින් ආඥානයාව විනාශ කලත්, ඔහු ඒකාන්තයෙන් සංසාරයේ පරතෙරක් සොයා යන්නේ නැහැ.
වස්තු තණ්හාවෙන් සිටින අඥානයා නසාගන්නේ වෙන කිසිවෙක් නෙවි තමාවමයි.

12.<u>අඞ්කුරගේ දානය</u>

තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං

තිණදොසානි ඛෙත්තානි දොසදොසා අයං පජා
තස්මා හි වීතදොසෙසු දින්නං හොති මහප්ඵලං

තිණදොසානි ඛෙත්තානි මොහදොසා අයං පජා
තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං

තිණදොසානි ඛෙත්තානි ඉච්ඡාදොසා අයං පජා
තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං

කුඹුරක වැවෙන හානිකර තණ කොළ ගලවා ඉවත් කරන්නා සේ, තමන්ගේ අභිවුර්ධියට අහිතකර ආලය ඇතිකරන සිතිවිලි දුරු කල යුතුයි.
එලෙස ඇලීම් බැඳීම් වලින් තොර වූ කෙනාහට පිරිනමන දානයෙන් මහත් සැප විපාක අත්වීම සිදුවේ.

කුඹුරක වැවෙන හානිකර තණ කොළ ගලවා ඉවත් කරන්නා සේ, තමන්ගේ අභිවුර්ධියට අහිතකර ද්වේශය ඇතිකරන සිතිවිලි දුරු කල යුතුයි.
එලෙස ගැටීම් වලින් තොර වූ කෙනාහට පිරිනමන දානයෙන් මහත් සැප විපාක අත්වීම සිදුවේ.

කුඹුරක වැවෙන හානිකර තණ කොළ ගලවා ඉවත් කරන්නා සේ, තමන්ගේ අභිවුර්ධියට අහිතකර අවිද්‍යා සහගත සිතිවිලි දුරු කල යුතුයි.
එලෙස අවිද්‍යාවෙන් තොර වූ කෙනාහට පිරිනමන දානයෙන් මහත් සැප විපාක අත්වීම සිදුවේ.

කුඹුරක වැවෙන හානිකර තණ කොළ ගලවා ඉවත් කරන්නා සේ, තමන්ගේ අභිවුර්ධියට අහිතකර 'මම කැමතියි, මම අකමැතියි' ලෙස ඇතිකරගන්නා සිතිවිලි දුරු කල යුතුයි. එලෙස 'මම' යයි යන හැඟීමෙන් තොර වූ කෙනාහට පිරිනමන දානයෙන් මහත් සැප විපාක අත්වීම සිදුවේ.

26.මාර්ග වර්ගය

1.ආ ගිය තැන් ගැණ කතා කළ භික්ෂූන් වහන්සේලා

මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා

එසො’ව මග්ගො නත්‍ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා
එතං හි තුම්හෙ පටිපජ්ජථ මාරස්සෙතං පමොහනං

එතං හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ
අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසන්‍ථනං

තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්‍ධනා

පිළිවෙත් අතරින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශ්‍රේෂ්ඨ වේ.
සත්‍යයන් අතරින් ආර්ය සත්‍යය සතර ශ්‍රේෂ්ඨ වේ.
ධර්මය පිලිපදින්නන් අතරින් රහත් කෙනා ශ්‍රේෂ්ඨ වේ.
දෙපා සත්වයන් අතරින් බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨ වේ.

ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගය හැර වෙන මගක් නැහැ, කෙලෙස් වලින් මිදී පිරිසිදු වීමට.
ඒ නිසා තෙපි ඒ මාර්ගය අනුගමනය කරමින් මාරයාව මුලා කරන්න.

ඒ මාර්ගය අනුගමනය කරන තොපට දුක කෙලවර කිරීමට හැකිවේවි.
ඒ කෙලෙස් සිඳලන මාර්ගය ගැන මා විසින් මනාව අවබෝධ කරගෙන ප්‍රකාශ කලෙමි.

තථාගතයන් වහන්සේ අනුදැන වදාළ ආකාරයට වීර්යයෙන් කටයුතු කරමින්
ඒ ඒ මොහොතේ නැවත නැවත නුවණින් මෙනෙහි කරමින්
සිහි නුවණින් වාසය කරමින් ඔබලා මාරයාගේ බැඳීමෙන් නිදහස් වන්න.

2.අනිත්‍යානුදර්ශනය වැඩූ පන්සියයක් භික්ෂූන් වහන්සේලා

සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්‍දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා

තමන් විසින් ‘‘මමය-මගේය-මගේ ආත්මය’’ යයි කියමින් උපාදානය කරගන්නා
සියල්ල, තමන්ගේ කැමැත්තට අනුව නොපවතිමින් වෙනස් වන බවත්, ඒ උපාදානය
කරගත් තමන්ගේ කැමැත්තද මුල් කැමැත්තට අනුව නොපවතිමින් වෙනස් වන බවත්,

යම් කලෙක සිහිය පිහිටුවාගෙන නුවණින් විමසන කෙනාට අවබෝධ කරගන්න හැකිවෙනවා.
ඒ වෙනස් වීම් නිසා තමාට දුකෙන් පෙළීමට සිදුවූ බව අවබෝධවූ වහාම, ඔහු ඒ සියලු බැඳීම් කෙරෙහි කළකිරෙනවා.
ඒ ආකාරයෙන් කළකිරීම තමයි ඔහුව නිවන් මාර්ගයට පමුණුවන්නේ.

3.<u>**දුඃඛානුදර්ශනය වැඩූ පන්සියයක් දෙනා වහන්සේ**</u>

සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා

තමන් විසින් ‘‘මමය-මගේය-මගේ ආත්මය’’ යයි, කියමින් උපාදානය කරගන්නා සියල්ල නිසා ඇතිවන ඇලීම්-ගැටීම්ද, කැමැති-අකමැති රූප ඒ ආකාරයටම නොපැවතීමද, මුලින් ඇතිවූ කැමැත්ත-අකමැත්ත ඒ ආකාරයටම නොපැවතීමද, යන මේ සියල්ල තමන්ට උරුම කරන්නේ දුකක් බව, යම් කලෙක සිහිය පිහිටුවාගෙන නුවණින් විමසන කෙනාට අවබෝධ කරගන්න හැකිවෙනවා.

දුකට කැමති නැති තමන්ට ‘‘මමය-මගේය-මගේ ආත්මය’’ යනුවෙන් අයිතිකරගන්නා දේවල් නිසාම දුක ඇතිවෙන්නේ නම්, ඒවා ‘මම හෝ මගේ හෝ මගේ ආත්මය’ වන්නේ කෙසේදැයි, තමන්ගෙන්ම නුවණින් විමසමින්, ඒ උපාදානය කරගත් සියල්ල කෙරෙහි කළකිරෙනවා.
ඒ ආකාරයෙන් කළකිරීම තමයි ඔහුව නිවන් මාර්ගයට පමුණුවන්නේ.

4.<u>**අනාත්මදර්ශනය වැඩූ පන්සියයක් දෙනා වහන්සේ**</u>

සබ්බෙ ධම්මා අනත්තා’ති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා

තමන්ද අන් ලෝකයේ ඇති සියල්ලමද තමාගේ අදහස් හා සිතිවිලිද කැමැත්ත අකමැත්තද යන මේ සියල්ලම හටගත්තා සේම වෙනස් වෙමින් පැවතී නැතිවී යන බව, යම් කලෙක සිහිය පිහිටුවාගෙන නුවණින් විමසන කෙනාට අවබෝධ කරගන්න හැකිවෙනවා.
ඒ ගැන මෙතෙක් කාලයක් නොදැන අවිද්‍යාවෙන් සිටි නිසාම ඇතිකරගත් බැඳීම් නිසා දුක අත්කරගත් බව නුවණින් අවබෝධ කරගෙන, ඒ ‘‘මමය-මගේය-මගේ ආත්මය’’ යයි, ගොඩනගා ගත් තණ්හා-දෘෂ්ඨි-මාන කෙරෙහි කළකිරෙනවා.
ඒ ආකාරයෙන් කළකිරීම තමයි ඔහුව නිවන් මාර්ගයට පමුණුවන්නේ.

5.<u>අලස මහණ</u>

උට්ඨානකාලම්හි අනුට්ඨහානො
යුවා බලී ආලසියං උපෙතො
සංසන්නසඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති

ශක්තිමත් තරුණ වයසේ උත්සාහ කලහැකි කාලයේදී කාමයට ඇති කැමැත්ත නිසා අලස වී වීර්යය නොකරමින් සිටින බොහෝ ඇලීම් ගැලීම් වලින් මුලා වී මන්දෝත්සාහී වී සිටින අලසයාට ඒ ප්‍රඥාවෙන් අනුගමනය කරමින් ලැබිය හැකි සැනසීම විඳීමට ලැබෙන්නේ නැහැ.

6.<u>ප්‍රේතයෙක් ව උපන් මහණෙක්</u>

වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ග ඉසිප්පවෙදිතං

වචනය හික්මවා ගනිමින් සිත මනාව ආරක්ෂා කර ගත් කෙනා කවර කම්පාවීමක් හෝ ඇතිකරන අකුසල් ක්‍රියා කයින් ද සිදුකරන්නේ නැහැ.
ඒ තුන් දොරෙන් සිදුවන ක්‍රියා පිරිසිදු කරගනිමින් කටයුතු කරන කෙනා බුදු වරුන් විසින් අවබෝධ කරගෙන දැන්වූ මාර්ගය සතුටින් අනුගමනය කරන්නෙක් වෙනවා.

7.<u>පොඨිල ස්ථවිරයන් වහන්සේ</u>

යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයො
එතං ද්වෙධා පථං ඤත්වා භවාය විභවාය ච
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති

නුවණින් මෙනෙහි කිරීමෙන් ඒකාන්තයෙන් ප්‍රඥාව හටගන්නවා,
නුවණින් මෙනෙහි නොකිරීමෙන් ප්‍රඥාව විනාශවෙනවා.
ඒ දෙආකාර විධි දැනගැනීමෙන්, පැවැත්මත් - වඩා හොඳින් පැවැත්මත් අවබෝධ කරගැනීමට පුළුවන් වෙනවා.
වඩා හොඳින් පැවැත්ම සඳහා අවශ්‍ය ප්‍රඥාව යම්සේ වැඩේද,
එසේ එබඳු ආකාරයට වාසය කල යුතුයි.

8.<u>මහලු තෙරුන් පන් සියයක්</u>

වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බනා හොථ භික්ඛවො

යාවං හි වනථො න ඡිජ්ජති අණුමත්තො'පි නරස්ස නාරිසු
පටිබද්ධමනො'ව තාව සො වච්ඡො ඛීරපකො'ව මාතරි

වනය සිඳින්න එපා වනයේ ගස් වලට හිය හට ගන්නවා.
නිවණ බලාපොරොත්තු වන භික්ෂූන් සිඳිය යුත්තේ තෘෂ්ණාව නමැති වනයයි.

ඒ තෘෂ්ණාව නොසිඳන තාක් කල් මිනිසුන් ගැහැණුන් වෙත ඇදීම ස්වල්පයකින් හෝ අඩුවෙන්නේ නැහැ.
කිරි බොන වසුපැටියෙක් මව වෙත ඇදෙන්නා සේ, ඒ සිතේ ඇතිවන ආලය ඔහුව ගැහැණිය වෙත අදිනවා.

9.<u>ස්වර්ණකාර ස්ථවිරයන් වහන්සේ</u>

උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං'ව පාණිනා
සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බාණං සුගතෙන දෙසිතං

කැමැත්තෙන් කඩා ගත් සරත් කාලයේ පිපී බැබලෙන කුමුදු මල්, මැලවී යන විට ඒ මල් වල සුන්දරත්වයද, තමන්ගේ කැමැත්තද වෙනස් වන 'අනිච්ච' ධර්මතාවය නුවණින් අවබෝධකරගෙන, රූපයන් කෙරෙහි ඇති ඇලීම්-ගැටීම් දුරු කරන්න.
සුගතයන් වහන්සේ දේශනා කල නිවන් මාර්ගය අනුගමනය කරමින්
නිවණ සාක්ෂාත් කරගන්න.

10.<u>මහාධන වෙළෙන්දා</u>

ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්ත ගිම්හිසු
ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣති

"*මේ වැසි කාලයේ මම වස් වසමි*', "*මේ ශීත කාලයයි*', "*මේ උෂ්ණ කාලයයි*', යනුවෙන් කල් ගත කරන අඥානයා තමන්ට සසරෙහි ඇති විපත් සහිත බව ගැන අවබෝධකරගෙන ඉන් මිදීමට ක්‍රියා කරන්නේ නැහැ.

11.<u>**කිසාගෝතමී**</u>

තං පුත්තපසුසම්මත්ත බ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝො’ව මච්චු ආදාය ගච්ඡති

උපන් දරුවා ‘මගේ’ යයි මුලාවෙන් මිනිසා සිතෙන් ඇලී ජීවිත කාලය පුරාම රැක ගැනීමට දුක් විඳිනවා.
වැසියන් නින්දේ සිටියදීම මහ මුහුදට ගසා ගෙන යන ගමක් සේ, මිනිසා නොසිතන මොහොතක මරණයට පත්වෙනවා.

12.<u>**පටාචාරා**</u>

න සන්ති පුත්තා තාණාය න පිතා නාපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්‍ථි ඤාතිසු තාණතා

එතමත්‍ථවසං ඤත්‍වා පණ්ඩිතො සීලසංවුතො
නිබ්බාණගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ

පුතා ගෙන් හෝ පියා ගෙන් හෝ වෙනත් කිසිදු බැඳීමකින් හෝ තමන්ට පිහිටක් නැහැ. තමන් තුල ඇති ඒ පෙලීම් අවසන් කිරීමට, තමන් හට පිහිට විය හැකි කිසිදු ඥාතියෙක් නැහැ.

ඒ බව හොඳින් අවබෝධ කරගෙන ප්‍රඥාවන්තයා ශීලයේ හික්මිය යුතුයි.
නිවණට යන ප්‍රතිපදාවේ යමින් වහා තමන්ගේ සිත පිරිසිදු කරගන්න.

පිං පැමිණවීම

එත්තාවතා ච අම්හෙහි සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු සබ්බසං පත්තිසිද්ධියා

එත්තාවතා ච අම්හෙහි සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ භූතා අනුමෝදන්තු සබ්බසං පත්තිසිද්ධියා

එත්තාවතා ච අම්හෙහි සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ සත්ථා අනුමෝදන්තු සබ්බසං පත්තිසිද්ධියා

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා හොන්තු සබ්බෙපි පාණිනො.

ඉදං මේ ඤාති ඉදං හොතු සුඛිතා හොන්තු ඤාතයො
ඉදං මේ ඤාති ඉදං හොතු සුඛිතා හොන්තු ඤාතයො
ඉදං මේ ඤාති ඉදං හොතු සුඛිතා හොන්තු ඤාතයො

මේ සියලු සක්වලයන්හි වැඩ වාසය කරන බුදු, පසේ බුදු,
මහරහත්, අෂ්ඨ ආර්ය පුද්ගල මහා සංඝ රත්නය ඇතුලු ආර්යයන්
වහන්සේලා සියලු දෙනාමත්,
දිව්‍ය බ්‍රහ්ම තලවල වැඩ වාසය කරන
සියලුම දෙවියන් සහ බ්‍රහ්මයනුත්,
මේ තාක් සංසාරයේ අපහට දෙමවුපියන්, සහෝදර සහෝදරියන් ස්වාමි
පුරුෂයන්, භාර්යාවන්, දූ දරුවන්, මුනුබුරු මිනිබිරියන්, ඤාති මිත්‍රාදීන්,
සතුරන්, විරුද්ධ වාදීන්, වූ සියලු දෙනාමත්,
අහසේ ජලයේ ගොඩබිම වාසය කරන අපා, දෙපා, සිව්පා,
බහුපා යන සියලු සත්වයනුත්,
යක්ෂ, ප්‍රේත, භූත, පිසාච, කුම්භාණ්ඩ, ගන්ධබ්බ, නාග,
යන අවස්ථාවල සිටින සියලු දෙනාමත්,
නිරයේ සිටින සියලු දෙනාමත්,
ඇතුළු සියලු සත්වයෝ දුක් පීඩා නැත්තෝ වෙත්වා! නිදුක් වෙත්වා!
සුවපත් සිත් ඇත්තෝ වෙත්වා!
දුකෙන් මිදෙත්වා!

යම් කෙනෙක් තමන්ගේ කයේ, තමන්ට ඇතිවන වේදනාවල,
තමන්ගේ සිතේ, තමන් තුල පවතින ස්වභාවයන්ගේ,
යථා ස්වභාවය නුවණින් හඳුනාගෙන
තමන්ගේ කය සහ සිත යනු
'මම නොවේ-මගේ නොවේ- මගේ ආත්මය නොවේ'
යන්න තමන් විසින්ම ප්‍රත්‍යක්ෂව අවබෝධ කරගැනීම සඳහා
බුදුහාමුදුරුවන් පෙන්වා දුන් ආකාරයට
වීර්යය කරන්නේ නම්,
ඒ ඔහුට 'බුදුන් සරණ ගිය උපාසකයෙක්ද,
ඒ ඇයට බුදුන් සරණ ගිය උපාසිකාවක්ද'
යයි කියනු ලැබේ.

"මෙසේ කෙලෙස් තවන වීර්යයෙන් කටයුතු කර,
රාග-ද්වේෂ-මෝහ නමැති කෙලෙස් මාර සේනාව හා සටන් වැද,
තෘෂ්ණාව මුළුමනින්ම දුරුකිරීම නමැති ජයග්‍රහණය
අත් කර ගැනීම නිසා, අතීතයේ ඇතිවූ
සියලු භය වලින් මුළුමනින්ම මිදී සතුටින් වාසය කරන ඒ ප්‍රඥාවන්තයා,
තම ශාස්තෘන් වහන්සේ අනුව යන ශ්‍රාවකයෙකි".
මහා සමය සූත්‍රය.

"අනිච්චා වත සංඛාරා
උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛො!"

'මමය- මගේය- මගේ ස්ථිර වූ ආත්මය' යි ලෙස තමන්ගේ කැමැත්තෙන් සකස්කරගන්නා සිතිවිලි හටගත්තාසේම නැතිවීයන, ස්ථිරව නොපවතින ස්වභාවය එළඹගත් සිහියෙන් යුතුව නුවණින් මෙනෙහි කර බැලීමෙන් අවබෝධ කරගත හැකිය. එසේ අවබෝධකරගත් තැනැත්තා තමන් තුල හටගෙන තිබූ සිතිවිලි හෙවත් සංස්කාර වෙනස් වී නැති වී ගිය ආකාරය නුවණින් දකිමින් ඇලීම් -ගැටීම් වලින් මිදෙනවා සේම, ඒ ලබාගත් අවබෝධය විසින් ඔහුව ඒ ඒ මොහොතේ පඤ්චස්කන්ධයන්ට උපාදානය වීමද වළක්වනවා. මේ හේතුවෙන් වර්ථමාන මොහොතේ ඔහු තුල සකස්කරගන්නා සිතිවිලි හෙවත් සංස්කාර ඇතිවීම වලකින නිසා ඔහු තුල ඇලීම් -ගැටීම් ඇතිවීමට හේතුවක් ඇත්තේ නැහැ.
එලෙස එළඹගත් සිහියෙන් යුතුව
ඉපදීමට හැකිව තිබූ සංස්කාර නිරුද්ධ වෙමින් නුවණින් කටයුතු කරමින්
වාසය කරන කෙනා සංසිඳෙමින් සැපයටම පත්වෙනවා!

අවසන් කිරීම

නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි

ධර්ම දානයකි

ISBN 978-624-93176-2-8